II

ධීවර ජන වහර

සත් සමුදුර

ලාංකික ගැමියාගේ කටවහරේ කාන්දු වන සුලභ වදනකි සත් සමුදුර යන්න. සත් සමුදුර පිළිබඳ ජීවිත පරිඥානයෙන් ලද අවබෝධය ඇත්තේ වෙරළ බඩ ජනතාව තුළ පමණි. ජනශ්‍රැතියේදී සත් සමුදුර කටවහරේ අර්ථයෙන් හඳුනා ගන්නේ මෙසේය.

1. **කහ මුහුද**

බොරදම් පටිය හෙවත් ප්‍රකෘති සමුද්‍රයයි. මෙය මුහුද **වලාල** හෙවත් අධික රළ නොපවතින කාලයට සැතපුම් භාගයක පමණ පටියක් සේ දැනුදු දැක ගත හැකිය.

2. **කොළ මුහුද**

බොරදම් පටිය සීමාවේ සිට සැතපුමක් පමණ දුරට විහිදෙන මුහුදු තිරයයි.

3. **නිල් මුහුද**

මෙම මුහුදු තීරුව කොළ මුහුදට යාබදව මුහුද වශයෙන් සැලකේ. ගැඹුරින්ද වැඩි බැවින් මෙය නිල් පැහැයෙන් ඈතට දිස් වීම නිසා මෙසේ වැඩිහිටි ධීවරයා හඳුන්වනවාට සැක නැත. නිල් මුහුදු සීමාවේ මසුන් ඇතත් බහුලව නොසිටින බව ධීවරයාගේ විශ්වාසයයි.

4. **රතු මුහුද**

නිල් මුහුදට එපිට පිහිටි මුහුදු සීමාව රතු මුහුද වශයෙන් හැඳින්වීමට පැරණි ධීවරයා යුහුසුළු වී ඇත්තේ **කැට ලිහිණි** බහුලව ගැවසෙන මෙම සීමාවේ රතු පැහැයට හුරු මසුන් බහුලවීම නිසා නොවේ. **කබ්බ** දිළිසෙන නිසාය. **රත් බොල් දියාත** යනුවෙන් ධීවර ජන වහරේ යෙදේ.

5. **කළු මුහුද**

බලයා පැහැයෙන් කළුය. එම නිසා ඔවුන් වාසය කරන මෙම මාළු කෙත ඔරුවේ යන ධීවරයාට ඈතට දිස්වන්නේ කළු මුහුද වශයෙන් යැයි සැලකීම වටී. මුහුදේ ප්ලැන්ටන් (Plankton) හෙවත් ප්ලවාංග ඇති වන්නේ මෙම සීමාවේය. බලයන් මෙම සීමාවේ වෙසෙන්නේ ප්ලවාංග නිසාය.

6. **සුදු මුහුද**

කිරි සයුර යනුවෙන් හඳුන්වන්නේ ද මෙම මුහුදය. වරක් විෂ්ණු විසින් අනත්ත නම් නාග රාජයා මහාමේරු පර්වතයේ පටලා එයින් කිරි සයුර කලඹා හද්‍ර ඝටය, කල්ප වෘක්ෂය, අමෘතය හා ශ්‍රියා කාන්තාව යන මහාර්ඝ වාස්තු සතර ලබා ගත් බව ජනප්‍රවාදයෙහි සඳහන් වෙයි.

ක්ෂීර සාගරය කළඹන්නේ අන් කිසිවකු නොව ධීවරයාය. තෝරු, මෝරු, සාවල ආදී ධවල පැහැ ඇති වටිනා මත්ස්‍යයන් වෙසෙන්නේ සුදු මුහුදෙහිය. මෙහි **පන්න** කිරීමට යන්නේ පලපුරුදු දක්ෂ ධීවරයන් පමණක් බව වැඩිහිටි ධිවරයන්ගෙන් දැන ගන්නට ලැබුණි. ධවල පැහැ මසුන් නිසා මෙකී මුහුදු සීමාව ඇතට දිස්වන්නේ සුදු පාටින් බවත් එනිසා එය කිරි මුහුද යනුවෙන් හඳුන්වන ඔවුන් එසේ පවසන්නේ ප්‍රත්‍යක්ෂ කර ගත් දැනුමෙනි.

7. **ගොළු මුහුද**

ආලිය, අයිස් මුහුද, නිහඬ මුහුද යනුවෙන් හැඳින්වෙන්නේද මෙම මුහුදය. ඉතා බියකරු ගැඹුරුම මුහුදු සීමාව වන මෙහි මසුන් වාසය කරන්නේ නැත. එයට හේතුව අයිස් බහුල නිසා මසුන්ට වාසය කළ නොහැකි බැවිනි. දකුණේ ධීවරයා මෙය හඳුන්වන්නේ ගොළු

මුහුදු හෙවත් අයිස් මුහුදු ලෙසිනි. මග සලකුණු වැරදී ගොළු මුහුදු දක්වා කිසියම් ධීවරයෙකු ගියහොත් ඔහු කවරදාවත් ආපසු නොඑන බව වැඩිහිටි ධීවරයින් අතර ප්‍රචලිත විශ්වාසයකි.

ඉතා ගැඹුරු මෙම මුහුදු ගොළු මුහුදු යනුවෙන් හඳුන්වන්නේ මෙම සීමාවට, මෙපිට සිට වායුව හමන නිසා මෙය නිශ්චලව පවතින බැවිනි. මසුන් නොවසන මෙය සුමංගල ශබ්ද කෝෂයේ හඳුන්වා ඇත්තේ වඩබා මුඛය හෙවත් මකර කට[1] නමිනි. එනම් නිරයට හෙවත් අපායට දිය පිවිසෙන තැනයි.

වෙරළ බඩ ජන වහර

අතීතයේදී බඩු ප්‍රවාහනය කිරීමේ මාධ්‍යයක් වශයෙන් ජලයෙහි ගමන් කරන ලද්දේ යාත්‍රා හෝ පහුරු ආධාරයෙනි. ඔරු යන පොදු නාමයකින් හඳුන්වනු ලැබුවද ධීවරයන් අතර ඒ සඳහා විශේෂ ව්‍යවහාර මෙන්ම ඔරු වර්ගද ඇති බව වෙරලාශ්‍රිත ජන වහර අධ්‍යයනය කිරීමෙන් අනාවරණය කර ගත හැක.

රුවල් ඔරුව - (රුවල සහිත දියෙහි පදවන යාත්‍රා විශේෂය)

සුළං දිශාව අනුව රුවල දිග හැරීම හෝ අඩ කුඹු කිරීම සිදුවේ. රුවල් ඔරුවටද කොල්ලෑවක් සහ හබලක් තිබේ. ඈත දියඹේ මසුන් මැරීමේ දී රුවල් ඔරුව භාවිත කරයි.

කොල්ලෑව (හරස් ලී දෙකක ආධාරයෙන් ඔරු කඳට සමාන්තරව සිටින සේ බඳිනු ලැබූ අඩි දහයක පමණ ලීයයි)

ඔරුවේ සමබරතාවය රැක ගැනීම සඳහා **කොල්ලෑව** මහෝපකාරී වේ.

"ඔරුව පෙරලෙන්නේ නැත්තෙ **කොල්ලෑවට** පින්සිද්ධ වෙන්ඩ"

බල ඔරු (බලයන් අල්ලන ඔරු)

සෑම ඔරුවක්ම ඈත දියඹේ මසුන් ඇල්ලීම සඳහා ගමන් නොකරයි. විශේෂයෙන් බලයන් ඇල්ලීම සඳහා රුවල සහ කොල්ලෑව සහිත ප්‍රමාණයෙන් විශාල ඔරු යොදා ගනී. බල ඔරුවල මසුන් මරණ ධීවරයන් අනෙක් ධීවරයන්ට වඩා සාපේක්ෂව උසස් තත්වයක් දරණු ලැබේ.

මහ ඔරු (ප්‍රමාණයෙන් විශාල යාත්‍රා)

ඈත දියඹට පදවන බල ඔරු හා සමාන මහ ඔරු සාවාලයන් මෙන්ම විශාල මසුන් මැරීම සඳහා උපයෝගී කර ගනී. රුවලක් හා කොල්ලෑවක් ද ඇති මේ සඳහාද හබල් හතරක් අනිවාර්‍යයෙන් ම තිබේ. හය දෙනෙකු පමණ එකවර මේ ඔරුවේ ගමන් කරනු ලැබේ.

වරාය ඔරු (අද්දර මුහුදේ පදවන කුඩා යාත්‍රා)

රුවලක් නැතත් කොල්ලෑවක් සහ හබලක් මේ ඔරු සඳහා තිබේ. දෙදෙනෙකු හෝ හතර දෙනෙකු පමණක් ගමන් කරන මෙම ඔරු වෙරළ අද්දර මුහුදේ මසුන් මැරීම සඳහා යොදා ගැනේ.

---

[1] ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය - වඩබා මුඛ

ගොඩඔරු (ඇම් ඇල්ලීමට භාවිතා කරන කුඩා යාත්‍රා විශේෂයකි)

බිලී බෑම සඳහා ඇම් කුරයියන් ඇල්ලීම සඳහා ගොඩඔරු උපයෝගී කර ගනී. නවකයින් හෙවත් කෝඩුකාරයන් මුහුදට හුරුවන ඔරුය.

දෙදෙනෙකු හෝ සිව්දෙනෙකු ගොඩ ඔරුවක ගමන් කරයි. මෙම ඔරුවට ද කොල්ලැවක් තිබේ. හබල් ආධාරයෙන් පදවන මෙකී යාත්‍රාවේ විශේෂය නොගැඹුරු මුහුදේ සිටින ඇම්කුරයි ඇල්ලීමට ද භාවිතා කරයි.

තෙප්පම - වල්ලම (රුවලේ ආධාරයෙන් පදවන කුඩා යාත්‍රා විශේෂයකි)

බොහෝවිට තනි පුද්ගලයෙකු පමණක් පදවන තෙප්පම හෙවත් වල්ලම යොදා ගන්නේ මහ ඔරු වලට දැල් එලීමේ කාර්‍යය පහසු කිරීම සඳහා ආධාරක යාත්‍රා වශයෙනි.

බෝට්ටුව (ඇන්ජිම සවිකර ඇති යාන්ත්‍රික ධීවර යාත්‍රාව)

බහුදින ධීවර යාත්‍රා වශයෙන්ද හඳුන්වන ශීතකරණ සහිත විශාල බෝට්ටු වර්ග නූතනයේ භාවිතා කරයි.

අවල (ඔරුවේ පසුපස හබල)

සාමාන්‍යයෙන් ඔරුවක හබල් 4 ක් හෝ 6 ක් තිබේ. මේ සියල්ලම අවල යන පොදු නාමයෙන් හැඳින්වුවද අවල යන විශේෂ නාමය ඔරුවේ පසුපස හබල් දෙක සඳහා පමණක් ව්‍යවහාර කරයි.

වියල (ඔරුවේ ඉදිරිපස හබල)

වියල යන්න සාමාන්‍ය ව්‍යවහාරයේ අදහස් කරන්නේ රෙදි හෝ කපු ආශ්‍රයෙන් නිමවන දෑ සඳහා ය. එහෙත් ඔරුවේදී එය සුළං මාරියාවට සහ වේගවත් රළ වලට ඔරොත්තු දීම සඳහා පමණක් භාවිතා කිරීමට ඇති ඉදිරිපස හබල් දෙක හැඳින්වීම සඳහා උපයෝගී කර ගනී.

කස් අවල (ඔරු කඳ මැද දෙපස හරහට ඇති හබල් දෙක)

කස් අවල ඔරුවේ සමබරතාවය ආරක්ෂා කර ගැනීමට සහ පැදවීම පහසු වීමට යොදා ඇත.

ඇණිය (ඔරුවේ ඉදිරිපස)

අවර (ඔරුවේ පිටුපස)

ඔරුවේ ඉදිරිපස කොටස ඇණිය වශයෙනුත් එහි පිටුපස කොටස අවර නමිනුත් හඳුන්වනු ලැබේ.

නිදසුන්

"බොට මං ආය කියන් නෑ. මට යකෝ **ඇණියෙන්** ගියත් එකයි **අවරෙන්** ගියත් එකයි"

තරහව කේන්තිය පැමිණි අවස්ථාවල ධීවරයන්ගේ මුවඟට ඇණියත් අවරත් පැමිණීම සාමාන්‍ය දෙයකි.

ඔකඳ තිස් ගව්ව පානම	දුවන්නා
ඇණියෙන් ගත් පකුල අවරින්	බිඳින්නා

පල්ල (ඔරුව පතුලේ හරස් ආකාරයට දමා ඇති ලීය)

නිදසුන් -

"ඔහෙට ඇහැකිය වාරු **පල්ලට** වාරු දීලා කසී අවල අදින්ඩ"

පල්ල යොදා ගන්නේ යොත් ඇදීමේදී සහ හබල පැදවීමේදී දැතට ශක්තිය ලබා ගැනීම පිණිස දෙපා තැබීමට ය.

ගොයිය (රුවල)

මුහුදේදී රුවල හඳුන්වන්නේ **ගොයිය** යන වහරිනි.

නිදසුන් -

"හරහ එළල, අල්ලන හිංදා **ගොයියා** බුරුල් කරහං"

සුළඟේ වේගය අඩු වූ විට **ගොයිය** හෙවත් රුවල හැකි පමණ දිග හැරීම සිදු කරනු ලැබේ.

හැන් (රුවල ඔසවා තැබීම පිණිස ඇති ආධාරකය)

ධීවරයන් **හැන්** යනුවෙන් හඳුන්වන මෙය පොදු ජන වහරේ කුඹ ගස යනුවෙන් හඳුන්වයි. හැන් යන්න ඔරුවේ හරහට බැඳ ඇති ලීය සඳහාද භාවිතා කෙරේ. වාරුව හෙවත් වැර යැදීම පිණිස හැන් ප්‍රබල ආධාරකයක් වෙයි.

මෙය දෙවිනුවර ධීවරයා හඳුන්වන්නේ **පරුමානය** යන නමිනි.

රුවල් මන්ද (ලණුව)

රුවල කුඹ ගසට හා ඔරුවට සම්බන්ද කොට හරහ අදින මන්ද, **රුවල් මන්ද** නමින් හැඳින්වේ. රුවල බෑමේදී හා නැන්වීමේදී **රුවල් මන්ද** ඊට ආධාරක වේ.

වාවරය (ලණුව)

රුවල් මන්දේ එක් කොටසක් කොල්ලෑවට ඇද බැඳ ඔරුවේ සමබරතාවය රැක ගනී. රුවල් මන්ද යනුවෙන් හඳුන්වන්නේද **වාවරය** යි.

කවුගල (නැංගුරම)

පැරණි ධීවරයන්ට යකඩෙන් නිමවූ නැංගුරම් නොවීය. ඔහු ඒ සඳහා භාවිතා කළේ ලණු අතින් ගැට ගසන ලද විශාල ගලකි. එම ගල ඔරුවේ රැගෙන යාම අනිවාර්‍යය. ඔරුව මඳකට නතර කිරීමට අවශ්‍ය වන අවස්ථාවලදී **කවුගල** ප්‍රයෝජනයට ගනු ලැබේ.

දියකඩ (නැංගුරම)

දකුණු පළාතේ කටුගල නමින් හඳුන්වන නැංගුරම වයඹ වෙරළ බඩ ධීවරයා **දියකඩ** නමින් හඳුන්වයි. ලණුවකින් ගැට ගසා ඇති ප්‍රමාණයෙන් විශාල ගල්කඩක් මේ සඳහා යොදා ගනී.

කඩ කඹය (නැංගුරම් බඳින ලද ලණුව)

කටුගල හෙවත් දියකඩ බැඳීම පිණිස උපයෝගී කර ගන්නා ලණුව කඩ කඹය වශයෙන් හැඳින්වේ.

රිට (ලීය හෝ ඉන්න)

මුහුදේ පිහිටි ගල්තලා ඇති ස්ථාන හා ගැඹුර බලා ගැනීම පිණිස ඔරුවේ ගෙන යන අඩි විස්සක පමණ දිග ලීය **රිට** යනුවෙන් හැඳින්වේ. රිට වතුරට බස්සවා දැල එලීමට ප්‍රථමයෙන් එය එළිය යුත්තේ කුමන දිශාවටද යන්න විපරම් කිරීම ධීවරයාගේ සිරිතය.

සිරස් අතට බස්සන ලද ලීය උතුරට නැමෙන්නේ නම් **හුළං බෝදිය** යනුවෙන් හැඳින්වේ. එනම් දියරළ උතුරු දෙසට ගමන් කරණ බවයි. රිට දකුණට නැවුනොත් එය **උතුරු දිය** වශයෙන් හැඳින්වේ. එනම් උතුරේ සිට දකුණට රළ පහර හැමීමයි. එයට විරුද්ධ දෙසින් දැල එළීම සිරිතය. මුහුදේ පිහිටි ගල්තලා සහ පර්වත සොයා ගැනීම පිණිසද රිට භාවිතා කරනු ලැබේ.

මුහුදු ලාම්පුව (ඔරුවේ ගෙනයන විශේෂ ලාම්පුව)

ජෝගුවක හැඩය ගන්නා මෙම ලාම්පුවේ කඳ විශාලය. අඟලක පමණ විෂ්කම්භය සහිත නළය ලාම්පු තිරය දැමීමෙන් භාවිතා කරයි. සුළඟට හෝ වැස්සට ලාම්පුව නොනිවීම සඳහා මේ ආකාරයෙන් සකස් කොට ගෙන ඇති බව පෙනේ.

ඇම් කූඩය - පැස (ඇම් රැගෙන යන කූඩය)

ඔරුව හා කොල්ලෑව අතර ඔරු කඳේ ගැට ගසා ඇති **ඇම් කූඩය** හෙවත් **පැස** ඇම් මසුන් නොමරා ගෙන යාමට භාවිතා කරයි. මෙම භාජනයේ අඩක් දිය මතුපිට ද ඇති හෙයින් ඇම් කුරයි පණපිටින් ඇම සඳහා යොදා ගැනේ.

පැස හෙවත් **ඇම් කූඩය** වේවැල් වලින් හෝ පොල් කොළ වලින් වියා තිබේ.

යොත් හැඹිලිය - (කුඩා කූඩය)

යොත හෙවත් බිලී මන්ද ගෙනයාම පිණිස **පැසට** වඩා **ඇම් කූඩය** වේවැල් වලින් හෝ පොල් කොළ වලින් වියා තිබේ.

ඉදිකොළ තොප්පිය (හිසෙහි පළඳින ආවරණය)

ඉදිකොළ වලින් ගොතා ඇති මෙම හිස් වැස්ම දියඹ යන ධීවරයාට අතිශයින් ප්‍රයෝජනවත් වේ. අව්ව හා වැස්ස දෙකටම මෙය ඔරොත්තු දෙන නිසාය. වැස්සෙන් වැටෙන වතුර නොරැඳෙන බැවින් ඉදි කොළ තොප්පිය ගෙනයාම ධීවරයා අමතක නොකරයි.

ලබු කැටය (පානීය ජලය ගෙන යන භාජනය)

දිය උගුරක් පානය කළ නොහැකි සාගරයේදී ඒ සඳහා ගෙඩබිමින් වතුර ගෙන යාම අවශ්‍යය. පුරාණ ධීවරයා ලබු කැටය යොදා ගත්තේ ඒ සඳහාය.

දිය සරොම හා ගොඩ සරොම - මුහුදේ යන විට අදින විශේෂ සරම

දිය සරම මුහුදේ මාලුන් ඇල්ලීමේ දී භාවිතා කරන අතර තොටුපලවලින් ගොඩ බැස කඩමණ්ඩියට යාමේදී සහ වාඩියේදී ඇදීම පිණිස ඔරුවේ ගෙන යන අනෙක් සරම ගොඩ සරම වශයෙන් හඳුන්වනු ලැබේ. සංක්‍රමණික ධීවරයින් මෙම සරොම් වර්ග දෙකම ගෙන යයි.

ගෝනිය (වැස්සෙන් සහ අව්රස්නයෙන් ආරක්ෂා වීම පිණිස මෙන්ම බිලී බැමේදී භාවිතා කරයි)

අව්වේ සැරට පිට රත්වේ. වැහි කෝඩේ ඇද හැලෙන පොදේ සැරට පිට රිදීම ස්වාභාවිකය. එබඳු වේලාවන්හීදී පිට හරහට එළා ගැනීම පිණිස ඔරුවේ ගෙනයන ගෝනිය ඉතාමත් ප්‍රයෝජනවත් වේ.

යොත දමා මසුන් බිලී බෑමේදී ගිළින ලද ඇම සහිත මාළු කුරියා වේගයෙන් ඔරුව තුළට ඇදගත යුතුය. නොඑසේනම් ඔහු සමඟ ඔරුව ඉදිරියට දුවන්නට සිදුවෙයි. මෙසේ හෙයින් මාළු කුරියා ඇද ගැනීමේදී වේගයෙන් විසිවී එන මාළු කුරියා වදින්නේ පපුව ප්‍රදේශයටය. දිගින් දිගටම බිලී බෑමේ දී මෙසේ වීමෙන් පපුවට ඇති වන වේදනාව වලක්වා ගනු වස් ගෝනිය පපුව මතට එළා ගැනීම සිරිත බව ධීවරයන් පවසයි. එම නිසා ගෝනිය ඔරුවේ ගෙන යා යුතු අනිවාර්ය ආධාරකයකි.

ජම්පර කළුව (වැසි කබාය)

වැස්සෙන් සහ සීතලෙන් වැළකීම පිණිස මුහුදේ දී ඇඳ ගන්නා මෙම කබාය කළු පැහැතිය. මෙය ඇඳගත් පසු සීතලක් නොදැනේ. මෙය රාත්‍රී කාලයේදී පමණක් අදින ලද බව පවසයි. පැහැයෙන් කළු බැවින් **ජම්පර කළුව** වශයෙන් හැඳින්වේ.

වටකර මන්ද (නංවන ලද කොඩිය)

ඔරුව දැල් වටකිරීමෙන් පසුව වෙරළ බලා ආපසු පැමිණෙන ධීවරයන් වෙරළට පිරිස් රැස් කිරීම පිණිස කොඩියක් ඔසවා සංඥා කරනු ලැබේ. මෙය **වටකර මන්ද දානවා** යනුවෙන් හැඳින්වේ. **වට කර මන්ද** සඳහා සමහර විට ඇදිවත හෝ දක්වන අවස්ථා ඇත.මෙම සන්නිවේදනය ප්‍රතිග්‍රහණය කර ගන්නා වෙරළ අවට පිරිස් දැල ගොඩ ඇදීමට යුහුසුළු වී රැස් වේ.

බැස්ස මන්ද (කොඩිය පහත හෙළීම)

දැලට මසුන් හසු නොවන දිනවල කොඩිය එසවීම සිදු නොකෙරේ. වෙරළේ සිටින පිරිස් **බැස්ස මන්ද** ඇති අවස්ථාවල දැල ගොඩට ගෙනෙන තුරු බලා නොසිට ආපසු නිවෙස් බලා යාම සාමාන්‍ය ස්වාභාවයයි.

ආම්පන්න - පන්න (මසුන් මරන උපකරණ)

මසුන් මැරීම සඳහා භාවිතා කරණ දැල් වර්ග හා බිලී කොකු ආදිය සෑම උපකරණයක්ම පන්න යන පොදු නාමයෙන් හඳුන්වනු ලැබේ.

ජාඩිය (බරණිය)

ජාඩි දැමීම සඳහා භාවිතා කරණ භාජනය. මෙය මැටියෙන් සාදා ඇති විශේෂ වළදකි.

ධීවර රැකියාවේ යෙදෙන්නන් සියලුම දෙනා ධීවරයන් යනුවෙන් පොදු නාමයෙන් හැඳින්වුවද ඔවුහු කරන කාර්‍යය අනුව විවිධ නම් වලින් හඳුන්වනු ලැබේ. වෘත්තීය පරිසරය තුළ ඔවුන් විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලැබේ.

ධීවර ජන වහර අනුව **හැන්නදි රාළ** යනුවෙන් හැඳින්වෙන්නේ ඔරුව අයිතිකරුය. වත් පොහොසත් කම් ඇති උදව්යට ඔරුමෙන්ම දැල් ආම්පන්න ආදියද තිබේ. විශේෂයෙන් හැන්නදි යන්න කටවහරට එන්නේ ඔරුවක අයිතිය පිළිබඳ කථාකරන අවස්ථාවලදීය. මසුන් මරන්නන් අතර මුදුන් පෙත වන්නේ ඔරුවේ අයිතිකාරයාය. මක්නිසාද යත් දැල් වට කිරීමෙන් හරි අඩකට වඩා ඔරුව අයිතිකාරයාට ලැබෙන නිසාය. බොහෝවිට **හැන්නදියා** ඔරුව කුලියට දෙනු ලැබේ. **හැන්නදි** හා **හැන්නඩි** යන නාමයන් දෙකම ඔරුව අයිතිකාරයා හැඳින්වීමේදී ව්‍යවහාර කරයි.

ඩිවෝස්කාරයෝ යනුවෙන් ඔරුවේ ගමන් ගන්නා පිරිස විශේෂ ධීවර ව්‍යවහාරයකි. මෙම ව්‍යවහාරයේ විශේෂත්වය වන්නේ ඔරුව අයිතිකාරයාගෙන් කුලියට හෝ බද්දට ගන්නා ඔරුවක ගමන් කරන පිරිස හැඳින්වීමේදී පමණක් **ඩිවොස්කාරයෝ** යන්න උච්චාරණය කිරීමයි. **ගැනියෝ** යනුවෙන්ද හැඳින්වෙන්නේද ඔරුවේ ගමන් කරන පිරිසය.

ඔරුවේ ගමන් කරන පුද්ගලයෝ ඔවුන්ට ධීවර කරමොන්තයේදී ඔරුවේ ගමන් කරන ස්ථානය අනුව විවිධ නම් වලින් හඳුන්වනු ලැබේ.ඒ අනුව **මරක්කල හය** යනු **ඩිවෝස්කාරයන්** අතර ප්‍රධාන වේ. සමහර අවස්ථාවල ඔහු ඔරුව අයිතිකාරයා හෝ දැල අයිතිකරුවා විය හැක. දෙමළෙන් **චන්ඩන්, තන්ඩන්** නමින් වීරත්වය, ප්‍රධානත්වය ඇඟවීම සඳහා ඔරුවේ ගමන් කරන ප්‍රධානියා හඳුන්වන අතර **මන්නඩියා** යන්න ධීවර කටවහරේ දක්නා ලැබෙන ව්‍යවහාරයකි.

ඇනිය යනු ඔරුවේ ඉදිරිපස කොටසයි. එය භාරව සිටින පුද්ගලයා **ඇනියේ මරක්කල හය** යනුවෙන් හඳුන්වනු ලැබේ. ඔහු ඔරුව ගමන් කළ යුතු දිශාව හා ලිහිණි ගැවසෙන ඉසව් පිළිබඳ සෝදිසියෙන් සිටිය යුතුය.

දැළ එළීමේ කාර්‍යය භාරව කටයුතු කරන්නේ **අවරේ මරක්කලහය** විසිනි. අවර යනු ඔරුවේ පසුපස හඳුන්වන නාමයයි.

ඔරුව පසුපස කොටසේ දෙපස හබල් පදවන පුද්ගලයන් හඳුන්වනු ලබන්නේ **අද්දර අවලේ** යනුවෙනි.

ඔරුවේ ගමන් කරන විට ඒ සඳහා හබල් ගැසිය යුතුය. **අවල** යනුවෙන් ද හඳුන්වන **හබල** ඉදිරිපස මෙන්ම පසුපසද වනසේ සකස් කොට ඇත. එම පසුපස කොටස දෙපැත්තේ **හබල්** පදවන පුද්ගලයෝ කාර්‍යයක්ෂම විය යුතුය. එසේම ඔවුන් කල්පනාකාරී විය යුතුය. හේතුව දැල එළීමේදී එය නොපැටලෙන පරිදි එබල හැසිරිවිය යුතු වන්නේ **අද්දර හබල්කරුවන්** දෙදෙනාය.

කඳ අවලේ යනුවෙන් හඳුන්වන්නේ ඔරුවේ මැද කොටස දෙපැත්තෙන් හබල් පදවන පුද්ගලයන්ය. මොවුන්ගේ කාර්‍යය තරමක් දුරට පහසුය. එහෙත් ඔරුව නොපෙරෙලෙන පරිදි සහ ඔරුවේ ගමන් වේගය සමබර වන පරිදි අවල් හැසිරවිය යුත්තේ ඔරුකඳ මැද සිට හබල් පදවන පුද්ගලයන්ය.

ඔරු කඳත් ඇනියත් අතර සිටින පුද්ගලයා හැඳින්වෙන්නේ **වරුපද්දා** යන නමිනි. හබල් පැදවීමට උදව්වීම සඳහා මෙන්ම දැල ඇදීමේ කාර්‍යයේදී **මන්නඩියාට** සහය වීම පිණිස ඔරුවේ ඉදිරිපස කොටසේ මොහු ගමන් කරයි.

පලුයා යනුවෙන් හැඳින්වෙන්නේ ඔරුවේ අවරත් කඳත් අතර සිටින පුද්ගලයාය. මොහුගේ කාර්‍යයද හබල් පැදවීමට සහ දැල එළීමේ කටයුතු පහසු කිරීම සඳහා එම පුද්ගලයන්ට උපකාරය පිණිස සිටීමයි.

මසුන් මැරීමට ඔරුවේ යන පිරිස හඳුන්වන්නේ **පන්නකාරයෝ** යන නමිනි. ඔරුවේ ගමන් කරන සියළුදෙනාම මසුන් මැරීමේ කාර්යයේ එකවර නොයෙදේ. වරින්වර එම කටයුතු සුහදව බෙදා හදාගෙන කිරීම ධීවරයන්ගේ විශේෂ සිරිතකි. වරින් වර පන්න කිරීමේ කාර්යයේ නියැලෙන පුද්ගලයා **පන්නකාරයා** නමින් ඔරුවේදී හැඳින්වේ.

මුහුදු යන නවකයා හැඳින්වෙන්නේ **කෝඩියා** යනුවෙනි. **කොඩුකාරයා** යන්නද එයට යෙදේ. පිය උරුමයෙන් හිමිවන රක්ෂාවකි මුහුදු යාම. තම පුතා පළමු කොටම දෙවියන්ට භාර කරන ඔහු මුහුදු ගමනට කැඳවාගෙන යයි. දකුණු වෙරළ බඩ ධීවරයා පළමු කොට දියඹින් යන අතර මග හම්බන්තොටින් ගොඩබැස කතරගමට භාර වී **කෝඩුහිඟන්නා** හෙවත් **කෝඩියා** දියඹට කැප කරවයි.

කෝඩියාට විශේෂයෙන් ඔරුවේ දී කෑමට දෙන්නේ අමු පොල් පමණි. ඊට හේතුව මුහුදු වතුරේ ලුණු සැරට ඇතිවිය හැකි වමනය යාම වැළැක්වීම පිණිසය.

ධීවර කටයුතු වල යෙදීමේදී විශේෂයෙන්ම සංක්‍රමණික ධීවර කටයුතු වල යෙදෙන විට ධීවරයා වෙනුවෙන් ඉහිම් පිහුම් කරන්නා හැඳින්වෙන්නේ **පොංගල්** නමිනි. කාලයෙන් කාලයට යහපත්, සරු මාළු කෙත් සොයාගෙන **ඉදිවර** ඔස්සේ ගමන් කරන ධීවරයෝ ඒ ඒ ධීවර වරාය ආශ්‍රිත ගොඩබිමේ වාඩිතනා ගෙන මාසය දෙක, සමහර විට ඊටත් වඩා වැඩි කාලයක් වාසය කරයි. එහිදී ඔවුන්ට කෑම බීම සම්පාදනය කරදීමට අදාළ ධීවර වරාය ආශ්‍රිත ගමක සිටින කෙනෙකු හෝ ඔරුවේම යන කෙනෙකු යොදා ගනු ලැබේ. ඔහු **පෝංගල්** යන ද්‍රවිඩ නාමයෙන් හඳුන්වනු ලැබේ.

ලාම්පු උඩැස්සියෝ යන නාමයෙන් හඳුන්වනු ලබන්නේ මාළු ඇල්ලීම සඳහා ඇම් කුරයි අල්ලන පුද්ගලයන්ටය. අද්දර මුහුදේ ධීවරයන් යොත් සඳහා ඇම් මසුන් (ඇම් කුරයි) ඇල්ලීම කරයි. කුඩා ඔරු යොදා ගනිමින් **ඉඟුරෝ** වැනි ඇම් කුරයි අල්ලා මහ ඔරුවල දියඹේ මසුන් මැරීමේ යෙදෙන ධීවරයන්ට අලෙවි කරනු ලැබේ. ඒ සඳහා ඔවුන්ට ගෙවීම් කරන්නේ මුදලින් නොවේ. ඇම් ලබන්නා අල්ලන මසුන්ගෙන් හතරෙන් එකක් දෙනු ලැබීම ධීවරයා අතර පවතින සිරිතකි.

ඒ කෙසේ වුවද **ලාම්පු උඩැස්සියෝ** ස්ත්‍රී වාචික රූපයෙන් ඔවුන් හැඳින්වෙන්නේ ඇත දියඹේ යන ධීවරයන්ට වඩා අව ප්‍රමාණයෙන් සලකන බැවිනි.

අන් අයගෙන් මසුන් නොමිලේ ලබන තැනැත්තා **රැවුල් කපන්නා** නමින් ව්‍යවහාරයට පත් වේ. ඔරු ගොඩ වෙනතුරු බලා සිට දැල අයිතිකාරයාගෙන් ඉල්ලා ගනු ලබන පිරිස් වෙරළබඩ විරළ නොවේ. මේ අය රැවුල් කපන්නන් ලෙස හැඳින්වේ.

වෙන්දේසියේදී ප්‍රථමයෙන් වටිනාකම ප්‍රකාශ කරන පුද්ගලයා **ලන්සකාරයා** ය. දැලෙන් ගොඩ අදින මසුන් වැල්ලේදීම වෙන්දේසියේ තබා අලෙවි කරනු ලැබේ. වෙන්දේසියේදී ප්‍රථමයෙන්ම ඊට වටිනාකම කියන පුද්ගලයා **ලන්සෙ තියන්නා** නමින් හැඳින්වේ. බොහෝවිට ලන්සෙ තියන්නා මුදල් යහමින් පවත්නා වෙළෙන්දෙකුය.

රාත්‍රියේදී මුහුදු යන ඔරුකාරයින් එකිනෙකාට ඇතින් ගමන් කරනු ලැබේ. ඔවුන් සිටින ඉසව්ව දැන ගැනීම පිණිස වරින් වර **හූ** හඬ නගන අනෙක් ඔරුකාරයන්ට තමා සිටින බව හැඟවීම මුහුදු යන්නන් අතර පවතින සාමාන්‍ය සිරිතයි. ඔවුන්ගේ එම සන්නිවේදනය **හූව** නමින් පොදු ව්‍යවහරයට පැමිණ ඇත.

මා දැල ගොඩ ඇදීමේදී ඊට අනුබල දීම සඳහා කියන කවි හැඳින්වෙන්නේ **වාරුව** යන නමිනි. බොහෝවිට මේ **වාරුව** කියන පුද්ගලයා වැඩිහිටියෙක් විමට පුළුවන. ඔහු **වාරුව** කියන අතර එයින් දැල ඇදීම සඳහා උරදෙන අනෙක් පිරිසට ශක්තිය සැපයේ.

ජාලියෝ නමින් හැඳින්වෙන්නේ දැල ඇදීම පිණිස උරදෙන පිරිස ලෙස ධීවර ජන වහරේ සඳහන් වේ. නිදසුනක් ලෙස,

එලේ ජාලි එලෙයි ජාලි

හොඩි ජාලි අල්ල ජාලි දැක්විය හැක. **හේලේ තියන්නෝ** වශයෙන්ද **ජාලියෝ** හඳුන්වනු ලැබේ.

ජාලියෝ හෝ හේලේ කියන්නෝ නමින්ද හඳුන්වන දැල අදින පිරිස සාමුහිකව කියන කවි **අම්බා** නමින් හඳුන්වයි. **අම්බා** යන ව්‍යවහාරය වෙහෙස මහන්සි වී වැඩ කිරීමේදී නිරතුරුව සිහිපත්වන බව කිව මනා නොවේ. ඒ මතකයෙන් **අම්බාවෝ** යන ව්‍යවහාරය මා දැල් අදින ධීවරයන් අතර ප්‍රචලිත වන්නට ඇත. දැල් ඇදීමේදී පවසන කෙම් කවි **අම්බාව** යන නමින් හැඳින්වේ.

අම්බාව[2]

හොයියා හෝයියා
හොයිය මලේ හෝයියා
හොයි බෑණෝ හෝයියා
දැල ඇදපන් හෝයියා[3]

තෝරු ද ලොකුමෝරු - දඟලති ළඟ පාරු
ඇදපන් දැල මාරු - නොදොඩන් කයිවාරු
හුරුල්ලො කටු වල්ලො - තොණ්ඩයො කාරල්ලෝ
බෝල්ලෝ කෑරල්ලෝ - ඉන්නව ලොකු දැල්ලෝ[4]

පැන්නොද කිරලාවෝ - ලාග්ගො කරලාවෝ
සූඩයො ජිලාවෝ - ඉන්නව තොඩුවාවෝ
පුළුන්නෝ පන්නාවෝ - කලන්දො කට්ටාවෝ
මරන්දො අයිරාවෝ - නගරයො පොරකෑවෝ[5]

සූලයො කෙලවල්ලෝ - බලයොද කෑරල්ලෝ
අලගඩු හැඩැල්ලෝ - මැද පෙරලති මුල්ලෝ
කුනිද තව ඉස්සෝ - ලොකු ලොකු හාල් මැස්සෝ
පරව්ද කටු මැස්සෝ - දඟලති ලෙස පිස්සෝ[6]

අඟුලුවෝ සාවලයෝ - කකුළුවෝ වව්හලයෝ
පුන්නොද ලොකු සාලයෝ - ඉන්නව තව කීලයෝ
ගිනෙට් හඳපානෝ - කැ හැකි සිරිමානෝ

---

[2] ජේදිරිස් සිංඤ්ඤෝ- දෙවිනුවර
[3] වාරුව
[4] අම්බාව
[5] අම්බාව
[6] අම්බාව

හෙයි ඇදපන් බැනෝ - මංඩඩි අතපානෝ[7]

පුල්ලි අංජිලාවෝ - මඩුවෝ කුම්බලාවෝ

මුරුළු ගෙනාවෝ - මේ හැම ගොඩ ආවොා[8]

මසුන් ඇල්ලීමට භාවිතා කරන දැලට **ජාලය** යන නම යෙදේ. දැල් අදින්නේ **ජාලියෝ** නමින් ධිවර ජන වහරේ හැඳින්වේ. **අම්බාවෝ** යනුද දැල් අදින්නෝය. විශාල මාළු **අහිනවල්** කොටු කිරීමට ගන්නේ දිග පළලින් වැඩි **මාදැලය. මාදැල්** යන්න **මහදැල** යන්නෙන් බැඳි ආවක් සේ සැළකේ. නයිලෝන් වලින් වියන ලද මාදැල්වලට වයඹ පළාතේ **නයිලෝන් දැල** යන වචනය භාවිතා වේ.

මා දැල කොටස් කිහිපයකින් යුක්ත වේ. දැල එලන්නේ මේ කොටස් එකින් එකට සම්බන්ධ කරලාය. එම කොටස් සම්බන්ධ කරන ස්ථානය **ඇස්ස** ය. කුඩා ඇහි සහිත දැල රැහුණේ ධිවරයන් හඳුන්වන්නේ **හුරුළු දැල** යනුවෙනි. මෙම දැල පුත්තලම, මීගමුව හා හලාවත ප්‍රදේශවල ධිවරයන් හඳුන්වන්නේ **බයිබල් දැල** වශයෙනි. තෙප්පං දැල නමින් ව්‍යවහාර කරන්නේ **තෙප්පන්** හා **වල්ලම්වල** ගෙන යන තනි අයෙකුට වුවත් එලිය හැකි කුඩා දැලටය. **හුරුළු දැලට** වඩා මඳක් විශාල ඇහි ඇති දැල **කරමල් දැල** යනුවෙන් ධිවර වහරේ සඳහන් වෙයි. නූල් වලින් ගොතන ලද අද්දර මුහුදේ මසුන් මැරීමට උපයෝගි කර ගන්නා දැල **වැල් දැලය.** මෙයට සමාන තංගුස්වලින් වියන ලද කුඩා දැලකට බටහිර හා වයඹ ධිවරයෝ පොලෝ දැල යැයි කියති. එය රැහුණේ ධිවරයාට **අංචිලා දැල** ය. අතිරේක දැලකින් මාළු වටකර ගැනීම **අස්තාන ගල** නමින් හැඳින්වේ. **පන්නම් දැල** යනුද තවත් මෙවන් ආධාරක දැලකි.

කට්ටි දැල යනුවෙන් හැඳින්වෙන්නේ එකිනෙක බඳින ලද කොටස් කිහිපයකින් යුත් අවශ්‍ය විට වෙන් කර ගත හැකි දැල් විශේෂයකි. **කොස්සිය** යනුවෙන් හැඳින්වෙන්නේ **පක්කම්** මෙන් ඔරුවේ ගෙන නොයන වෙරළ මායිමේ තබන දැලකි.

කෝඩුවා මඩිය යැයි ධිවරයන් වහරන්නේ **මාදැල** මැද පිහිටි දැලේ ප්‍රධානතම කොටසටය. **මඩිය** යනුවෙන් සමහරු මෙය හඳුන්වති. මෙහි දැල් ඇහි ප්‍රමාණයෙන් කුඩාය. ඒ නිසා දැල ඇදීමේදී මඩිය හෙවත් **මස්මඩිය** තුළට ලොකු කුඩා සෑම මත්ස්‍යයෙක්ම එකතු වීම වැළැක්විය නොහැකිය. මෙයට **මහ මඩිය** යන්නද යෙදේ. වයඹ ධිවරයා **සල්ලුවාව** යැයි කියන්නේ **මහ මඩියට** ය. හලාවත ප්‍රදේශයේ **පසන්** හා **දෙබර** යනුවෙන් හැඳින්වෙන්නේ මස් මඩිය හෙවත් මහමඩියටය. හුරුල්ලන්, සාලයන් අල්ලන හුරුලු දැල්වල ප්‍රධාන කොටසද **මඩිය** නම් වේ. මේ දැල් වැල ලණුවලින් වියා ඇති දැල් කොටසට තලවලේ යැයි ව්‍යවහාර වෙයි. **කොසම** යැයි වහරන්නේ **කේඩුවා මඩිය** ඊට යාබද ප්‍රමාණයෙන් විශාල ඇහි ඇති කොටසට ගැට ගසන ස්ථානයටය.

දැල ගොඩ ඇදීම සඳහා දෙකෙළවරට විශාල කඹ දෙකක් ගැට ගසයි. ඒවා හඳුන්වන්නේ **වෙළුම** යන නමිනි. කඹය හා මා දැල අතර ප්‍රමාණයෙන් අඟල් හයක පමණ විශාල කවුළු ඇති දැල් කොටස **දැල් ඉහතය.** දැල එලු පසු සුළං අත හෝ රළ වේගය ඔස්සේ දැල පාවී යන ඉසව්ව ඔරුවේ සිටින ධිවරයා දැන ගන්නේ **ඉපියා** හෙවත් **කොට්ටය** නිසාය. **පුන** යන්නද **ඉපියා** හඳුන්වන තවත් නමකි.

දිය පාර හෝ සුළං අත ඔස්සේ දැල ගසාගෙන යාම **ඊරුව** නමිය. පාවීයාම වළක්වා ගැනීම පිණිස ඒවා යට ගැට ගසා ඇති ගල **ගල් විරියයි. බරුගල** නමින් ද එය හැඳින්වේ. **ගල් විරිය** හෙවත් **බරුගල** හා **ඉපියා** හෙවත් **කොට්ටය** නිසාය. **පුන** යන්නද **ඉපියා** හඳුන්වන තවත් නමකි.

මා දැල අවුල් නොවන් පරිදි එතිය යුතුය. ඒ සඳහා අඩි හතක පමණ දිග ලීයක් උපයෝගි කර ගනු ලැබේ. එය හැඳින්වෙන්නේ **දැල් පොල්ල** යන නමිනි. දැල තැන්පත් කරන වාඩිය **දැල් පොලය.** එය වෙරලේ පොල් අතු වලින් සාදන ලද පැල හෙවත් **වාඩිය**, **දැල් පොල** නමින් හඳුන්වනු

---

[7] අම්බාව

[8] අම්බාව

ලැබේ. **ඉරුන් බෑම** යනු දැල ප්‍රතිසංස්කරණය කිරීමය. සති දෙකකට හෝ මසකට වරක් දැල ඉරන් බෑම ධීවරයන්ගේ අනිවාර්ය කටයුත්තකි. **දැල් ගුලිය** යනු ඔතන ලද දැලයි. **උලව් කරනවා** කියන්නේ දැල පැටවීමටය.

මසුන් ගැවසෙන ඉසව් බලා දැල් එළීම **දැල් වළල්ල** වශයෙන් හැඳින්වේ. දැල් දැමීමට **දැල් වටකරනවා** යැයි කියති. දැල ඇතිලීම **කෝසු** කිරීමයි. **පුරිච්චි** කරනවා යැයි කියන්නේ දැල වේලීමටය. සාමාන්‍යයෙන් මුහුදේ දැල එලන්නේ අර්ධ වෘත්තාකාරවය. එයින් පහසුවෙන් මසුන් අසුකර ගත හැකි බැවිනි.

ඔරුවේ දෙපස ලැලි පලු දෙකක් තබා ඒ මත දැල තබයි. ඊට **එපිලිමන්ද** යන වදන භාවිතා කෙරේ. අඩි හතරක පමණ දිග ලීයක සවිකර ඇති **අතංගුව** බහුලව ප්‍රයෝජනයට ගන්නේ **දැල්ලන්** ඇල්ලීම සඳහාය. ඔරුපන්න කාරයන් සියළුදෙනාම **අතංගුව** භාවිතා කිරීම විශේෂ ලක්ෂණයකි. දැල්ලන් මැරීමට මුහුදු යාම **දැල්ලෝ ගාන්න** යාමකි. පැරණි ධීවරයන් මාලුන් ඇල්ලීමට **මත්ගෙඩි** දමයි.

අතංගුවෙන් හෝ **යොත්වලින්** හසුකර ගන්නා මසුන් ඔරුව තුළට දා ගත යුතුය. එය හැඳින්වෙන්නේ **කාඹු ගෑම** නමිනි. බිලී කටුවට **ඇවලුම් බිලිය** යයි ධීවර වහරේ යෙදේ. බිලීකොකු කීපයක් සහිත යොත **මරුවැල** නම් වේ. **යොතේ** හෙවත් **බිලිමන්දේ** ඇම් කීපයක් අමුණා දියට දැමේ. මාලු රෑසක් එවිට ඇම් ගිලියි. එකවර කීප දෙනෙකු අසුවන නිසා මෙයට **මරුවැල** යැයි කීම එක් අතකින් උචිතය.

බිලීකොකු දමන විට ඔරුව එකතැන නවතා ගත යුතුය. **යානවා** යැයි කියන්නේ එසේ නවතා තැබීමටය. ඇම ඇමිණීමට කියන්නේ **පැහැට පුරවඩවනවා** යන්නයි. **පන්නේ ගහනවා** යනු ඇම දමා ඇදීමය. බිලී බෑම **මාලයන්** කිරීමය. මාළුවා බිලී කටුව කටින් ඇදීම ධීවරයන්ට **මොදෙරෙ ඔටවීම** කි. මාලු රංචුව හෙවත් රෑන මාලු **අහින** වේ. මාලු උඩින් ඔරුව පදවා මසුන් යොතට යොමු කරවන උපාය ධීවරයෝ දනිති. **පනවන්න යාම** යනු ඒ සඳහා යොදන වදනය.

මාලු අහින ඇතැම් වෙලාවක උඩ පනිති. එහෙත් මාළුවා උඩ පනිනවා යැයි කීම තහනම්ය. **පීනුවයි** යැයි එයට කියන වදනය. එසේම මාළුවා ඉන්නවා යැයි කියන්නේද නැත. **දිය ගහනවා** යැයි එයට කියන වදන වේ.

මසුන් අසුවෙන වග දැනුණු විට මරක්කලාගේ දැතින්ම සංඥා කරයි. **ඔඩු කරනවා** යැයි ධීවර ජනවහරේ යෙදෙන්නේ එසේ සංඥා කිරීමය. කපු නූලෙන් අඹරාගත් යොත් **කැන්ද පොතු** තැම්බූ වතුරෙන් හෝ **තිඹිරි** ලාටුවලින් හෝ පදම් කර ගනිති. කැන්ද පොතු කහපාට ගැසී තිබෙන බැවින් එයින් නූල ශක්තිමත් වෙයි. තිඹිරි ගැට කපා මැටි භාජනයකට දමා යොන් නූල සතියක් පමණ පදම් කරයි. තිඹිරි හා කැන්ද පොතුවල පවතින විෂ සහ සැර නිසා යොත කරා මසුන් ළඟා නොවීමට පුළුවන. මෙම විෂ නසා ගැනීමට **කුරුම්බා කහට** යොත් පදම් කරන අමුද්‍රව්‍යයකි. යොත දියට දැමීමට **යනවා** යැයි කියති.

ඉයක්කුව ගැන ධීවරයා විශේෂයෙන් සැළකිලිමත් විය යුතුය. **ඉයක්කුව** යනු කාළගුණයයි. මුහුදේ කාලගුණයට සුළඟ හා වැස්ස බලපායි. **වාරකන්** කාලය යැයි මුහුද සැර අවධියයි. සාමාන්‍යයෙන් **වාරකන් කාලයට** ධීවරයා රස්සාවේ යන්නේ නැත. ධීවරයාට ඒ කාලය **රස්සාව** හිඟවෙන කාලය යි . ඒ කාලයට **මාරියාව** සැර නිසා මුහුදු **රස්සාවේ** යා නොහැක. **මාරියාව** යනු මුහුදු රළය. වර්ෂාව සමඟ සුළං හැමීම **යාරියාව** නමින් හැඳින්වේ. මුහුදේ සැර අඩු කාලය **හරාව** කාලයයි. **හරාව කාලය** ධීවරයාට **රස්සාව හොඳ කාලය** යි. **මුහුදු වලලය** කියා ධීවරයෝ එයට පවසති. ධීවරයන් අතර ප්‍රචලිත කවකින්ද **හරාය කාලය** ගැන මෙසේ කියැවෙයි.

වාරය **වාරකන්මයි**	බහින්නේ
හරහයා හතුරු කන්මයි	කරන්නේ
මාරියා ගෙඩිය පස්සෙන්	හඹන්නේ
ලිහිණියා කඩුලෙන් තංගලු	යන්නේ

වාරකන්, සුළඟට **වාරේ සුළඟ** යැයි ද කියනු ලැබේ. වයඹ ධීවරයා **වාඩ සුළං** නැත්තම් **වාඩේ සුළං** යැයි කියන්නේ **වාරේ සුළඟටය. රුහුණේ** ධීවරයා **උතුරු දිය** වශයෙන් සමහර අවස්ථාවල හඳුන්වන්නේ **වාරේ සුළඟ** ය. **නැගෙනහිර දෙසින් හමන** වාරේ සුළඟ වයඹදී **කරවාඩ සුළඟ** වෙයි. **කරවාඩයක් එනවා** යැයි ධීවරයන් වහරනු ලැබේ.

ගොඩබිම සිට දෙසට හමන සුළඟ ධීවරයා වහරන්නේ **ගොඩ සුළං** යනුවෙනි. **ගොඩ සුළඟ** වයඹ ධීවරයා **කෝඩේ සුළං** යනුවෙන් හඳුන්වති. දකුණෙන් හමන ගොඩ සුළං කාලයේ මසුන් සුලභ බැවින් වයඹ ධීවරයෝ ඊට **සරුඟ සුළඟ** යැයි කියති. මුදේ සිට ගොඩබිමට හමන්නේ **මූදු සුළඟ** ය. **මූදු සුළං** සමඟ ගොඩ සුළං මිශ්‍රවන අවස්ථාවක **වාඩමක්, කෝඩේ** නමින් හැඳින්වේ.

සාය යනු හුළං හමන දිසාවය. **සාය ඇල්ලීම** කරන්නේ සුළං හමන දිසාව දැන ගැනීමටය. එය කරන්නේ රිට ඇල්ලීමෙනි. **ඊයන්තු බලනවා** කියන්නේද එසේ **සාය** අල්ලා සොදිසි කිරීමටය. රළ උත්සන්න වන්නේ **සුළං මාරියාවටය.** වාරකන් කාලයේ රළටත් වඩා ඇතැම් විටක රළ ඉහළ නැගෙති.එය හැඳින්වෙන්නේ **පකුල් මාරියාව** නමින්ය. ඒ අවස්ථාව **යාරියාව** නමින් හැඳින්වෙන අතර, එම අවස්ථාවේදී අනතුරු සිදුවන බැවින් ධීවරයන් නැංගුරම්ලා සිටිති. ඔරුවේ **ඇනියෙන්** ඇතුළු වන **පකුල අවරින්** බිඳී යන බියකරු අවස්ථාවක් ධීවර කවියෙන් මෙසේ හෙළි වෙයි.

ඔකඳ නිස් ගව්ව පානම	දුවන්නා
ඇනියෙන් ගත් **පකුල** ඇවරින්	බඳින්නා
අම්මල දුන්න රං කිරි කටට	එන්නා
වැඩිය කතා නොකරන් පපුව	දන්නා

දියත යනු හුළං හමන අතට වතුර ගමන් කිරීමය. හුළං හමන අත බලා ගැනීම **ඊයන්තු බැලීමයි. ඊයන්තු බලන්නේ** දැල එළීමට පෙරය. එය කරන්නේ රිටක් සිරස් අතට දියට බැස්සවීමෙනි. එම ලීය උතුරු දෙසට නැමී ගියහොත් **සුළං බෝදියර** නමින්ද දකුණු දෙසට නැමී ගියහොත් **උතුරු දිය** නමින්ද හැඳින්වේ.

වතුර පාරට **දියකඩ** යන වදනද යෙදේ. මුහුදු රළ ඉහළ නැගීම **වලාල** යන වදනින් අදහස් වේ. **දිය කලත** යනු ජලයේ කැලඹීමය. දියවැලට ධීවරයෝ **සුරාවලිය** යැයි කියති. **දියකෙල** දියවැලේ අවසානයයි. ජලයේ වේගය වැඩිවන ස්ථානය **දියකඩ මල මන්දිය** නම්වේ. වැසිබර අඳුරු වළාකුළු **පුවාරු** නමින් හැඳින්වේ.

මුහුදු දිය ඉහළ නැගීම **වඩදිය** යි. ඊට **ගොඩදිය** යන වදනද භාවිතා වේ. **බාදිය** යනු ජල මට්ටම පහත බැසීමය. සාමාන්‍යයෙන් **වඩදිය , බාදිය** ඇති වන්නේ සඳේ බලපෑම නිසා යැයි විශ්වාසයක් පවතී. ධීවරයෝ මුහුදේ ගැඹුර බැලීමට **මයියම** නමින් හඳුන්වන ලණුවක් පාවිච්චි කරති. **වාල** සහ **වඩිදුව** යන නම්ද **මයියම** ට භාවිතා වේ.

මුහුදු යන ධීවරයා වර්ෂාව හඳුන්වන **කෝඩය** යනුවෙනි. වැහි වළාකුළු **පුවාරු** නමින් හැඳින්වේ. **වාරබඩ** කළු කරගෙන එනවායි ධීවරයෙකු පැවසුවොත් වැහි වලාවක් එන බව තේරුම් ගත යුතුය. **තළාදීම** යනු අහස ගෙරවීමය. **'මූද අද හරි හයියයි'** ධීවරයෙකු කිවහොත් එහි තේරුම මුහුද වර්ෂාවෙන් හා කුණාටුවෙන් මෙන්ම අකුණු සැර පිපිරීම් වලින්ද යුක්ත බවය. ගොඩට ගමන් කරන රළ සැර නම්, එයට **ඊරුව සැරයි** යැයි කියති. 'ඊරුව සැර වූ' විට ඔරුව තුළට වතුර ඒමට ඉඩ තිබේ. එවිට වතුර **හොඳ කළ යුතුය.** 'වතුර හොඳ කරනවා' යනු වතුර ඉසීමටය.

අහස **තලාදීම** දෙයාකාරයකින් ධීවරයා හඳුනා ගනී. ගොඩින් **තලා දුන්නොත්** එනම් ගොඩබිම දෙසින් අහස ගොරවන්නේ නම් එදින මසුන් සුලභව අසුවේ. **තලාදීම** මුහුද දෙසින් නම් මසුන් හසුවීම විරළය.

ගගුලාව යනු වැස්සය. ගගුලාව කරුණා කරනවා යැයි ධීවරයන් කියන්නේ වහින බව පැවසීමටය. හිරු, සඳු ආදී ග්‍රහයින් සිටි රාශියෙන් වෙනත් රාශියකට මාරුවීම සංක්‍රාන්තිය නම් වේ. ග්‍රහ මාරුවකට පසු වැසි ඒම සිදුවන බව ධීවරයන්ගේ විශ්වාසයයි. ඒ බව **'සංක්‍රාන්තියට පස්සේ මාරියාව එනවාමයි'** යන ධීවර ජන වහරෙන් පැහැදිලි වෙයි.

මුහුදු යන ධීවරයා දියඹේදී මසුන් ගැවසෙන ඉසව් සහ ගොඩබිම සොයා ගැනීම අත්දැකීම් අනුව දනියි. ඒ අනුව ඔව්හු මසුන් සුලභ වීම හෝ දුලභ වීම ගොඩබිම සිට දැනගෙන ඔරු **දුවවීම** කරයි. මසුන් සිටින ඉසව් වලින් මුහුදු පැලෑටි විශේෂයක් වෙරළට ගසාගෙන එයි. ධීවරයා ඒවා හඳුන්වන්නේ **කබ්බ** යන නමිනි. රාත්‍රියේ තඹ පැහැයෙන් දිළිසෙන මෙම එළි ඇතිවීට මසුන් අසුවීම අඩුය. **කබ්බ** දිලිසීම ධීවරයන් හඳුන්වන්නේ **කණාමැදිරි එළි** නමිනි.

ධීවරයන් බහුලව මුහුදු යන්නේ හවස් කාළයේය. ධීවරයන් මං පෙන්වන ඉර, සඳ, තාරකා ආදියට ධීවර වහරක් තිබේ. ඊ මුහුදේ ගත කරන ඔවුන්ට වේලාව හා දිශාව දැන ගැනීමට උදව් වන්නේ තාරකාය. **පෙරකඩ** නමින් වහරන්නේ ඉරබැස යාමෙන් පසු එළැඹෙන වේලාවය. කුරුසයක ආකාරයෙන් නැගෙනහිර අහසේ මුදුන්වන තරු තුන වයඹ දිග වෙරළේ ධීවරයා හඳුන්වන්නේ **කුරුස තරුව** නමිනි. මැයි මාසයේ රාත්‍රී නවයට පමණ පායන තරුව වයඹ ධීවරයා **වාඹ තරුව** නමින් හඳුන්වන අතර රුහුණේ ධීවරයාට එය **සිකුරු තරුව** ය.

කුරුසයක හැඩයෙන් පෙරදිග අහසේ මුදුන් වන තරු තුනට ධීවරයෝ **කුරුස තරුව** යැයි කියති. ධීවරයන්ගේ ගමන් මාර්ගය පිළිබඳ ඉඟිකරන පැහැදිලිව දර්ශනය වන තරුව **නැව් තරුවය.** ගැඹුරු මුහුදේ නැව් ගෙන යන මාර්ගයට ඉහලින් මෙම **නැව් තරුව** පායයි. රුවලක හැඩයටත් ඈත දියඹෙන් තරු හතකින් යුත් තරු පොකුරක් පායයි. එය හැඳින්වෙන්නේ **රුවල් තරුව** නමිනි. මෙම තරු පොකුර පාන්දර පහන්වන යාමයේ පොළවට බිංගන්නා බව රුහුණේ ධීවරයා පවසයි. රාත්‍රියේ නවයත් දහයත් අතර පායන තරු හතකින් යුත් තරු පොකුරක් වෙයි. මෙය පැයක් පමණ වේලා පායා තිබී නොපෙනී යයි. මෙම තරු පොකුර නැවත පාන්දර හතරට පමණ මුහුදු දෙසින් දිස්වේ. මෙය හැඳින්වෙන්නේ **හත්දින්නත් තරු** නමිනි.

දකුණු දිසාවෙන් සිරස් අතට තරු තුනක් පායයි. තාරකා විද්‍යාඥයන් **දඩයක්කාරගේ තරුව** නමින් හඳුන්වන මෙය වයඹ දිග ධීවරයා හඳුන්වන්නේ **කිරිකඳ තරුව** නමිනි. **හෙට්ටියා මැරූ තරුව** නමින් වයඹ දිග ධීවරයන් හඳුන්වන තරුව රුහුණේ ධීවරයන් හඳුන්වන්නේ **පහන් තරුව** නමිනි. උදේට පායන මෙම තරුව පැයකටත් අඩු කාලයකදී නොපෙනී යයි. රාත්‍රී අටට පමන පායා හත් පැයක් පමණ කාලයකදී පොළවට බිංගන්නා තරුවක් වෙයි. ලොකු තනි කරුවක් වන මෙය රුහුණේ ධීවරයා හඳුන්වන්නේ **හත්පැයේ තරුව** නමිනි.

ප්‍රමාණයෙන් විශාල පායා පැය නවයකින් බැස යන තනි තරුව **නව පැයේ තරුවයි. තුරුහණ** යනුවෙන් වහරන්නේ ගොඩබිම හා වෙරළ ඉහලින් පායන තරුවකි. මෙය දිනපතාම පායන්නක් නොවන බව ධීවරයෝ පවසති. **පහන් තරුව** පායා පැය භාගයකට පසු පායන තරුවකට **ජඹුරයා** කියා ධීවරයෝ වහරති. **තරු බිංගන්නවා** යනු තරු බැස යාමට ධීවරයන් වහරන අන්දමය. ඉර උදාවට කලින් පෙනෙන ආලෝකය **හරස් කඩ** හෙවත් **හරස් කහ** නමින් හැඳින්වෙයි. **ඉර තපස් කරන වේලාව** යැයි කියන්නේද ඊටය.

ධීවරයන් **රස්සාවේ යෑමට** විවිධ වේලාවන් යොදා ගනී. **මලයාමට හිටිනවා** හෙවත් **මලෑවට යනවා** යනු දහවල් කාළයේ මුහුදු යාමට ධීවර වහරේ යෙදෙන අදහසයි. පාන්දර හතරමාරට පමණ මාදැල් එළීම **මයක්කම දැමීම** යනුවෙන් හඳුන්වනු ලැබේ. "මා ඉක්කේ" යන්නෙන් අදහස් කෙරෙන්නේ හවසට මූදූ ගොස් මසුන් මැරීමය. සවස පහේ සිට හත දක්වා කාළයේ මූදු යාම **සෙක්කල්** යාමකි.

දියඹ මුහුදු යනවා, හඳට යනවා යනු ඈත මුහුදේ මසුන් ඇල්ලීමට යාමය. **ඉරගල යනවා** යන්නද එම අදහස යෙදේ. ඈත මුහුදේ ගොස් දිගටම මාළු ඇල්ලීම දුවන මූදූ යාමකි. යොත දියට දැමීම **යනවා** නම් වෙයි.

ගණ කළුවර කැටිය යනු මසුන් අධිකව ගැවසෙන ස්ථානයයි. **මාළු කෙත හා මාළු ඉසව්** යනුද එයට යෙදේ. දියයට ගල්පර හා ගල්තලා ඇත. **බෙරුගල් මුහුදු හා වල්කෙල** යනු එවැනි පෙදෙස් හඳුන්වන පදයි. **ගල්හණ** යනුද එවැනි අදහසම යෙදේ.

කුපත යනු ඇම දැමීම සඳහා මසුන් වෙසෙන ගල්තලාවය. ඇම් සඳහා බහුලව යොදා ගන්නේ ඉදුරන් සහ දෑ මැස්සන්ය.

අද්දර මුහුදේ මාළුන් **මාළුබිම්** සොයා ගන්නේ **කැට ලිහිණියාගේ හැසිරීමෙනි.** ඔරුව අයිතිකාරයා හැඳින්වීමට භාවිතා කරන **හැන්නදියා** සඳහාද **කැටලිහිණි** උදෙසා භාවිතා කෙරේ. ධීවරයාට මාළු කෙත් පෙන්වන පක්ෂියා **හොර ලිහිණියා** ද මේ සඳහා ධීවරයාට මං සලකුණු කියයි.

නැගෙනහිර මුහුදේ ඇති රාවණාගේ බලකොටුව ධීවරයාට **රාවණා බැම්මය.** කළුඑළී රහිත මුහුදු පවත්නා කාලයේ මෙම බැම්ම පැහැදිලිව පෙනෙන බව ධීවරයෝ පවසති. මුහුදු කණු ඇත්තේ අද්දර මුහුදේ මාළු බාන අහංගම ප්‍රදේශයේය. **ඉඳිවර** යනුවෙන් හැඳින්වෙන්නේ දියඹ යන ධීවරයා ගොඩ බිමට සම්බන්ධ කරන ලකුණුය. මුහුදේ සිටියදීම පොල්ගස් පිහිටි ප්‍රදේශ පොල්කඩ යාය ලෙස ධීවරයෝ හඳුනාගනී. ගොඩබිම ඔවුනට ගොඩකරයයි. තුඩුව යනු මුහුදට නෙරා ඇති ගොඩබිම් තීරුවයි. **ඉඳිවර** ලකුණු සඳහන් ප්‍රකට ධීවර ජනකවක් මෙසේය.

දුවනවා මිතුරෙ මෙපමණ මේ	සෙව්වේ
සොයනවා සොඳට විපරම්	කෙරෙව්වේ
ඇහෙනවා පමණ යන්තම් ඔය	තැනුවේ
පෙනෙනවා ඔන්න රුව නිල්වැලි	තුඩුවේ

මාළු කෙතෙන් ලබා ගන්නා අස්වැන්න ධීවරයා **ලන්සුව** තබා වෙන්දේසි කරයි. **ලන්සුව** තබා වෙන්දේසිය මෙහෙයවන්නා **ලන්සුකාරයාය.** ඔරුගොඩ පැමිණි පසු **හැන්නැදියාගෙන්** නොමිලේ මාළු ලබා ගන්නා **රුවල් කපන්නාය.** මෝරා අපට මෝරා වුවද ඌ ධීවරයාට **බඩ සුද්දාය. අහංකාරයා** හා **කජ්ජාද** ඌට යෙදෙන තවත් නම්ය. දැල්ලා **කාරයාය. මෝඩයා** හා **පාඩියා** යනුවෙන්ද ඌ වහරති. **වට්ටියා** හෙවත් **වට්ටිකාරයා** යනු මඩුවාය. **දියමහ** තෝරාය. ඩොල්පින් මාළුවා **මුල්ලාය.** බෞද්ධ ධීවරයෝ **මුල්ලන්** මරන්නේ නැත. මුස්ලිම් ධීවරයන්ට ඌ **උංගියා** ය. මුදු ඌරා යනුවෙන් විකුණන්නේ උන්ගේ මස්ය. කුඩා කුරයියන් ධීවර වහරේ දී **ඇම්මාළුන්ය. පුළුන්නා** යනු කටිල්ලාය. කැස්බෑවා **ආමි කුරයාය.**

ඔරුවල මූදු යන අය ගමන් කරන්නේ ඇතිනි. අනෙක් ඔරු සිටින දිසාව ඔවුන් දැන ගත්තේ **හූවෙනි**. මා දැල ගොඩ අදින විට ඊට අනුබල දීමට කව් කියන්නේ වැඩිහිටියෙකි. ඔහු වාරුව කියන විට දැල අදින ජාලීන්ට හයියක් ලැබේ. දැල අදින පිරිස් අම්බාවෝය. ඔවුන් පොදුවේ කියන කවිවලට "කවි අම්බාව" යැයි කියනු ලැබේ. මේ එබඳු අවස්ථාවකි.

හෙයියා	හෝයියා
හොයියා මලේ	හෝයියා
හොයි බෑණෝ	හෝයියා
දැල ඇදපන්	හෝයියා

අම්බාව

කොළඹ යනව	මාළු
ඔහෙ ඇදපන්	යාලු
මඩියත් නෑ	විලු
බරටම දැනු	නාලු

වාරුව

හෙයියා	හෝයියා
හොයියා මලේ	හෝයියා

හොයි බෑණෝ	හෝයියා
දැල ඇදපන්	හෝයියා

අම්බාව

අර ගන්නව	මාළු
දැල මැද නැත	යාළු
යවතැකි තව	මාළු
හොයි ඇදපන්	යාලු

ධීවරයා විවේක ගන්නේ **අයිස්** වාඩියේය. මසුන් අල්ලන්න වෙනත් ප්‍රදේශයකට යාම **රට රටවල් ඉස්සර බලනවා යන්නෙන්** හැගවේ. වන්නියට ළං වෙනවා යන්නද ඊට වහරති. කරුණාවයි කියන්නේ **ඇති** කියන වචනයටය. දැන් **කරුණාවයි** කියන්නේ දැන් මාලු ඇතිය කියන තේරුමය. මුහුදේදි කනවා යැයි තහංචිය **අහු කරනවා** යැයි ඊට කියයි. හොඳ කරනවා යනු ඔරු කඳ තුලට රැස්වූ වතුර ඉවත් කිරීමය. **අලුයම් පොල** යනු දැල්වට කිරීමය. පාන්දර හතරට පහට වට කරන දැල් **අලුයම් පොල** නම් වේ.

ධීවරයන් අතරද විවිධ ගෙවීම් කුලී,මලී හෙවත් පඩිනඩි ආදිය පිළිබඳව විවිධ බෙදීම් ඇත. පොදුවේ ඒවා **ආරවේල්** නමින් හැඳින්වේ. වාරකන් සමයේ දී මුහුදු නොයන ධීවරයා වෙළෙන්දාගෙන් එදිනෙදා නඩත්තුවට ගන්නා වියදම් ආර වේලී නම් වේ. **වියදම් සල්ලි** යනු සංක්‍රමණික ධීවරයන් අඹුදරුවන් පොෂණය කිරීමට ඔරු අයිතිකරුගෙන් හෝ දැල් අයිතිකරුගෙන් ඉල්ලා ගන්නා මුදල්ය.

රිට පන්න ධීවරයන් කණු අයිතිකරුට ගෙවන ලද බද්ද **කණු කුලියයි** අයිතිකරුට **ඔරු කුලිය** ද දැල් අයිතිකරුට **දැල් කුලියද** ගෙවිය යුතුය. සාමාන්‍යයෙන් **ඔරුකුලිය** ලබන ආදායමෙන් පහෙන් තුනක් **දැල් ගාස්තු** වශයෙන් ගෙවිය යුතුය. **මන්නඩි ගාස්තු** වශයෙන් දැල් වටයෙන් ලබන ආදායමෙන් තුනෙන් එකක් ගෙවීම සීමිතය.

ඇම් කුරයියන් සපයන ලාම්පු උඩැස්සියන්ට ගෙවන කුලිය **ලාම්පු උඩැස්සි කුලියයි.** පාරුවේ යන අයට ආදායමෙන් සමසේ බෙදන පහෙන් එක **කොහොට** නමින් හැඳින්වේ. සියළු වියදම් පියවූ පසු ඉතිරි වන කොටසෙන් දැල අදින පිරිසට ගෙවන කුලිය **ජාලි කුලියයි.** සාමාන්‍යයෙන් එය ඉතිරියෙන් පහෙන් දෙකක් පමණ වෙයි. සංක්‍රමණික ධීවරයන් **වාඩි ලයිසන්** කුලී ගෙවති. රජයට ගෙවිය යුත්තේ **බඳුය.** එය දැල් අයිතිකරුවන්ගෙන් ලබා ගන්නා බද්දකි. ඔරු හා පාරුවල පැවැත්ම සඳහා සොයාබලන රජයේ නියෝජිතයා **පාරු විදානයයි.** ඔහුට ගෙවන මුදල රජය ගෙවතත් ධීවරයා එය රජයට ගෙවිය යුතුය. **පිං සල්ලි** එකතු කරන්නේ වසරක් පාසා සිදුකරන ධීවර යාතු කර්ම සඳහාය.

ධීවර වැඩ සඳහා සංක්‍රමණය වීම **හිඟමනේ යාමය.** එසේ යන ධීවරයින් හඳුන්වන්නේ **හිඟන්නන්** යනුවෙනි. කෝඩු ධීවරයින් **කෝඩු හිඟන්නන්ය.** සංක්‍රමණික ධීවරයෝ රජයට ලයිසන් **කුලී** ගෙවා ලබාගත් භූමියේ පහන් පැල් දල්වා නැකතට කණු සිටුවා **වාඩි තැනේ. පොංගල්** නමින් හඳුන්වන්නේ වාඩිවල බත් උයන්නා බත ඉවීමට වහරන්නේ බත ඉදෙනවා යන්නය. හොද්ද ඔවුනට **කහ චතුරය. පොල්** අහරයක් මෙන්ම නවක ධීවරයන්ට බෙහෙතකි.

සංක්‍රමණික ධීවරයන් මාස ගණනකට ඇති වන පරිදි අමු ඉඟුරු, ගම්මිරිස්, කුරුඳුපොතු, සුදුළූණු එකට මිශ්‍රකර අඹරා සාදා ගන්නා ලද කායං හොද්ද නමින් හොද්දක් රැගෙන යයි. **ගුලි කල්කද** ඔහු රැගෙන යයි. පලා කොළ වර්ග වලින් සාදනු ලබන ව්‍යංජනය මැල්ලුම නම්ය. මාළු පමණක් ආහාරයට ගැනීමෙන් ඇති වන බඩේ අමාරු සමනය කර ගැනීමට ධීවරයා **බෙලිගෙඩි** රැගෙන යයි.

ධීවර වාඩිවල කතා බහේදී කනවා යන්න තහනම් වචනයකි. **යැපෙනවා** යන්න එයට භාවිතා වන වචනයයි. **අහු කරනවා** යනු කනවාට යෙදෙන වදනයයි. ධීවරයින් ආහාර ගන්නේ **කේන්දර**යෙනි. කේන්දරය යනු පිඟාන හෝ තැටියයි.

සතියේ සෑම දිනකම භාරහාර ඔප්පු කිරීමට හෝ මුහුදු යාමට ධීවරයා සුදානම් නැත. **පුර පොහෝදා** බෞද්ධ ධීවරයන් මුහුදු නොයයි. එසේම **සිකුරාදා** මුස්ලිම් ධීවරයන් මුහුදු යන්නේ නැත. කතෝලික ධීවරයන් පල්ලියේ පාදම ළඟ ඉටිපන්දම් දල්වා ඔරුවලටද දුම් අල්ලා සතියේ පළමු දින වන **සඳුදා** මුහුදු යාම ආරම්භ කරයි. **සස්සද කොළ** තැම්බූ වතුර ඔරුවට හා ආම්පන්න වලට ඉසියි. එසේම මැතුරු **තැඹිලි** වතුර දැල්වලටත් යොත්වලටත් ඔරුවටත් ඉසිනු ලැබේ. රස්සාව හිඟ දවස්වල ඔරුවේ ඉසීමට සහ බීමට මෙන්ම මුහුණ සේදීමට පල්ලියෙන් දෙන වතුර **බෙන්සාරු වතුර** ය.

සංක්‍රමණික ධීවරයෝ අලියාට **ගජරා** යැයි කියති. **දුම්කොළයා** ද යනු අලියාට තවත් නමකි. වලසා **කළුවා** හෙවත් **අහවලයා** ඌරා **සූකරයා** ය. **හිඟමන් රථ**ේ අහු මාළු රංචුය. මාළු වේලන්නට පෙර **ගංගාවෙන් නාවලා** ගත යුතුය. මුහුදු දියෙන් සේදීම **නාවලා ගැනීමක්** වෙයි. මාළු වේලන්නා **සිප්පමා** නම් වේ.

පෙට්ටියක හැඩයට පොල්කොළ වලින් තැනූ පැස **ලුනිජ්ජ** දමා මසුන් තාවකාලිකව තබා ගනියි. ලුණිජ්ජ යනු ලුණු වතුරය. ඒ පැස **සිප්පමය**. ලුණු දැම්මා ලුණු බැන්දවීමය ජාඩිවලට.

ලුණු මාළු යන නමද යෙදේ. **ජාඩිය** දමන භාජනය ජාඩිය යි කරන වැඩ සේදැරියෙන් කළයුතු බව ධීවරයෝ පවසති. **ඇල නිරියෙන්** වැඩ සිදුවීම ගැන ධීවරයන් සතුටු නැත. සුළු වශයෙන් මාළු අසුවීමට **ඇලනිරීය** යන වදන යෙදේ.

ගැම්මට මාළු අසුවීමට ධීවරයන් ඉතා කැමතිය. යහමින් මාළු අහුවීම **ගැම්මට** අසුවීමය. **ගැම්මට ගෙනාවා** යි කීවොත් අස්වැන්න සරු වූ බවකි. අව්ව ධීවරයන්ට **දැඩියාව** ය. ඔවුන් කරවල වේලන්නේ **දැඩිවායට** දැමීමෙනි.

III

ජන විශ්වාස සහ ඇදහිලි

අවිනිශ්චිත ජීවිතයක් දෝතින් තුරුළු කොටගත් ධීවරයා මුහුදත් එහි ක්‍රියාකාරිත්වයට බලපෑම් එල්ල කරන බාහිර බලවේග පිළිබඳවත් දැඩි අවධානයක් යොමු කරයි. මුහුදේ ක්‍රියාකාරීත්වයට බලපෑමක් කිරීමට සමත් වන ස්වාභාවික බලවේගයන් කවරෙක්දැයි ඔහු හොඳින් දනී. එය පරම්පරාගත සමාජ විඤ්ඤාණය විසින් ඔහුට හිමිකර දුන්නකි.

රුවල් ඔරුවෙන් මුහුදු යන ධීවරයා සුළඟ කෙරෙහි දැක්වූයේ දැඩි අවධානයකි. සුළඟේ ක්‍රියාකාරීත්වය තමාගේ අරමුණ කෙරෙහි සෘජු ලෙස බලපාන බැවින් ඔහු සුළඟේ ක්‍රියාකාරීත්වයට බලපාන සියලුම ස්වාභාවික තත්වයන් පිළිබඳව අවධානය යොමු කරයි.

පුවාරු (වළාකුළු) හි පෙළ ගැස්ම ධීවරයාගේ මුහුදු ගමන තීරණය කරන ප්‍රධාන සාධකයකි. **පුවාරුවල** පෙළගැසීමට අනුව ඉදිරි මොහොතකදී මුහුදේ ක්‍රියාකාරීත්වය වෙනස් විය හැකි බව ඔහු දනියි. අඳුරු පැහැයෙන් යුක්තව කැරළි ගසන එවැනි වළාවන් විසින් ඇති කරනු ලබන වැසි සුළං සහිත කාළගුණය තමාගේ මුහුදු ගමනට අවහිරයක් වේදැයි නොවේ දැයි යන්න ඔහුගේ අවධානයට යොමු වෙයි. ඒ අනුව මුහුදු ගමන තීරණය කරයි.

පුවාරු එක් දිශාවකට (විශේෂයෙන් මුහුදු දෙසට) වේගයෙන් ගමන් කිරීම කුණාටුවක පෙර නිමිත්තක් බව ඔහු විශ්වාස කරයි. මෙසේ මුහුදු දෙසට රොක් වන අඳුරු වළාවන් විසින් කොයි මොහොතේ හෝ කුණාටුවක් ඇති කළ හැකි හෙයින් ඔහු මුහුදු යාමෙන් වැලකී සිටියි.

අහසේ මුදුන් වන තරු පොකුරු අනුවද ධීවරයා කුණාටු පිළිබඳව යම් යම් ඉඟි සපයා ගනී. ඒ අනුව විශේෂිතවූ හැඩතල අනුව තරු පොකුරු එකතු වීම පිළිබඳව ඔහු දැඩි ලෙස අවධානය යොමු කරයි.

වැල්ලේ දෙපා එරීම අසාමාන්‍ය ලෙසින් සිදු වන්නේ නම් මුහුදු රල ප්‍රචණ්ඩව පවතින බවට විශ්වාසයක් ධීවර සමාජය තුළ පවති. ඒ අනුව ඈත දියඹට යෑම පිළිබඳව යළි සිතා බැලීමට පෙළඹෙති. වැල්ලේ දෙපා එරීම ගැන ධීවරයන් පවසන්නේ **මුහුද අද හරි හයියයි** යනුවෙනි.

මුහුදේ සිට ගොඩබිම දිසාවට අසාමාන්‍ය අන්දමින් **වැහිළිහිණියන්** පියාඹා එයි නම් දියඹ මුහුදේ කුණාටුවක් හෝ තද සුළඟක් පවතින බවට ඉඟියක් ලෙස විශ්වාස කරති.

වාරකන් කාලය පවතිද්දී මුහුදට ඉහළ අහසේ **හත් දින්නත්** තරු පොකුරු නමින් හැඳින්වෙන තරු අහුර පායා ඒම **වලාල** කාලය හෙවත් මුහුදු මෘදු වීමේ කාලය උදා වීමේ සංඥාවක් බව ධීවරයා තුළ විශ්වාසයක් පවති. ඒ අනුව ඔවුහු මුහුදු ගමනට අවශ්‍ය ආම්පන්න සකස් කොට ඊට සුදානම් වෙති.

මුහුදට ඉහලින් **කොට දුන්නක්** (දේදුන්නක්) පෑයීමද අශුභ ලකුණකි. **කොට දුන්න** හදිසි මාරුතයක් සහිත වැසි පිළිබඳ ඉඟියක් සේ සලකති. එනිසා කොට දේදුන්න දුටු විට ඒ පිළිබඳව දෙවරක් සිතා බැලීමට ධීවරයා පෙළෙඹෙයි.

මුහුද දිය දැඟලීමට පටන් ගැනීම හෙවත් බුබුළු නැගීමද කුණාටුවක පෙර නිමිත්තකි. කොයි මොහොතක හෝ මුහුදේ ස්වාභාවය දරුණු විය හැකි බවට ඉඟියක් එහි ගැබ්ව ඇති බව දන්න ධීවරයා හැකි ඉක්මනින් ගොඩබිම කරා යාත්‍රා කරයි.

ස්ත්‍රිය පිළිබඳව ධීවර සමාජය තුළ ඇත්තේ යහපත් ආකල්පයක් නොවේ. ඔවුන් තමාගේ ඔරු පන්න හා දැල් පන්න උඩින් පැන යාම අශුභ සිදුවීමක් බවට අදහන බව පෙනේ.

දරුවන් නොවැදූ ස්ත්‍රිය මුහුදු යාමට සූදානම් වූ ධීවරයෙකුගේ ඉදිරිමගට මුණ ගැසීම අශුභ නිමිත්තක් බවත් තමාගේ වෘත්තියට ඉන් සිදුවන්නේ අගතියක් බවත් ඔවුහු විශ්වාස කළහ. වෙරළබඩ ධීවරයන් වැඩිපුර ප්‍රාර්ථනා කරන්නේ පිරිමි දරුවන්ය. පාරම්පරික වෘත්තීය රැගෙන යා හැක්කේ පිරිමි දරුවාට පමණක් වීම එයට හේතුව බව පෙනේ. එහෙත් අද වන විට සංකීර්ණ වූ ධීවර සමාජය තුළ මෙවැනි ආකල්ප දක්නා ලැබෙන්නේ ඉතාමත් සුළු වශයෙන් බව සැලකිය යුතුවේ.

ධීවරයා තමාගේ රැකියාවේ දියුණුව සඳහා මෙන්ම මුහුදේ දී මුහුණ දෙන අනතුරක් වැනි අවස්ථාවක දී හෝ කතරගම දෙවියන්ගේ පිහිටාරක්ෂාව පතයි. අනතුරුව ඔහු පොරොන්දු වූ පරිදි එම භාරයන් නිදහස් කිරීමට විශාල උනන්දුවක් දක්වයි. ඊට හේතු වන්නේ දෙවියන්ගේ බැල්ම සහ පිහිට තමාගේ ජීවිතය සඳහා මහත් උපකාරයක් වේය යන සිතුවිල්ල ඔහු සමඟ තිබීමයි.

අතීතයේදී දකුණේ විසූ ධිවරයා තමාගේ වෘත්තීය සරුනුවූ හෙවත් මුහුදේ මසුන් හීන වී යයි ඔහු තීරණය කරනු ලැබූ කාලවලදී යම් යම් යාතු කර්ම විධීන් හා පිහිට පැතූ බව දැනගන්නට ලැබුණි. එය වැල්ලේ නැටූ යාතු කර්ම විධියක් වූ **ගරා යක්** නැටුම නමින් හැඳින්විණි.

මෙම **ගරා යක්කම** ගන්දර හා දෙවුන්දර විසූ සම්ප්‍රදායික ධීවර ක්‍රම අනුගමනය කරමින් රැකියාව කළ ධීවරයාගේ දැඩි ආස්වාදයට නතුව තිබූ බව ඒ පිළිබඳව පළවූ අදහස් වලින් පැහැදිලි විය.

මෙම **ගරා යක්කම** නිසි පරිදි නැටීමෙන් තම වෘත්තීය කෙරෙහි බලපෑ සියලු අයහපත් දෑ දූරීභූතවී සරු දිවි පැවැත්මකට අවශ්‍ය කරනු ලබන යහපත් ආදායම් මාර්ගය පෑදෙන බවට ඔවුන් තුළ විශ්වාසයක් විය.

පුද සිරිත්

දියඹ සරණ ධීවරයා කාගේ හෝ පිහිටාධාරය පැතීම ස්වාභාවිකය. මුහුදේ රළ වේගයෙන් කැළඹෙන ප්‍රාණය රැක ගැනීම පිණිස ඔහු මෙබඳු අධි භෞතික විශ්වාසයක් කෙරෙහි අවධානය යොමු කිරීම පුදුම විය යුතු නැත. වසරකට වරක් මුහුද අරක්ගත් සියළුම දේවතාවරුන් සහ යක්ෂයන් උදෙසා දානයක් දෙනු ලැබේ. **කළුවැදි අඳුන** සහ **කළු වැදි පූජාව** මේ අතර විශේෂ වේ. ගම්මඩු පැවැත්වීම, පොල්පිටි පැවැත්වීම, ධීවර තොටුපලවල් ආශ්‍රිතව තොවිල් පවිල් භාරහාර සිදු කිරීම විශේෂයෙන් ම දෙවිනුවර, ගන්දර, කෝට්ටගොඩ ආදී වෙරළ බඩ ජනතාවගේ සිරිතකි. තොටුපලවල දෙන දානයේදී ප්‍රදේශයෙන් ප්‍රදේශයට අනන්‍ය වූ විශේෂ ලක්ෂණ තිබේ.

බෞද්ධ ධීවරයන් කිරි ඉතිරවීම,කෙසෙල් ගෙඩි හා අනෙකුත් පළතුරු මෙන්ම කැවිලි වර්ග ද උපයෝගී කොටගෙන ආරක්ෂාව සහ මාළු බහුලව අල්ලා ගැනීමට හැකි වේ යන ප්‍රාර්ථනය මුදුන්පත් කර ගෙන විශේෂ පූජාවන් පවත්වනු ලැබේ. විශේෂයෙන් අලුත් ඔරුවක් දියට දැමීමේදී මේ සිරිත් අනිවාර්‍යයෙන්ම සිදු කිරීම සහ ඔරුවට සහ සූර්යාට ද මුහුදට ද නමස්කාර කිරීම ධීවරයාගේ සිරිතය.

ගම්මඩු පූජා මෙන්ම තොවිල් පවිල් ආදියද මේ සඳහා සිදු කරන ලද බව ඒවාට නිර්මිත කවි වර්ග කිරීමෙන් පැහැදිලි වේ. **ඔරුවේ තොවිලය** ඊට දෙස් දෙන නිදසුනකි. සියළුම දෙවිවරුන් මෙන්ම යක්ෂයන්ද මෙහිදී සිහිපත් කරනු දක්නට ලැබේ. රුවල, ඔරුව ආදිය ආරක්ෂා කිරීම සහ එකී ගමන් කරන පුද්ගලයන් ආරක්ෂා කිරීමද මෙබඳු තොවිලයන්හි අභිප්‍රාය වී ඇත.

රන් කොඩිය බලලා
වට කර වියන ඇදලා
කවි සින්දු අසලා
වරෙන් රුවලේ දේවතාවා

සත් මුහුදු සතතිනේ
නර ලොවට බැස සැනෙතිනේ
සදා නැව් මෙලෙසිනේ
එන්ඩ අවසර ලැබුනේ

පත්තිනි දෙවියන් ළඟට
වරම් ඉල්ලූ හනිකට
දුන්නයි වරම් විගසට
ආවෙ ගොඩබැස මෙරටට

රුවල් නැව් සතකින්
මෙවන් රෝගය හැරයන්
වරම් දී රකිමින්
රුවල් යකු මෙලෙඩ හරිමින්

රන් නැවේ වැඩසිට
බැන්දැයි රුවල විගසට
නර ලොවට බැසසිට
එන්ඩ නික්මුණි සිංහ පුරයට

තේවාවට රන් ඊයක් ගන්නේ
නව කොළ අතු මිටි ඉල්ලා ගන්නේ

මානෙල් සපු දුනුකේ මල් ගන්නේ
රන් ඊයේ බණ්ඩාර වඩින්නේ

කිරි අම්මාවරු සත් බිසවුන්ගේ
හෙල් හත තැදු හත දිවැස් බලන්නේ
නර ලොව නරයින් මරමු කියන්නේ
අමරාපති රන් රුවලට එන්නේ

මල් පෙට්ටිය ගෙන සුවඳ බලන්නේ
සෙනඟත් පිරිවර සිටිති කියන්නේ
රන් රුවලේ මල් පෙට්ටි බලන්නේ
වාහල එළියට දිවැස් හෙලන්නේ

ඉරුගල ඔරුගල දිවැස් බලන්නේ
රන් මුදු පාමුල දිවැස් බලන්නේ
රන් රුවලේ කිරි අම්මා එන්නේ
ගොල්ල සමඟ කිරි අම්මා එන්නේ

එල්ල තිබෙන මල් පෙට්ටි බලන්නේ
ඊයේ කෙළීනා රුව බලමින්නේ
රුවල් යකුනි රන් ඊය කෙළින්නේ
අතු මිටි අල්ලා බීත කරන්නේ

බොල් ලෑලී තල් ලෑලී ඉරලි තියන්නේ
නාමල් සපු මල් වටේ බඳින්නේ
මැණික් රුවල් බණ්ඩාර වඩින්නේ
තල් ලෑලී බොල් ලෑලි ඉරති කියන්නේ

ලෑලී ඉරවා සඳති කියන්නේ
රන් රුවලුත් වට අදිති කියන්නේ
රන් රුවලේ බණ්ඩාර වඩින්නේ

රන් රුවලේ තේවා කරපන්නේ

අටවා රුවලක් වියන් වසන්නේ
රන් දළුමුර නැවට වඩින්නේ
අමා හෙට්ටි රන් මාල වඩින්නේ
රුවල් එකිරි අම්මාවරු එන්නේ

නැව් හම්බන් එන කලට මෙසේයා
වනසන් මෙරට එන සෙනගේයා
දිවැස් බලා එහි මල් සුවඳේයා
රුවල් යක්කු මල් මඩුවට වැඩියා

සත් මුහුදේ රන් රුවල් පදින්නේ
ලේ වග ලේ පොකුණටයි වඩින්නේ
නැව් හත විල් හත දිවැස් බලන්නේ
බූත රුවල් බණ්ඩාර වඩින්නේ

ගණ්ඩ සුවඳ මල් දිවැස් බලාලා
එන්ඩ පැදපු ලණු රුවල් මුදලා
දෙන්ඩ මලුත් බුලතෙන් සරසාලා
රුවල් යක්කු වෙස් බැඳ නටවාලා

නැව් සිය පිරිවර කැටුව වඩින්නේ
සළු ගෙන කුඩ පිට වාඩි කරන්නේ
රත් ගල් මුතු ගල් වට එල්ලන්නේ
එතී රුවල් බණ්ඩාර වඩින්නේ

වටකර රුවලේ දිවැස් බලන්නේ
රතු පට පිළියෙන් සරසා ගන්නේ
බීතය මල්මාදය කරවන්නේ
වට වියනේ බණ්ඩාර වඩින්නේ

විලට වඩින යකු සමඟ සෑදිලා
ගනිව් උරාලේ බොටයි කියාලා
අණසක පාමින් වරම් ලබාලා
කයිය වරාවේ වැදී බැස අසාලා

රුවල් සදා සම්බාන සිටින්නේ
කෙවුල් තුඩේ රතු කොඩිය බඳින්නේ
අවුල් ලෙසට ලණු ඇදලා බඳින්නේ
රුවල් නැවේ මස් මඩිය පීරෙන්නේ

රතු සුදු පිළියෙන් වියන් බඳින්නේ
රන් රුවලේ ලණු වටේ අදින්නේ
රිදී ද රත් රන් දිවැස් බලන්නේ
රුවල් එකිරි අම්මාවරු එන්නේ[9]

පාරම්පරික ධීවරයන් ස්වකීය වෘත්තියේ සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් මෙබඳු යාග බලි තොවිල් පැවැත්වීම තවමත් මෙම පළාතේ කලාතුරෙකින් හෝ සිදුවේ. ඔරුවේ තොවිලයේදී කෙසෙල් කඳන්වලින් ඔරුවක් සාදනු ලැබේ. එය **ලේ ඔරුව** නමින් හැඳින්වේ. හුණු සහ සඳුන් ලෙයට ගනී. මෙම කවි වලදී ඔරුව යන නාමය වෙනුවට නැව යන්න යොදා ඇත. ප්‍රදේශයේ දක්ෂ යකැදුරන් (කට්ටඩිරාළ) ගෙන්වා ගෙන මෙකී තොවිල් කටයුතු සිදු කරනු ලබයි.

මන්ත්‍ර ගුරුකම්

මස් වලට, තොටුපල වලට සහ මුහුදට අරක් ගත් යක්ෂයන්ට කඩවරයින්ට සහ දෙවි දේවතාවුන්ට මුහුදු යන්නන් භාර හාර වීම විශේෂ සිරිතකි. දෙවිනුවර ප්‍රදේශයේ මුහුදු යන්නන් කළුවැදි දේවතාවා නිමිති කර ගෙන සකස් කරන ලද අඳුණක්ද ඇත. එම අඳුන බලා මසුන් ගැවසෙන ඉසව් දැන ගත හැකි බව පැරණි ධීවරයෝ පවසති.

මුහුදේදී මසුන් දැලට හිර කිරීම සඳහා **කළුවැදි දේවතා මන්ත්‍රය** උපයෝගී කර ගනී.

'ඕං .... නමෝ කකුසඳ කෝනාගම
කාශ්‍යප ගෞතම යන පසේ
බුදුවරුන් සතර දෙනා
ස්නානය කරන ගංගාවයි මේ
අද මම හිර කරන්නේ

[9] කොඩිප්පිලි පටබැඳිගේ ප්‍රැන්සිස්

ඕං....ඕං.....ශ්‍රීං.....වේ ගංගාවේ

සිටින කුඩ මැස්සන් හිරයි

ඒසවාහඃ![10]

මෙම මන්ත්‍රයෙන් අතට මතුරා මාදැල කොටු කළාට පසුව මුහුදු දෙසට අත්ල දිග හරිනු ලැබේ. දැල මැදට වී හඬ නොනැගෙන සේ මෙයින් සත් වරක් මතුරනු ලැබේ. එසේ වූ විට දැල් මඩියෙන් මසුන් පිට නොයන බව පැරණි ධීවරයා තවමත් විශ්වාස කරයි.

එසේම රහස්‍ය සහගතව සමහරු දැලට හසුවන මසුන් දැල පුපුරා පිටවී යාමට හෝ මා දැලට මසුන් හසු නොවීම සඳහා ද විශේෂ මන්ත්‍ර භාවිතා කරන බව දැන ගන්නට ලැබිණ. එහෙත් එවැනි මන්ත්‍ර අපට සොයා ගත නොහැකි විය. මසුන් හසු නොවීම සඳහා මතුරන මන්ත්‍ර නිසා එම දැල් වටයට **ගෙම්බෝ, කේප්පියෝ, තෙප්පිලි** වැනි කිසිදු වටිනාකමක් නැති මසුන් හසුවන බවද පැවසේ.

කළුවැදි පූජාව

මස් වලට අධිපති **කළුවැදි දේවතාවා** උදෙසා වසරකට වරක් මස් වග පහක්, මල් වර්ග පහක් සහිත තටුවක් සාදා ඔරුවේ තබා එම තටුව වටේට සහ ඔරුව වටේට දුම්මල දුම් අල්ලා පූජාව පවත්වනු ලැබේ. මේ සඳහා උපයෝගි කර ගන්නා දුම්මලද ජීවම් කිරීමෙන් අනතුරුව ලබා ගත යුතුය. යාම තුනක් දුම්මල ජීවම් කිරීම සිරිතය. ඉන් අනතුරුව ඔරුවට දෙහි කැපීම ද දැලට දෙහි කැපීමද සිදු කිරීමෙන් අනතුරුව, තෙවැනිව මුහුදට දෙහි කැපීමද සිදුකෙරේ.

මනිමේඛලාව උදෙසා සෑම වසරකම කිරිබත් සහ අළු පුහුල් සහිත දානය සැප්තැම්බර් මාසයේ දෙනු ලැබේ. මෙහිදී කතරගම දෙවියන් සිහිපත් නොකරන බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. කිසිවිටක කිසිම ධීවරයකු මුහුදේ අතරමං වීමට මන්තර ගුරුකම් නොකිරීම උතුම් මානව ගුණයකි.

කෙම් ක්‍රම

දින දෙක තුනක් මුහුදු ගොස් සරු මාලු අස්වැන්නක් නොලැබුන විට පැරණි ධීවරයා අපූරු කෙම් ක්‍රම අනුගමනය කර ඇත. ඇඹුලෙන් හා මුත්‍රාවලින් කහ අඹරා ඔරු කඳේ මුල සිට අග දක්වා ගානු ලැබේ. මාළු අහු නොවන්නට යම් කිසිවකුට පලි ගැසීමක් කරන්නේ නම් දෙහි ඇඹුලෙන් හා මුත්‍රා වලින් අඹරන ලද කහ වතුර අග සිට මුල දක්වා ගානු ලැබේ.

කිසියම් තරහකාරයකු විසින් තමන්ගේ ඔරුව හිරකර ඇත්නම් ඒ සඳහා ඇදුරෙකු ගෙන්වා දෙහි කපා එය ඉවත් කරනු ලැබේ.

එසේම මීට අමතරව සිදු කරන තවත් කෙම් ක්‍රම පවතී. සස්සැඳ කොළ තම්බා තැඹිලි වතුර, කහ වතුරෙහි ඔරුව නහවා සියළු **දැල් පන්න** සෝදා පිරිසිදු කොට ඒ මොහොතේම මතුරණ ලද තැඹිලි ගෙඩියේ තැඹිලි වතුර ස්වල්පයක්ද දැල් හණවලට සහ ඔරුවලට ඉසිනු ලැබේ. මුහදේදී එම තැඹිලි වතුරෙන් මුහුණ සෝදා ඔරුවේ යන අනෙක් පිරිසටද තැඹිලි වතුර මුහුණට ඉසීම ව්‍යක්තීය සශ්‍රීකත්වය අපේක්ෂා කරමින් සිදු කරන සත් චාරිත්‍රයකි.

නිමිති

[10] කොඩිප්පිලි පටබැඳිගේ ප්‍රැන්සිස්

සංඥාව නිමිත්ත වශයෙන් සලකනු ලැබේ. ඔරුව දියට දැමීමට ප්‍රථම ඔරුව සහ මුහුද අතරින් කිසිවකු ගමන් කළ විට ඔරුව දියට දැමීම නවතනු ලැබේ. එය දුර්විපාක නිමිත්තක් සේ සකලන බැවිනි.

අහසේ ස්වරූපය සහ මුහුදේ ස්වරූපය දැන ගැනීමද නිමිති කාරකයක් වශයෙන් හැදින්වේ. මුහුදේ **බොරකැටියක්** ඇති විට මුහුදේ පෙණ දමන නිමිත්තක් ඇති විට එය අසුබය. එනම් **දිය වැලක** නිමිත්තක් වන නිසාය.

ගොඩබිම දෙසින් අහස ගෙරවීම මසුන් බහුල බව හැගෙන නිමිත්තකි. මුහුද දෙසින් අහස ගොරවන්නේ නම් මසුන් හිඟ බවේ සලකුණකි. ඉර හඳ මෙන්ම තරු ලකුණුද ගොඩබිම දැන ගැනීමේ නිමිති වශයෙන් පැරණි ධීවරයා විශ්වාස කළේය.

රත්බොල් දියාත සලකුණු වීම මසුන් බහුල වීම දක්වන නිමිත්තකි.

ලිහිණි ගැවසීමේ නිමිත්තද මසුන් බහුල බව හැඟවීමය. තරු ලකුණු නිමිති පිළිබඳව ඒ ඒ ලකුණ අනුව විවිධ වෙනස්කම් පවතී.

09

ධීවර ජනකවි

ධීවරයා මුහුද ජීවිතය කරගත් මිනිසෙකි. මුහුදේ රළු බව හෝ ජීවන ක්‍රමයේ ඇති අවිනිශ්චිතභාවය හෝ පිළිබඳව සිත සිතා ලත වෙවී සිටීමට ඔහු සූදානම් නැත. ඒ නිසා ඔහුට එම බියකරු අභියෝගය අමතක කර දැමීම අභියෝගයක්ම විය. එම අභියෝගය ජය ගැනීම සඳහා කවිය තුළ ඇති සුගායනමය රිද්මය ඔහුට උපකාරී විය.

කවිය යනු භාෂණමය ප්‍රායෝගික ප්‍රකාශනයකි. භාෂණය යනු හුදකලාව මග හරවා ගත හැකි ප්‍රායෝගික ක්‍රියාකාරකමකි. මුහුදේ තනි වන ධීවරයාගේ හුදකලාව නැති කර ගැනීමේ මාර්ගයක් සේ බිහිවූ ධීවර කවිය පසුව බොහෝ හේතු සාධක මත ක්‍රමික විකාශනයකට භාජනය වූ බව පෙනේ.

මුල් යුගයේ ධිවර යාත්‍රාව ජලය මත පාවී යා හැකි යාත්‍රාවක් විනා මුහුදේ රුදුරු බව ජය ගැනීමේ තත්වයේ වූවක් නොවීය. එහි ගමන දුෂ්කරය. බියකරුය. රාත්‍රියේ සුළඟේ ආධාරයෙන් දියඹට ඇදෙන ඔරුව තුළ ගමන් කරන්නේ දෙදෙනෙකු හෝ තිදෙනෙකි. සුළඟට හසුව යාත්‍රාව තමාට අවශ්‍ය කරන දුරකට ඇදී යනතුරු ඔව්හු යාත්‍රාව මත අපහසු ඉරියව්වකින් ඉඳ සිටිති. මේ අවස්ථාවේදී පිරිසේ අය නිදිකිරා වැටීමට ඉඩ ඇත. ඒ පිළිබඳව අවධියෙන් සිටීමේ වගකීම ඇත්තේ යාත්‍රාවේ නායකයාටය. නොහොත් **මරක්කලාහේ**ටය.

ඔහු තම පිරිස නිදි දෙව්දුවගේ ග්‍රහණයෙන් මුදවා ගැනීමට කුමන හෝ ක්‍රියාකාරකමක නිරත යුතුවිය. ඒ සඳහා ඔහුට උපකාරී වූයේ කවියයි. සෑම **මරක්කලාහේම** කෙනෙකුම හොඳ කවිකාරයෙක් වූ බව පැරණි ධිවරයෝ පවසති.

ඉඳිවර කවි

හම්බන්තොටින් ඇදලා රුවල විගසින්නේ

නියැඳ කුපත කොල්ලෑවට තබාගෙනේ
වලවේ මෝදර ද ඉබ්බාගල නොපෙනේ
වටගල බලා දුවපන්න දියඹිනේ

වාරයා වාරකන්මයි බහින්නේ
හරහයා හතුරු කන්මයි කරන්නේ
මාරියා ගෙඩිය පස්සෙන් හඹන්නේ
ලිහිණියා කඩුල්ලෙන් තංගලු යන්නේ

දුවනවා මිතුරෙ මෙපමන මේ සෙව්වේ
සොයනවා සොදට විපරම් කෙරෙව්වේ
දැනෙනවා පමණ යන්තම් ඔය තැනුවේ
පෙනෙනවා ඔන්න රුව නිල්වැලි තුඩුවේ[11]

බලේ මොටද අඟවාලා කියන්නේ
ජලේ ගැඹුර නොදැනද ජලයට පැන්නේ
මලේ සුවඳ දස අත විහිදු වන්නේ
ගලේ මොටද ඉනි අහුලා බලන්නේ

අපිත් දුවමු මහ රුවලට උඩ ඇදලා
ගන්දර නොපෙනී යන කල පපුව උණුවෙලා
වල්දු ගලත් එනවලු අප කිට්ටු වෙලා
දෙබෑගලට කිට්ටුද සකි පස්ස ගලා

ඔන්න බලාපන් ඉර පායන තානේ
තලා දිදී එන සුළඟකි කළ ගානේ
වළාහක දෙවිඳු හෙළි කළ සඳපානේ
බලා දුවපන්න අන්දම තඹානේ

ගොඩින් වලස්සුත් ඇත ගල් ගෙවල් වල
ගොඩින් සොඳ වතුර ඇත වැව් පොකුණු වල

[11] එල්.වයි.ඩැනී - කෙමගොඩ -දික්වැල්ල

වටින් කුපත් ඇත එහි වරාගල
මැදින් සොඳ වරායේ අරගන් රුවල[12]

මුහුදේ දුක

කතරගම දෙවිඳු කන්දස් ස්වාමිනේ
අතරමංවෙලා අප විදින දුක් අනේ
නිතර සිහි කරමි ඔබගේ ගුණ වරුනේ
අපට පිහිට වනු කන්දස් ස්වාමිනේ

කතරගම දෙවිඳු කන්දස් ස්වාමිනේ
ඔරුව හබල රත්තරනෙන් හදාගෙනේ
ඇත් කුඹ පරුවත රිදියෙන් හදාගෙනේ
ඇහැළ මසට එනවා හිස තබාගෙනේ

කතරගම දෙවිඳු කන්දස් සුවාමිනේ
ඔරුව රුවල රත්තරනින් තනාගෙනේ
කුඹද පරුමාණ රිදියෙන් තනාගෙනේ
ඇහැළ මහට එඤ්ඤයි හිස තබාගෙනේ

කතරගම දෙවිඳු කන්දස් ස්වාමිනේ
අතරමංවෙලා අප විදින දුක අනේ
ඔරුව කොල්ලෑව රිදියෙන් තනාගෙනේ
ඇහැළ මහට එඤ්ඤයි හිස තබාගෙනේ

කතරගම දෙවිඳු කන්දස් ස්වාමිනේ
අතරමංවෙලා අප විදින දුක අනේ
නිතර සිහි කරමි නුඹගේ ගුණ වරුනේ
අපට පිහිට වනු කන්දස් ස්වාමිනේ

පෙර කරපු අකුසලයට මුදු යන්න හිතුනා

[12] දැඩිගම විතාරණගේ මාටින් සිඤ්ඤෝ

සීත සුළං එනකොට අනෙ අම්මා මතක් වෙනවා
හුළං සමඟ වරුසාවද ගොරව ගොරව එන්නා
එතන හිටන් අපිට අනේ දෙවියො මතක් වෙන්නා

රෑ ඉදලා එළි වෙනකං අපි තෙමී තෙමී ඉන්නේ
එළිවෙනකං ඉඳලත් අනෙ ගොඩ නොපෙනී ඉන්නේ
හැන්දැවේ අනේ බඩගින්නත් වැඩි වේගෙන එන්නේ
සතර වරම් දෙවි නාමෙන් ගොඩ පෙනී පෙනී එන්නේ

සතර වරම් දෙවි නාමෙන් ඇද්දා රුවල ගොඩට
සතර වරම් දෙවි නාමෙන් ආවයි අපි ගොඩට
සතර වරම් දෙවි නාමෙන් කතරගම යන්ට
මූදෙදි අපි භාරවුනා කතරගමට යන්ට

ඈත රටයි අපි ඇවිදින් සිටින්නේ
සීත සුළං කිසි කිසි ගා වදින්නේ
දෝත මුදුන් දී මුනිදුට වදින්නේ
නාථ දෙවිදු රැකදෙන් මේ අප සැමදිනේ

කන්ද කුමරු අම්මා වල්ලි සාමිනේ
නින්ද නැතුව කඳකට කකුල දීගනේ
බැන්ද පඬුරු මාලිඟ හඳු හත මුදුනේ
යන්න අපට අවසර දෙනු සුවාමිනේ

කතරගම දෙවිදු කන්දස් සුවාමීනේ
අතරමගයි අපි වැඳ වැඳ දුවන්නේ
සතර සයුර ඔබ දිවැසින් බලන්නේ
කතරගම දෙවිදු බලෙන් මෙ ගමන යන්නේ

කතරගම දෙවිදු කන්දස් ස්වාමිනේ
ඔරුව රුවල රත්තරනින් සදාගෙනේ
හැන් කුඹ පරුමාණ රිදියෙන් සදවාගෙනේ

ඇහැළ මහට එම් හිස තබාගෙනේ

ඔකඳ තිස් ගව්ව පානම දුවන්නා
ඇනියෙන් ගත් පකුල අවරිටින් මිදෙන්නා
අම්මා පෙව්ව රංකිරි කටට එන්නා
පණ තිබුණොත් එන පෙරහැර වඳින්නා

බැඳලා පඬුරු අප සැම දෙන එකතු වෙලා
ඉඳලා කිහිප දවසක් අතර මග බලා
ඇඳලා රුවල දියඹට ඔරුව නික්මී ලා
හැරලා ගියෙමු ගොඩවායත් පසු කරලා

එළිවෙලා කුකුලෝ හඬලන වෙලාවේ
රෑ වෙලා මොනරු නද දෙන වෙලාවේ
බඩගිනි වෙලා බිළිඳු හඬනා වෙලාවේ
පමාවෙලා වැහැපන් වැහි වලාවේ[13]

ඔකඳ පොත්තනද පානම දුවන්නේ
ඇනියට ගත් පකුල අවරට විදින්නේ
දනවා පපුව අම්මා මට සිහිවෙන්නේ
වැඩිය කතා නොකරන් පපුව දන්නේ

මූදේ අනේ අද මා තනී වී ඉන්නේ
දැනගෙන පාර කොහොමද වෙරළට යන්නේ
දනවා මගේ හද දැඩි සෝ දුක දුක් ගින්නේ
මොන කරුමයද මා හට මේ පල දුන්නේ

පුර සොඳිනා මඩකලපුව සමීපය
පුරුදු වුනා කරදිය වතුර සාපය
අපි විඳිනා දුක දනිතොත් දෙමාපිය

[13] ගුණදාස හෙන්දාවිතාරණ - දෙවිනුවර

චතුර නොනා ඇස් දෙක දන්නෙත් බැරිය[14]

ග්‍රාම නාම

පලුටුපාන මං පොල්ලේ අසිරුව
පට්ටනගල්ල කෙළ කෙළ ඉන්න සිරුව
අලුත් ඔරුව නිති ගම්මැද්ද පාරුව
යාලට යන්න වේලා ඇත්ද යාලුව[15]

කිරල වැල්ල වාව්ව රිටිගල සයුරු
පිටට පවන් හැකි ලෙල දෙන නුන්නලු
හොඳට ඔරු පාරු ගොඩ යන ගන්දරලු
අදට නවාතැන් නොදෙන නාඔටුන්නලු[16]

කතළුව අහංගම සොඳ ගොයියපාන
මිදිගම කුඹල්ගම මානැවිය පොකුණ
වැලිගම පැලෑන ද පොල් අතු මෝදරින
මීරියකන්ද කත නැවතී වාඩි ගෙන[17]

හාස - උපහාස සහ උපහාස

දෙහි බබියෝ උඹ මොනවද කරන්නේ
මොන මාළුවද උඹේ ගෑනිට අසුවන්නේ
උඹ තාමත් නින්දෙන් දැයි පසු වන්නේ
උඹේ පවුල කා සමගද නිදියන්නේ

වල් කෙළ කිනවා නුඹ විලි නැතුව දැනා
දැල් පොල එලනවා බලමින් දියඹ හනා
හතරම යනවා බඩතුරු හණ ලගිනා
දැල්පෙලෙ නගිනවා මඩ වැලි වරායනා

[14] පී.ඇම්.නන්දසේන - දෙවිනුවර
[15] පී.ඇම්.නන්දසේන - දෙවිනුවර
[16] එදිරිවීර ආරච්චි පටබැඳිගේ චාර්ලිස් අප්පුහාමී - ගන්දර
[17] ගුනදාස හෙන්දාවිතාරණ - දෙවිනුවර

මතු පවතින්නේ අපෙ ඔරුවේ මැද සැලුනේ
මතු පිනකිනේ තොට ඔය ඔරුව සෑදුනේ
ජඩකම නොවෙද තෝ මට දොඩන කාරනේ
පර දෙමළුනේ නොකරන් කවටකම් අනේ

දෙවුන්දරට ගියාය මම බලන්න ගීගන කොල්ලා
සලන් සලන සලඹ පොදිය තිබුනේ උඩ එල්ලා
පරංගි ලෙඩ වෙලා සිටියේ ගෙදර සිටිය ගොල්ලා
අනුන්ට සෙත සලසන්නේ කොහොමද ජඩ බල්ලා[18]

සංක්‍රමණික ධීවර අත්දැකීම්

දේසේ සොලී රට යන්නට දොඩා ගෙනේ
බෝසේ බඩු මුට්ටු සපයා ගෙන සොදිනේ
වරුසේ එක් දහස් අටසිය විසි එකිනේ
මාසේ නිකිනි දහවෙනිදා පිටත් වුනේ

සංතොස ලෙස පිටත් වී හික්කඩු ගමනා
පිං දී දෙවියන්ට යැද යැද යන ගමනා
මේ යන නරයින්ට දෙවි පිහිටා වෙමිනා
හැන්දා විය රළ ගල කුපිත දියඹෙනා

එළිවෙන කොට දැකපි තොටුපොල මිරිස්සේ
වලි කිය කියා අදිනා දැල් සිත තොස්සේ
ගමන් යන්න සුළඟක් නැති එම දවසේ
වැලිගම වැල්ලේ කැන්ටිමෙ රා කදිම යසේ

සරි නිල්වැලි තුඩුව මා වැල්ල පසු විය
හරි තන්ගලු කොටුව ගඩොලනෙ පසු විය
සදු දින සවස කළ මැටි වෙරළට ළඟා විය

[18] ජී.එස්.මානගේ - දෙවිනුවර

ඔන්න කිරින්දේ පාන ම දුරට පෙනේ
මන්ද සෙව්ව වියලට යන්න ආ තැනේ
දෙන්නා අවර සුක්කානම අල්ල ගෙනේ
යන්නේ පට්ට තන් ගල්ලද බලා ගෙනේ

ගමන් ඇවිත් අපි රස්සා වෙන කලට
කලින් ගම්මාන දැකලා හිත සතුට
තදින් මාරියා ඇත සාගරය වට
පිලින්නාව මේකද මිතුර ගම රට

සරිකරා වැන්න අකුසල් ගෙවි දද
බැරිදරා ගන්න කුසගිනි දාය මෙදා
කිරි එරා ගන්න සවිබල නැතිය මෙදා
තිරිකුණාමලේ දුටුවේ සදු දින දා

අපිත් දුවමු මහ රුවලට උඩ ඇදලා
ගන්දර නොපෙනී යන කල පපුව උණුවෙලා
මලිදු ගලත් එනවලු අප කිට්ටු වෙලා
දෙබෑ ගලට කිට්ටුද සකි පස්ස බලා

රිලව් සේම මිරිකුඩ පිට නැගීලා
මාරියන් බලති ඊයම් දිය දමලා
කොයියම් රටක දෝ වීසෝ බලාලා
දෙයියන් වදිමු අප ගොඩකර නැගීලා[19]

වල් කෙල ගැන කී කවි

දිග් ගල් උසානේ
හිදලුව මහ තබානේ
හොරෙන් කොලු බානේ
ගොසින් යාපන් වාලුවිදානේ[20]

[19] එදිරිවීර ආරච්චි පටබැඳිගේ චාර්ලිස් අප්පුහාමි (වාරකන් වාරෝ අයියා) ගන්දර

විවිධ පද බැඳුම්

කතරගමට ගියදා ඔතන වාඩියේ
නිතර දෙමළු සක්මන් කරන විදියේ
අතරින් පතර මුතු අමුණන සවාරියේ
මතක නැතිව අත වැදුනා දෙමළ ලියේ

කලු අප්පු පුතනුවනේ අද වැල්ලේ
එනව පෙනේ ඔරු එක දෙක ගොඩ එල්ලේ
නුඹ නොපෙනී මගෙ හදවත ගිනි දැල්ලේ
උඹ නැති නිසා පාළුයි කිරලා වැල්ලේ

පේරාදෙනියෙ ලොකු තැන්වල මහත්තරු
පාලම සදන්නට ගත්තේ උණ පතුරු
ඒවා මදිව ගන්නේ තව යකඩ පොලු
පාලම තිබේ මේ කප පවතිනා තුරු[21]

කවි අප්පුගෙ පුතනුවනේ අද වැල්ලේ
එනව පෙනේ ඔරු එක දෙක ගෙඩි එල්ලේ
නුඹ නොපෙනී මගේ හදවත ගිනි දැල්ලේ
අඳුරු උනේ අදයි කීරලා වැල්ලේ[22]

තේරවිලි

රස්සද ගලේ ගල පල්ලේ උපන්නේ
ඔළුව නැති කඳමයි සාප දුන්නේ
ඇස් දෙක උඩ තියා බිම ගොදුරු කන්නේ
මෙතැන් පදේ තෝරලා කියන්නේ[23]

---

[20] පී.ඇම්.නන්දසේන - දෙවිනුවර

[21] ගුනදාස හෙන්දාවිතාරණ - දෙවිනුවර

[22] ජී.එස්.මානගේ - දෙවිනුවර

[23] ඇම්.ඇම්.සිරිසේන - දෙවිනුවර

(කකුළුවා)

කරුවල දහස් පන්සියයකි අඹ රුකකි
ඒ අඹ රුකේ ඵල ගත්තේ අඹ දෙකකි
ඒ අඹ දෙකේ පණුවන්ගෙන් සූ සැටකි
තෝරන කෙනෙකි අඹ සතරකි නැටි අටකි

(කරුවල දහස් පන්සිය නම් කප නොවෙද
අඹ දෙක නම් ඉරහඳ දෙදනෝ නොවෙද
සූ සැට නම් අහසේ තරු නොවෙද
නැටි අට නම් දඹදිව අට කොණ නොවෙද)

සාවෙක් මම දුටිමි අතු අග පැන යනවා
ගෝණෙක් මම දුටුමි අතු අග දළු කනවා
ඌරෙක් මම දුටුමි හාරන් අල කනවා
සීනෙන් මම දුටුමි පිරිමින් කිලි වෙනවා

(සාව නොවෙයි සංසාරේ ගොඩ ලනවා
ගෝණ නොවෙයි කෝණාගම බුදු වෙනවා
ඌර නොවෙයි වසවතු යුධයට එනවා
සීනෙ නෙවෙයි සිරිබෝ ගස දළු ලනවා)

දෙවුන්දරින් කල්ලිදූවට[24]

පළමුව බුදුන් වැද අවසර ලබාගෙන
දෙවනුව දහම් සඟ යන තිවිධ සරණින
තෙවනුව දෙවියන්ට පින්දී වර රැගෙන
බලමුව ගමන් ගැන පසු දින උදැසන

මසින් අප්‍රේල් විසිනව වෙනිද උදේ

[24] ඇම්.ඇම්. මැන්දිස් සිල්වා - මිදිගහවත්ත-කෝට්ටගොඩ

ගොසින් ඔරු ළඟට කටයුතු කර නිබඳේ
ගොසින් කතරගම දෙවිඳුට පඬුරු බැඳේ
යන්න පිටත්වුණේ දුක්දී සිතට හදේ

ගොසින් ගොඩවාය තොටමුණ අල්ලන්නට
තදින් රළවේග විය එහි බැරි යන්ට
නමින් සොඳ ජාවෝ මස් මරණ තැනට
සුළං වේගයෙන් ගියෙ හම්බන් තොටට

එදා අපි සැවොම ඉද එතැන එක්වෙලා
ගියා යන්ට ගන්දර ඔරු අපි දමලා
අවා ගිනි වැදී මාමා ඇතුව බලා
කියා එව්වාය දැන් වේගය කියලා

වටපිට බල බලා ඉන්නා කල මෙදිනේ
දොලහට විතර ආවයි බස් රියෙන් සැණේ
හනිකට ඔරු වරායට බාගෙන ගොසිණේ
විගහට රුවල ඇද ගමනට පිටත් වුණේ

ගියා යන්න අපි ඔරු තුන තනි වෙමින
කියා ගන්න බැරිවුණි දෙවිඳුට එදින
එදා වැහි සුළං වේගෙට අසුවෙමිණ
සොයා ගන්න බැරිවුණි අපිට තොටමුණ

බෙදලා පෙර ජාතියේ දම් නුදුන් නිසා
ගෙවලා විදින්නට වුනි අපට දුක් රැසා
කරලා ගොඩ ඉන්න අලි වලසු නිසා
පෙරළා අයියනෝ ඇන්කර දැමුවයි නොලසා

ඉඳලා සයුර මැද එළිවෙන තුරුව බලා
වැඩිලා කුසගින්න කවුරුත් සුසුම් ලලා
ඇදලා රුවල් ගියෙ ගන්දර ඔරු එකලා

බැදලා දෙවියන්ට පඬුරුත් රුවල් කලා

රට රටවල අය ගොස් මස් මරන්නට
වට පිට වට කරන මාදැල් ඇද සොඳට
දුටු දුටු අයගේ සිත් පිනවන වරායට
අද සිට හෙට යමුව පොතුවිල පමාකොට

මාස් සුළඟ අසුවුණි එදිනම උදයේ
දාස් ගණන් හේරුත් ගැසුවයි තරයේ
ලාස් ගැසී ගන්දර ඔරු යන්ට ගියේ
කල්ලි දූව අල්ලන කොට අඳුරු වුණේ

කිරළ වැල්ලෙන් පින්නතුඩාවට[25]

ළඳුනේ එදා කිරළා වැල්ලෙන් පැමිණ
සොඳිනේ රුවල් ඇද ටික දුර එන සඳින
භයංකාර සිර මැදුරක් කොටු පොකුණ
දකින්නට ලැබුණ තංගලු පුර ඉතින

තංගලු මුහුද පසුකර යන කළ මිතුර
චංචල වී මුහුද ටික ටික භයං කර
සංකර ජාති හා ජාවන් වසන අර
හම්බන්තොටට ආවේ සවසයි හතර

දිනය එදා විසිවෙනිදා රෑ කාලේ
පිරිස වී කවුරු කවුරුන් එක වැල්ලේ
වීදිය බලා එළිවෙන ජාමෙට නිමලේ
දිරිය වඩා ඔරු බා ගත්තයි එවෙලේ

සත් සමුදුරේ වැද පාවෙන ඔරු රෑනා
එළිවෙන තුරා දැක ගන්නට බැරිවූ තැනා
අයියෝ අපොයි දැන් සුළඟත් දරුණු වුණා

[25] කේ.ඩී.ජේදිරිස් සිල්වා - බණ්ඩරවත්ත -කෝට්ටගොඩ

දෙයියෝ පිහිට ඉල්ලා වැන්දා බැතිනා

ඔන්න කිරින්දේ පානත් දැන් පෙනෙනා
දන්න තරම් සුළගත් එහි දරුණු වුණා
යන්න පාර බැදගන්නට ගලුත් ගෙනා
ඔන්න රාවනා රජුගේ පර පෙණුනා

ඉතාමත් දරුණු ඇත්තේ ඒ මුහුදයි
කතාවක් කරන්නට නම් සිතට බයයි
ගොතා ගත් පණිඳු සේ සුලගත් වේගයි
වගාවක් දැකපු පට්ටන ගල පෙනුනයි

ඔන්න කෝට්ටේ මුහුදත් පසු කෙරුවා
ටික ටික සුළං වේගෙන් එහි අඩු කෙරුවා
දැන්නම් වෙලාවක් අග්ගිස් වී එනවා
යන්තම් එදා පොත්තන වැල්ලට ආවා

කැලෑ සතුන්ගෙන් නිතරම භයංකර
පොත්තන කැලේ නැවතී සිටිනවර
හරියට වෙලාවක් රෑ ජාමෙට විතර
දොළහට විතර දැක්කා සිරිකෝලු දුර

ඔන්න බොලේ දැන් දැන් අර පෙනෙන්නේ
පුලියන් දූවේ පහනයි කවුරුත් දන්නේ
ඊට දුරින් තුඩු මහතුන් පෙනෙන්නේ
කවුරුත් සැවොම සිරි සිරි ගා සිනහසුනේ

පින්නතුඩා තුඩු මඟ නම් දැන් ළඟමයි
පන්න කරන ඔරු එක දෙක ගොඩ යනවයි
දන්න කියන තොටුපල නම් සිතට සැපයි
ඔන්න ඉතින් දෙවියන් වැඳ ගොඩ බැස්සයි

කලපු සිව්පද

බොරුවක් නොවෙයි මකියන්නේ සදාලා
ඔරුවක් තිබෙයි මහ මුහුදේ කිඳිලා
පලුපත් දෙකක් ගෙන දැලෙන් සදාලා
පදිනට බැරිය සයුරේ දිය සිඳීලා[26]

බොරුවක් නොවෙයි මකියන්නේ මගේ තුඩින්
නවසියයක් කද ඇද බැඳ සතර වටින්
අවල හබල සතරක් ගෙන දැල වරින්
තනිව ඉඳම සයුරේ පදිනවා දුටින්[27]

දැකලා අපි සැවොම මීගමු කලපු වට
ඇදලා ගොසින් යන්තම් වැටුණිය ගොඩට
එකලා කඩේ වෙළඳම් ගන්න ගිය විට
සිටලා ගැහැණු දෙමළෙන් දෙඩුවයි අපට

හදපානේ නරකද මීගමු යන්ට
ඒ පානේ නරකද වෙළඳම් ගන්ට
බැරි රාළේ කරවල ගඳ උහුලන්ට
මතුකාලේ නොපතන් මීගමු යන්ට[28]

පහුරු කවි

ගමන් යන්ට නැකතින් පාරු බැඳගෙන
සමන් දෙවියන්ට සැම පඬුරු දී ගෙන
මෙවන් කළු ගගේ ගල් මුල් බලාගෙන
අපිත් යමුව සැම දෙවියන්ට වැඳගෙන[29]

සීරුව ඔබට කණු නොම සිටුවා මහත

---

[26] ඩබ්.බී. ප්‍රේමදාස - ඩබ්.බී.ගොඩනැගිල්ල -කෝට්ටගොඩ
[27] ඇම.ඇම්.අප්පුසිඤ්ඤෝ - නිල්වැල්ල - දික්වැල්ල
[28] කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ
[29] කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ

වාරුව ඇතුව දිය පිට තැනූ ගෙයක් ඇත
මාරුව තැනින් තැන බඩු ගෙන ගමන් යන
පාරුව වැනි ගෙයක් මේ මුළු ලොවේ නැත[30]

ඔයේ වතුර යන්නේ පරඬැල් එක්කා
ගඟේ වතුර යන්නේ කුඩ මසු එක්කා
මලේ සුවඳ යන්නේ බඹරුන් එක්කා
කියතොත් කියාපන් සීපද මා එක්කා[31]

නාරංගල කොත බැන්දා සනංගුයි
බදුලු නුවර දේවාලෙට ඉනංගුයි
පැදගෙන යන ඔරුව ගග මැද නලංගුයි
බින්තැන්නට සොරබොර වැව ඉනංගුයි[32]

පූරුවේ කරපු අකුසල් ගෙවෙන්නට
පාරුවේ ඇවිත් දුක් විඳිනව දැනට
මාරුවේ අවල අදිමින් විටින් විට
සීරුවේ බැසපි ගොස් තුන් මෝදරට[33]

හඳපානේ බඳපානේ ගමන් යමු
රෑ වුන තැනක අම්බලමක වාඩි ගමු
අට පනමක පැණි අරගෙන බෙදා කමු
යහලු අපට ඔරු පැදපං බුලත් දෙමු[34]

සස්සඳ සසද දිය මතුපිට තියේ මල
සසඳ සසඳ දිය පල්ලේ තියේ අල
වැස්සට පිණි බබා මෝරන කැකුළු මල
මස්ටකයින්ට මුතු කුඩයකි නෙළුම් මල[35]

---

30 රත්නවීර පටබැඳිලාගේ හෙන්ද්‍රික්

31 කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ

32 රත්නවීර පටබැඳිලාගේ හෙන්ද්‍රික්

33 ජී.එච්.ලීලසේන - බෙලිගහවත්ත - කෝට්ටගොඩ

34 කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ

වැල්ලේ සන්දේශය හෙවත් අන්ද්‍රිස් පුර වරුණේ

දහනව වැනි (19) සියවසේ මැද භාගයේදී පමණ ගන්දර කෝට්ටගොඩ විසූ **පී.එච්. දොන් අන්දිරිස්** නම් ජන කවියා සටහන් කොට තබන ලද **වැල්ලේ සන්දේශය හෙවත් අන්දිස් පුර වරුණේ** යන මුඛ පරම්පරාගත ජන කවි පෙළ ධීවර ජන කවියේ නිමි වළලු පුළුල් පරාසයක් කරා විහිදුවයි. පරම්පරික ධීවර වෘත්තීය ඇසුරෙන් බිහිවූවක් නොවේ **වැල්ලේ සන්දේශය.** වෙනත් අයුරකින් පවසතොත් මෙම ජන කවි පෙළ ධීවර වෘත්තිය ඇසුරෙන් බිහිවූවක් නොවේ.

එය සමුද්‍ර මාර්ගය ඔස්සේ භාණ්ඩ ප්‍රවාහණය කළ මුහුදු යාත්‍රික ජීවිතය ඇසුරෙන් බිහිවූවකි.එම යාන්ත්‍රික ජීවනය වූ කලී ධීවර සමාජය තුළ වූ අනු සමාජීය අංගයක් වේ. එම නිසා ඔවුන් ඇසුරෙන් බිහිවූ මෙම කවි ධීවර වෘත්තික සමාජය කළ බිහිවූ ඔවුන්ගේ අනන්‍යතාවයන් සටහන් කළ කවිසේ දැක්විය හැකිය.

අදාළ යුගයේදී රට තුළ භාණ්ඩ ප්‍රවාහනය සඳහා සමුද්‍ර මාර්ගය භාවිතා වූ අතර ඒ සඳහා විශාල යාත්‍රා විශේෂයක් යොදා ගත් බව අදාල යුගය පිළිබඳව වන ලිඛිත සාධක මගින් සනාථ වේ. ඒ අනුව දකුණු ප්‍රදේශයේ සිට **කොළඹටත්, කොළඹ** සිට දකුණු ප්‍රදේශයටත් භාණ්ඩ හුවමාරු වීමේ වාහකයෙකු සේ භාවිතා වූ මෙම විශාල ප්‍රමාණයේ රුවල් ඔරු විශේෂය මගින් ඉංග්‍රීසී පාලකයන්ගේ වාණිජ අවශ්‍යතාවයන් ඉටු කරවා ගත් බව පෙනේ.

වැල්ලේ සන්දේශය හෙවත් **අන්ද්‍රිස්පුර වරුණේ** නම් ලත් ජන කවි පංතිය මෙම ප්‍රවාහන අත්දැකීම ඇසුරෙන් බිහි වූවක් බව පෙනේ. ගන්දර සිට කොළඹ දක්වා යාත්‍රා කළ ගමනකදී කවියා ලත් අත්දැකීම් ඔහුගේ කවි ප්‍රතිභාවේ තරම ප්‍රකාශ වන අයුරෙන් පද බැඳීමට උත්සාහ ගෙන ඇති බව පෙනේ.

ධීවර ජනයාට දැඩිසේ ආදරය කළ **මාතර පැරණි මහ වීදියේ** බෙහෙත් ශාලාවක් පවත්වාගෙන ගිය සුප්‍රකට දොස්තර මහතෙකු වූ නැසීගිය **ජී. බාලසූරිය** නම් වූ කලාකාමී වෛද්‍යවරයාගේ සටහන් අතර තිබී මෙම අත් පිටපතකින් මෙය ලබා ගෙන ඇත. එතුමා ඉදිරියේ මෙම කවිපෙළ ගායනා කර ඇත්තේ **කෝට්ටගොඩ සුදුවැල්ලේ හින්නගල් මුල්ලවත්තේ** පදිංචිව සිටි **ඇම්. ඇම්. බබාසිංඤ්ඤෝ** නැමැති ධීවර වෘත්තිකයා විසිනි.

කවි 83 කින් සමන්විත **වැල්ලේ සන්දේශයේ** 1 වැනි කවියේ සිට 13 වැනි කවිය දක්වා මාතර වෙරළ කලාපයේ ගම් ගැන වර්ණනා කර ඇත.

කවියා සඳහන් කරන අන්දමට (2 වැනි කවිය) ඔවුන් **ගන්දරින්** පිටත් වී ඇත්තේ උදුවප් මාසේ ගුරු දිනක මුව සිරස නැකතිනි. ගන්දරින් පිටත් වී අතරමග කිහිප පලක නතර වී දවස් විසි නවයකට පසු මෙම පිරිස කොළඹට ළඟා වී ඇත. කාලීන තොරතුරු රැගත් මෙම කවි පෙළේ කවි කිහිපයකි මේ.

1) යුධ කාලේ රාම විස්නුගේ අනුහසි නේ
වැද ලොලේ දොහොත් මුදුනේ තබාගෙ නේ
තෙද බලේ සියලු දෙවියන්ගේ වරම් නේ
පද කලේ මෙපද **අන්ද්‍රිස් පුර වරු** **නේ**

2) වෙන්කර කියා සදෙනට මෙබස් දී ගනේ
පෙම්බරියෙන් නැකත තෝරා බලා ගනේ

---

[35] කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ

උදුවප් මස නැකැත මුවසිරි සෙට යෙදු නේ
ගන්දර පුරෙනි ගුරුදින අපි පිටත් වුනේ

3) මීරා පකුල තෝරා පැදගෙන ඔරුව
වාරා නැතුව යන ගමනකි බොරු නැතුව
මෝරා සුලන් එන්නා දැනට එකතුව
තෝරා දුව පන්න ඇත **ගන්දර** **තුඩුව**

4) නෑර එන සුළඟ එකතුව ඇත කිව්ව
සාර වන සුළං උතුරට එක දෙව්ව
බාර වෙන පඬුරු එකතුව ඇත කිව්ව
තෝරා දුව පන්න ඇත **ඇහිරා** **තුඩුව**

5) පෙනී දුවන කළ තුඩු මග එක එල්ලේ
වැනී සුළඟ ඇතරුව දැවටිල්ලේ
ගනිමින් මුනිඳු ගැන සැම දෙන අපි ගොල්ලේ
පෙනී මුදලුත් ඇත **කිරලා** **වැල්ලේ**

6) පරසිඳු යසස් මැති සඳ දෙවියන් නුවරේ
මෙගම දනෝ පුදදෙති හැම නිරන්තරේ
රූ පෙනෙනා තුඩුව දියඹට ඇත මිතුරේ
රැලෙන නුදුටුවත් පතුලත් ඇත මිතුරේ

7) අපි ඉල්ලා සිටිමු සොඳ සුළඟ දිවි මට
මෙර සොල්ලා සිටින්නම් තෙද හැම තැනට
දැන ගල්ලා තෙද අනුහස් ඇත අපට
වැද ගල්ලා සැම දෙන විෂ්ණු දෙවිඳුට

8) පුදා මල් පහන් බණ අසා හැම වර
මුදා සියලු දෙය දුරින් දුරු කර
එදා විෂ්ණූ දෙවිඳුට අපි කමා කර

	උදෑ සන ගියේ **දෙවිනුවර** පසු	කර
9)	මුලා නැතුව බලා ඉර පායන	තානේ
	වලා සදිසි පුන්සඳ මෙන් එම	ගානේ
	වලා සත් දෙවිඳු එළිකර හඳ	පානේ
	බලා දුවපන්න අන්දම	තඹානේ[36]
10)	දැඩි මාරේ එන සැර සුළං විගසි	නේ
	මඩින සැරේ සැරවිය මුහුද තැන	තැනේ
	වැඩිව සැරේ තිබුනත් සුළඟ අද	දිනේ
	මුඩු මොහොරේ ඇත දුව පන්න දිය	ඕනේ
11)	පෙර ඉල්ලා බුදු බව පැතු මුනි	වර
	ඉඳගල්ලා ඔරුව පිට මුනිඳු සිහි	කර
	මෙරසොල්ලා හරින පින් බලය වැඩි	කර
	වැඳ ගල්ලා ඔන්න **ගොඩකන්දේ**	**වෙහෙර**
12)	පිනට ජාති ලැබුනත් පින්කර	සත්ත
	දැනට නොයෙක් යහපත් කම එක	සත්ත
	හැඩට මහතුන්ගේ නොගියොත් එක	සත්ත
	දැනට පෙනෙනවා මිතුරනි පොල්	වත්ත
13)	නරන් සැමට පිහිට උනු අපෙ මුනිඳු	බලේ
	සුළං සැර උනොත් ගමනට පිහිට	බලේ
	සමන් දෙවිඳු බලයෙන් යන ගමන	ජලේ
	බලන් මිතුර හැඩ **ගොයියා පාන**	**ගලේ**

ගොයියාපාන යනු මාතරත් ගාල්ලත් වෙන් කෙරෙන පලාත් සීමාවයි. මහ සයුරට සීමා මායිම් නොමැති වුවද **වැල්ලේ සන්දේශයේ** 14 වැනි කවියේ සිට ගාල්ල ප්‍රදේශයට අයත් ගම්මානත් ඉන්පසු පිළිවෙලින් කොළඹ දක්වා ප්‍රධාන ගම්මාන වර්ණනා කෙරෙයි.

ගොයියාපානෙන් පසු පිළිවෙලින් කටුකුරුන්ද, මිහිරිපැන්න, හබරාදුව, දළ වැල්ල හා උණවටුනට පසු ගාල්ලට මෙම පිරිස පිවිසේ. ගාලු පුරවරය කවි හයකින් වර්ණනා කරන අතර පසු

---

[36] තඹාන - මාතර උග්ගල්බැවුල (බුවුන්ස් හීල්) කඳු මුදුන. මෙය ධීවරයන්ගේ වල් කෙළකි.

දින උදේ කලුවැල්ල, ගින්තොට, රජ්ජිම, කින්තන්ගොඩ, සීනිගම උපත, තෙල්වත්ත, අකුරළ තුඩුව, මාදම්පේ, අම්බලන්ගොඩ, රන්දොඹේ, බලපිටි මෝදර, හරිස් පොල, කොස්ගොඩ, ඉඳුරුව, බෙන්තොට, කළුවා මෝදර, මාගල් කන්ද, මග්ගම (මග්ගොන), පයියාගල, කුලමුල්ල, කලුතොට (කළුතර), වස්කඩුව, පොතුපිටිය, පානදුර, මොරටුව, ගල්කිස්ස, කොල්ලුපිටිය, දෙහිවල පසුකර කොළඹට ළඟා වී ඇත.

ධීවර කර්මාන්තය පිළිබඳව අත්දැකීමක් ඇතුලත් නුවූවද දින 29 ක් තිස්සේ දීර්ඝ මුහුදු ගමනක, කටුක මෙන්ම රසබර අත්දැකීම් ඇසුරෙන් රචිත **වැල්ලේ සන්දේශයේ** ගැමි ධීවර ජන කවියකුගේ කදිම පබැඳුමකි. කාලීන තොරතුරු සහිත නගර හා ග්‍රාම පිළිබඳවද අව්‍යාජ තොරතුරු රැගත් මෙම කවිපෙළ අගය කළ හැක්කේ අව්‍යාජ ගැමි ජන කවියෙකුගේ පබැඳුමක් බැවිනි.

III

ජන විශ්වාස සහ ඇදහිලි

අවිනිශ්චිත ජීවිතයක් දෝතින් තුරුළු කොටගත් ධීවරයා මුහුදත් එහි ක්‍රියාකාරිත්වයට බලපෑම් එල්ල කරන බාහිර බලවේග පිළිබඳවත් දැඩි අවධානයක් යොමු කරයි. මුහුදේ ක්‍රියාකාරීත්වයට බලපෑමක් කිරීමට සමත් වන ස්වාභාවික බලවේගයන් කවරෙක්දැයි ඔහු හොඳින් දනී. එය පරම්පරාගත සමාජ විඤ්ඤාණය විසින් ඔහුට හිමිකර දුන්නකි.

රුවල් ඔරුවෙන් මුහුදු යන ධීවරයා සුළඟ කෙරෙහි දැක්වූයේ දැඩි අවධානයකි. සුළඟේ ක්‍රියාකාරීත්වය තමාගේ අරමුණ කෙරෙහි සෘජු ලෙස බලපාන බැවින් ඔහු සුළඟේ ක්‍රියාකාරීත්වයට බලපාන සියලුම ස්වාභාවික තත්වයන් පිළිබඳව අවධානය යොමු කරයි.

පුවාරු (වළාකුළු) හි පෙළ ගැස්ම ධීවරයාගේ මුහුදු ගමන තීරණය කරන ප්‍රධාන සාධකයකි. **පුවාරුවල** පෙළගැසීමට අනුව ඉදිරි මොහොතකදී මුහුදේ ක්‍රියාකාරීත්වය වෙනස් විය හැකි බව ඔහු දනියි. අඳුරු පැහැයෙන් යුක්තව කැරළි ගසන එවැනි වළාවන් විසින් ඇති කරනු ලබන වැසි සුළං සහිත කාළගුණය තමාගේ මුහුදු ගමනට අවහිරයක් වේදැයි නොවේ දැයි යන්න ඔහුගේ අවධානයට යොමු වෙයි. ඒ අනුව මුහුදු ගමන තීරණය කරයි.

පුවාරු එක් දිශාවකට (විශේෂයෙන් මුහුද දෙසට) වේගයෙන් ගමන් කිරීම කුණාටුවක පෙර නිමිත්තක් බව ඔහු විශ්වාස කරයි. මෙසේ මුහුද දෙසට රොක් වන අඳුරු වළාවන් විසින් කොයි මොහොතේ හෝ කුණාටුවක් ඇති කළ හැකි හෙයින් ඔහු මුහුදු යාමෙන් වැලකී සිටියි.

අහසේ මුදුන් වන තරු පොකුරු අනුවද ධීවරයා කුණාටු පිළිබඳව යම් යම් ඉඟි සපයා ගනී. ඒ අනුව විශේෂිතවූ හැඩතල අනුව තරු පොකුරු එකතු වීම පිළිබඳව ඔහු දැඩි ලෙස අවධානය යොමු කරයි.

වැල්ලේ දෙපා එරීම අසාමාන්‍ය ලෙසින් සිදු වන්නේ නම් මුහුදු රල ප්‍රචණ්ඩව පවතින බවට විශ්වාසයක් ධීවර සමාජය තුළ පවති. ඒ අනුව ඈත දියඹට යෑම පිළිබඳව යළි සිතා බැලීමට පෙළඹෙති. වැල්ලේ දෙපා එරීම ගැන ධීවරයන් පවසන්නේ **මුහුද අද හරි හයියයි** යනුවෙනි.

මුහුදේ සිට ගොඩබිම දිසාවට අසාමාන්‍ය අන්දමින් **වැහිළිහිණියන්** පියාඹා එයි නම් දියඹ මුහුදේ කුණාටුවක් හෝ තද සුළඟක් පවතින බවට ඉඟියක් ලෙස විශ්වාස කරති.

වාරකන් කාලය පවතිද්දී මුහුදට ඉහළ අහසේ **හත් දින්නත්** තරු පොකුරු නමින් හැඳින්වෙන තරු අහුර පායා ඒම **වලාල** කාලය හෙවත් මුහුදු මෘදු වීමේ කාලය උදා වීමේ සංඥාවක් බව ධීවරයා තුළ විශ්වාසයක් පවති. ඒ අනුව ඔවුහු මුහුදු ගමනට අවශ්‍ය ආම්පන්න සකස් කොට ඊට සුදානම් වෙති.

මුහුදට ඉහලින් **කොට දුන්නක්** (දේදුන්නක්) පෑයීමද අශුභ ලකුණකි. **කොට දුන්න** හදිසි මාරුතයක් සහිත වැසි පිළිබඳ ඉඟියක් සේ සලකති. එනිසා කොට දේදුන්න දුටු විට ඒ පිළිබඳව දෙවරක් සිතා බැලීමට ධීවරයා පෙළෙඹෙයි.

මුහුද දිය දැඟලීමට පටන් ගැනීම හෙවත් බුබුළු නැගීමද කුණාටුවක පෙර නිමිත්තකි. කොයි මොහොතක හෝ මුහුදේ ස්වාභාවය දරුණු විය හැකි බවට ඉඟියක් එහි ගැබ්ව ඇති බව දන්න ධීවරයා හැකි ඉක්මනින් ගොඩබිම කරා යාත්‍රා කරයි.

ස්ත්‍රිය පිළිබඳව ධීවර සමාජය තුළ ඇත්තේ යහපත් ආකල්පයක් නොවේ. ඔවුන් තමාගේ ඔරු පන්න හා දැල් පන්න උඩින් පැන යාම අශුභ සිදුවීමක් බවට අදහන බව පෙනේ.

දරුවන් නොවැදූ ස්ත්‍රිය මුහුදු යාමට සූදානම් වූ ධීවරයෙකුගේ ඉදිරිමගට මුණ ගැසීම අශුභ නිමිත්තක් බවත් තමාගේ වෘත්තියට ඉන් සිදුවන්නේ අගතියක් බවත් ඔවුහු විශ්වාස කළහ. වෙරළබඩ ධීවරයන් වැඩිපුර ප්‍රාර්ථනා කරන්නේ පිරිමි දරුවන්ය. පාරම්පරික වෘත්තිය රැගෙන යා හැක්කේ පිරිමි දරුවාට පමණක් වීම එයට හේතුව බව පෙනේ. එහෙත් අද වන විට සංකීර්ණ වූ ධීවර සමාජය තුළ මෙවැනි ආකල්ප දක්නා ලැබෙන්නේ ඉතාමත් සුළු වශයෙන් බව සැලකිය යුතුවේ.

ධීවරයා තමාගේ රැකියාවේ දියුණුව සඳහා මෙන්ම මුහුදේ දී මුහුණ දෙන අනතුරක් වැනි අවස්ථාවක දී හෝ කතරගම දෙවියන්ගේ පිහිටාරක්ෂාව පතයි. අනතුරුව ඔහු පොරොන්දු වූ පරිදි එම භාරයන් නිදහස් කිරීමට විශාල උනන්දුවක් දක්වයි. ඊට හේතු වන්නේ දෙවියන්ගේ බැල්ම සහ පිහිට තමාගේ ජීවිතය සඳහා මහත් උපකාරයක් වේය යන සිතුවිල්ල ඔහු සමඟ තිබීමයි.

අතීතයේදී දකුණේ විසූ ධිවරයා තමාගේ වෘත්තීය සරුනුවූ හෙවත් මුහුදේ මසුන් හීන වී යයි ඔහු තීරණය කරනු ලැබූ කාලවලදී යම් යම් යාතු කර්ම විධීන් හා පිහිට පැතූ බව දැනගන්නට ලැබුණි. එය වැල්ලේ නැටූ යාතු කර්ම විධියක් වූ **ගරා යක්** නැටුම නමින් හැඳින්විණි.

මෙම **ගරා යක්කම** ගන්දර හා දෙවුන්දර විසූ සම්ප්‍රදායික ධීවර ක්‍රම අනුගමනය කරමින් රැකියාව කළ ධීවරයාගේ දැඩි ආස්වාදයට නතුව තිබූ බව ඒ පිළිබඳව පළවූ අදහස් වලින් පැහැදිලි විය.

මෙම **ගරා යක්කම** නිසි පරිදි නැටීමෙන් තම වෘත්තීය කෙරෙහි බලපෑ සියලු අයහපත් දෑ දුරීභූතවී සරු දිවි පැවැත්මකට අවශ්‍ය කරනු ලබන යහපත් ආදායම් මාර්ගය පෑදෙන බවට ඔවුන් තුළ විශ්වාසයක් විය.

පුද සිරිත්

දියඹ සරණ ධීවරයා කාගේ හෝ පිහිටාධාරය පැතීම ස්වාභාවිකය. මුහුදේ රළ වේගයෙන් කැළඹෙන ප්‍රාණය රැක ගැනීම පිණිස ඔහු මෙබඳු අධි භෞතික විශ්වාසයක් කෙරෙහි අවධානය යොමු කිරීම පුදුම විය යුතු නැත. වසරකට වරක් මුහුද අරක්ගත් සියළුම දේවතාවරුන් සහ යක්ෂයන් උදෙසා දානයක් දෙනු ලැබේ. **කළුවැදි අඳුන** සහ **කළු වැදි පූජාව** මේ අතර විශේෂ වේ. ගම්මඩු පැවැත්වීම, පොල්පිටි පැවැත්වීම, ධීවර තොටුපලවල් ආශ්‍රිතව තොවිල් පවිල් භාරහාර සිදු කිරීම විශේෂයෙන් ම දෙවිනුවර, ගන්දර, කෝට්ටගොඩ ආදී වෙරළ බඩ ජනතාවගේ සිරිතකි. තොටුපලවල දෙන දානයේදී ප්‍රදේශයෙන් ප්‍රදේශයට අනන්‍ය වූ විශේෂ ලක්ෂණ තිබේ.

බෞද්ධ ධීවරයන් කිරි ඉතිරවීම,කෙසෙල් ගෙඩි හා අනෙකුත් පළතුරු මෙන්ම කැවිලි වර්ග ද උපයෝගී කොටගෙන ආරක්ෂාව සහ මාළු බහුලව අල්ලා ගැනීමට හැකි වේ යන ප්‍රාර්ථනය මුදුන්පත් කර ගෙන විශේෂ පූජාවන් පවත්වනු ලැබේ. විශේෂයෙන් අලුත් ඔරුවක් දියට දැමීමේදී මේ සිරිත් අනිවාර්‍යයෙන්ම සිදු කිරීම සහ ඔරුවට සහ සූර්යාට ද මුහුදට ද නමස්කාර කිරීම ධීවරයාගේ සිරිතය.

ගම්මඩු පූජා මෙන්ම තොවිල් පවිල් ආදියද මේ සඳහා සිදු කරන ලද බව ඒවාට නිර්මිත කවි වර්ග කිරීමෙන් පැහැදිලි වේ. **ඔරුවේ තොවිලය** ඊට දෙස් දෙන නිදසුනකි. සියළුම දෙවිවරුන් මෙන්ම යක්ෂයන්ද මෙහිදී සිහිපත් කරනු දක්නට ලැබේ. රුවල, ඔරුව ආදිය ආරක්ෂා කිරීම සහ එකී ගමන් කරන පුද්ගලයන් ආරක්ෂා කිරීමද මෙබඳු තොවිලයන්හි අභිප්‍රාය වී ඇත.

රන් කොඩිය බලලා
වට කර වියන ඇදලා
කවි සින්දු අසලා
වරෙන් රුවලේ දේවතාවා

සත් මුහුදු සතතිනේ
නර ලොවට බැස සැනෙතිනේ
සදා නැව් මෙලෙසිනේ
එන්ඩ අවසර ලැබුනේ

පත්තිනි දෙවියන් ළඟට
වරම් ඉල්ලූ හනිකට
දුන්නයි වරම් විගසට
ආවෙ ගොඩබැස මෙරටට

රුවල් නැව් සතකින්
මෙවන් රෝගය හැරයන්
වරම් දී රකිමින්
රුවල් යකු මෙලෙඩ හරිමින්

රන් නැවේ වැඩසිට
බැන්දැයි රුවල විගසට
නර ලොවට බැසසිට
එන්ඩ නික්මුණි සිංහ පුරයට

තේවාවට රන් ඊයක් ගන්නේ
නව කොළ අතු මිටි ඉල්ලා ගන්නේ
මානෙල් සපු දුනුකේ මල් ගන්නේ
රන් ඊයේ බණ්ඩාර වඩින්නේ

කිරි අම්මාවරු සත් බිසවුන්ගේ
හෙල් හත තැදු හත දිවැස් බලන්නේ
නර ලොව නරයින් මරමු කියන්නේ
අමරාපති රන් රුවලට එන්නේ

මල් පෙට්ටිය ගෙන සුවඳ බලන්නේ
සෙනඟත් පිරිවර සිටිති කියන්නේ
රන් රුවලේ මල් පෙට්ටි බලන්නේ
වාහල එළියට දිවැස් හෙලන්නේ

ඉරුගල ඔරුගල දිවැස් බලන්නේ
රන් මුදු පාමුල දිවැස් බලන්නේ
රන් රුවලේ කිරි අම්මා එන්නේ
ගොල්ල සමඟ කිරි අම්මා එන්නේ

එල්ල තිබෙන මල් පෙට්ටි බලන්නේ
ඊයේ කෙළීනා රුව බලමින්නේ
රුවල් යකුනි රන් ඊය කෙළින්නේ
අතු මිටි අල්ලා බිත කරන්නේ

බොල් ලෑලී තල් ලැලී ඉරලි තියන්නේ
නාමල් සපු මල් වටේ බඳින්නේ
මැණික් රුවල් බණ්ඩාර වඩින්නේ
තල් ලෑලී බොල් ලැලි ඉරති කියන්නේ

ලැලී ඉරවා සඳති කියන්නේ
රන් රුවලුත් වට අදිති කියන්නේ
රන් රුවලේ බණ්ඩාර වඩින්නේ
රන් රුවලේ තේවා කරපන්නේ

අටවා රුවලක් වියන් වසන්නේ
රන් දළුමුර නැවට වඩින්නේ
අමා හෙට්ටි රන් මාල වඩින්නේ
රුවල් එකිරි අම්මාවරු එන්නේ

නැව් හම්බන් එන කලට මෙසේයා
වනසන් මෙරට එන සෙනගේයා
දිවැස් බලා එහි මල් සුවඳේයා
රුවල් යක්කු මල් මඩුවට වැඩියා

සත් මුහුදේ රන් රුවල් පදින්නේ

ලේ වග ලේ පොකුණටයි වඩින්නේ
නැව් හත විල් හත දිවැස් බලන්නේ
බූත රුවල් බණ්ඩාර වඩින්නේ

ගණ්ඩ සුවඳ මල් දිවැස් බලාලා
එන්ඩ පැදපු ලණු රුවල් මුදලා
දෙන්ඩ මලුත් බුලතෙන් සරසාලා
රුවල් යක්කු වෙස් බැඳ නටවාලා

නැව් සිය පිරිවර කැටුව වඩින්නේ
සළු ගෙන කුඩ පිට වාඩි කරන්නේ
රත් ගල් මුතු ගල් වට එල්ලන්නේ
එතී රුවල් බණ්ඩාර වඩින්නේ

වටකර රුවලේ දිවැස් බලන්නේ
රතු පට පිළියෙන් සරසා ගන්නේ
බීතය මල්මාදය කරවන්නේ
වට වියනේ බණ්ඩාර වඩින්නේ

විලට වඩින යකු සමඟ සෑදිලා
ගනිව් උරාලේ බොටයි කියාලා
අණසක පාමින් වරම් ලබාලා
කයිය වරාවේ වැදී බැස අසාලා

රුවල් සදා සම්බාන සිටින්නේ
කෙවුල් තුඩේ රතු කොඩිය බඳින්නේ
අවුල් ලෙසට ලණු ඇදලා බඳින්නේ
රුවල් නැවේ මස් මඩිය පීරෙන්නේ

රතු සුදු පිළියෙන් වියන් බඳින්නේ
රන් රුවලේ ලණු වටේ අඳින්නේ

රිදී ද රත් රන් දිවැස් බලන්නේ

රුවල් එකිරි අම්මාවරු එන්නේ[37]

පාරම්පරික ධීවරයන් ස්වකීය වෘත්තියේ සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් මෙබඳු යාග බලි තොවිල් පැවැත්වීම තවමත් මෙම පළාතේ කලාතුරෙකින් හෝ සිදුවේ. ඔරුවේ තොවිලයේදී කෙසෙල් කඳන්වලින් ඔරුවක් සාදනු ලැබේ. එය **ලේ ඔරුව** නමින් හැඳින්වේ. හුණු සහ සඳුන් ලෙයට ගනී. මෙම කවි වලදී ඔරුව යන නාමය වෙනුවට නැව යන්න යොදා ඇත. ප්‍රදේශයේ දක්ෂ යකැදුරන් (කට්ටඩිරාළ) ගෙන්වා ගෙන මෙකී තොවිල් කටයුතු සිදු කරනු ලබයි.

මන්ත්‍ර ගුරුකම්

මස් වලට, තොටුපල වලට සහ මුහුදට අරක් ගත් යක්ෂයන්ට කඩවරයින්ට සහ දෙවි දේවතාවුන්ට මුහුදු යන්නන් භාර හාර වීම විශේෂ සිරිතකි. දෙවිනුවර ප්‍රදේශයේ මුහුදු යන්නන් කළුවැදි දේවතාවා නිමිති කර ගෙන සකස් කරන ලද අඳුණක්ද ඇත. එම අඳුන බලා මසුන් ගැවසෙන ඉසව් දැන ගත හැකි බව පැරණි ධීවරයෝ පවසති.

මුහුදේදී මසුන් දැලට හිර කිරීම සඳහා **කළුවැදි දේවතා මන්ත්‍රය** උපයෝගී කර ගනී.

'ඕං .... නමෝ කකුසඳ කෝනාගම

කාශ්‍යප ගෞතම යන පසේ

බුදුවරුන් සතර දෙනා

ස්නානය කරන ගංගාවයි මේ

අද මම හිර කරන්නේ

ඕං....ඕං.....ශ්‍රීං.....වේ ගංගාවේ

සිටින කුඩ මැස්සන් හිරයි

ඒසවාහඃ![38]

මෙම මන්ත්‍රයෙන් අතට මතුරා මාදැල කොටු කළාට පසුව මුහුද දෙසට අත්ල දිග හරිනු ලැබේ. දැල මැදට වී හඬ නොනැගෙන සේ මෙයින් සත් වරක් මතුරනු ලැබේ. එසේ වූ විට දැල් මඩියෙන් මසුන් පිට නොයන බව පැරණි ධීවරයා තවමත් විශ්වාස කරයි.

එසේම රහස්‍ය සහගතව සමහරු දැලට හසුවන මසුන් දැල පුපුරා පිටවී යාමට හෝ මා දැලට මසුන් හසු නොවීම සඳහා ද විශේෂ මන්ත්‍ර භාවිතා කරන බව දැන ගන්නට ලැබිණ. එහෙත් එවැනි මන්ත්‍ර අපට සොයා ගත නොහැකි විය. මසුන් හසු නොවීම සඳහා මතුරන මන්ත්‍ර නිසා එම දැල් වටයට **ගෙම්බෝ, කේප්පියෝ, තෙප්පිලි** වැනි කිසිදු වටිනාකමක් නැති මසුන් හසුවන බවද පැවසේ.

කළුවැදි පූජාව

මස් වලට අධිපති **කළුවැදි දේවතාවා** උදෙසා වසරකට වරක් මස් වග පහක්, මල් වර්ග පහක් සහිත තටුවක් සාදා ඔරුවේ තබා එම තටුව වටේට සහ ඔරුව වටේට දුම්මල දුම් අල්ලා පූජාව

[37] කොඩිප්පිලි පටබැඳිගේ ප්‍රැන්සිස්

[38] කොඩිප්පිලි පටබැඳිගේ ප්‍රැන්සිස්

පවත්වනු ලැබේ. මේ සඳහා උපයෝගි කර ගන්නා දුම්මලද ජීවම් කිරීමෙන් අනතුරුව ලබා ගත යුතුය. යාම තුනක් දුම්මල ජීවම් කිරීම සිරිතය. ඉන් අනතුරුව ඔරුවට දෙහි කැපීම ද දැලට දෙහි කැපීමද සිදු කිරීමෙන් අනතුරුව, තෙවැනිව මුහුදට දෙහි කැපීමද සිදුකෙරේ.

මනිමේඛලාව උදෙසා සෑම වසරකම කිරිබත් සහ අළු පුහුල් සහිත දානය සැප්තැම්බර් මාසයේ දෙනු ලැබේ. මෙහිදී කතරගම දෙවියන් සිහිපත් නොකරන බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. කිසිවිටක කිසිම ධීවරයකු මුහුදේ අතරමං වීමට මන්තර ගුරුකම් නොකිරීම උතුම් මානව ගුණයකි.

කෙම් ක්‍රම

දින දෙක තුනක් මුහුදු ගොස් සරු මාලු අස්වැන්නක් නොලැබුන විට පැරණි ධීවරයා අපූරු කෙම් ක්‍රම අනුගමනය කර ඇත. ඇඹුලෙන් හා මුත්‍රාවලින් කහ අඹරා ඔරු කඳේ මුල සිට අග දක්වා ගානු ලැබේ. මාළු අහු නොවන්නට යම් කිසිවකුට පලි ගැසීමක් කරන්නේ නම් දෙහි ඇඹුලෙන් හා මුත්‍රා වලින් අඹරන ලද කහ වතුර අග සිට මුල දක්වා ගානු ලැබේ.

කිසියම් තරහකාරයකු විසින් තමන්ගේ ඔරුව හිරකර ඇත්නම් ඒ සඳහා ඇදුරෙකු ගෙන්වා දෙහි කපා එය ඉවත් කරනු ලැබේ.

එසේම මීට අමතරව සිදු කරන තවත් කෙම් ක්‍රම පවතී. සස්සැඳ කොළ තම්බා තැඹිලි වතුර, කහ වතුරෙහි ඔරුව නහවා සියළු **දැල් පන්න** සෝදා පිරිසිදු කොට ඒ මොහොතේම මතුරණ ලද තැඹිලි ගෙඩියේ තැඹිලි වතුර ස්වල්පයක්ද දැල් හණවලට සහ ඔරුවලට ඉසිනු ලැබේ. මුහදේදී එම තැඹිලි වතුරෙන් මුහුණ සෝදා ඔරුවේ යන අනෙක් පිරිසටද තැඹිලි වතුර මුහුණට ඉසීම වෘත්තීය සශ්‍රීකත්වය අපේක්ෂා කරමින් සිදු කරන සත් චාරිත්‍රයකි.

නිමිති

සංඥාව නිමිත්ත වශයෙන් සලකනු ලැබේ. ඔරුව දියට දැමීමට ප්‍රථම ඔරුව සහ මුහුද අතරින් කිසිවකු ගමන් කළ විට ඔරුව දියට දැමීම නවතනු ලැබේ. එය දුර්විපාක නිමිත්තක් සේ සකලන බැවිනි.

අහසේ ස්වරූපය සහ මුහුදේ ස්වරූපය දැන ගැනීමද නිමිති කාරකයක් වශයෙන් හැදින්වේ. මුහුදේ **බොරකැටියක්** ඇති විට මුහුදේ පෙණ දමන නිමිත්තක් ඇති විට එය අසුබය. එනම් **දිය වැලක** නිමිත්තක් වන නිසාය.

ගොඩබිම දෙසින් අහස ගෙරවීම මසුන් බහුල බව හැගෙන නිමිත්තකි. මුහුද දෙසින් අහස ගොරවන්නේ නම් මසුන් හිඟ බවේ සලකුණකි. ඉර හඳ මෙන්ම තරු ලකුණුද ගොඩබිම දැන ගැනීමේ නිමිති වශයෙන් පැරණි ධීවරයා විශ්වාස කළේය.

රත්බොල් දියාත සලකුණු වීම මසුන් බහුල වීම දක්වන නිමිත්තකි.

ලිහිණි ගැවසීමේ නිමිත්තද මසුන් බහුල බව හැඟවීමය. තරු ලකුණු නිමිති පිළිබඳව ඒ ඒ ලකුණ අනුව විවිධ වෙනස්කම් පවතී.

09

ධීවර ජනකවි

ධීවරයා මුහුද ජීවිතය කරගත් මිනිසෙකි. මුහුදේ රළු බව හෝ ජීවන ක්‍රමයේ ඇති අවිනිශ්චිතභාවය හෝ පිළිබඳව සිත සිතා ලත වෙවී සිටීමට ඔහු සූදානම් නැත. ඒ නිසා ඔහුට එම බියකරු අභියෝගය අමතක කර දැමීම අභියෝගයක්ම විය. එම අභියෝගය ජය ගැනීම සඳහා කවිය තුළ ඇති සුගායනමය රිද්මය ඔහුට උපකාරී විය.

කවිය යනු භාෂණමය ප්‍රායෝගික ප්‍රකාශනයකි. භාෂණය යනු හුදකලාව මග හරවා ගත හැකි ප්‍රායෝගික ක්‍රියාකාරකමකි. මුහුදේ තනි වන ධීවරයාගේ හුදකලාව නැති කර ගැනීමේ මාර්ගයක් සේ බිහිවූ ධීවර කවිය පසුව බොහෝ හේතු සාධක මත ක්‍රමික විකාශනයකට භාජනය වූ බව පෙනේ.

මුල් යුගයේ ධිවර යාත්‍රාව ජලය මත පාවී යා හැකි යාත්‍රාවක් විනා මුහුදේ රුදුරු බව ජය ගැනීමේ තත්වයේ වූවක් නොවීය. එහි ගමන දුෂ්කරය. බියකරුය. රාත්‍රියේ සුළඟේ ආධාරයෙන් දියඹට ඇදෙන ඔරුව තුළ ගමන් කරන්නේ දෙදෙනෙකු හෝ තිදෙනෙකි. සුළඟට හසුව යාත්‍රාව තමාට අවශ්‍ය කරන දුරකට ඇදී යනතුරු ඔව්හු යාත්‍රාව මත අපහසු ඉරියව්වකින් ඉඳ සිටිති. මේ අවස්ථාවේදී පිරිසේ අය නිදිකිරා වැටීමට ඉඩ ඇත. ඒ පිළිබඳව අවධියෙන් සිටීමේ වගකීම ඇත්තේ යාත්‍රාවේ නායකයාටය. නොහොත් **මරක්කලාහේ**ටය.

ඔහු තම පිරිස නිදි දෙව්දුවගේ ග්‍රහණයෙන් මුදවා ගැනීමට කුමන හෝ ක්‍රියාකාරකමක නිරත යුතුවිය. ඒ සඳහා ඔහුට උපකාරී වූයේ කවියයි. සෑම **මරක්කලාහේම** කෙනෙකුම හොඳ කවිකාරයෙක් වූ බව පැරණි ධිවරයෝ පවසති.

ඉඳිවර කවි

හම්බන්තොටින් ඇදලා රුවල	විගසින්නේ
නියැඳ කුපත කොල්ලෑවට	තබාගෙනේ
වලවේ මෝදර ද ඉබ්බාගල	නොපෙනේ
වටගල බලා දුවපන්න	දියඹිනේ
වාරයා වාරකන්මයි	බහින්නේ
හරහයා හතුරු කන්මයි	කරන්නේ
මාරියා ගෙඩිය පස්සෙන්	හඹන්නේ
ලිහිණියා කඩුල්ලෙන් තංගලු	යන්නේ
දුවනවා මිතුරෙ මෙපමන මේ	සෙව්වේ
සොයනවා සොදට විපරම්	කෙරෙව්වේ
දැනෙනවා පමණ යන්තම් ඔය	තැනුවේ
පෙනෙනවා ඔන්න රුව නිල්වැලි	තුඩුවේ[39]

[39] එල්.වයි.ඩැනී - කෙමගොඩ -දික්වැල්ල

බලේ මොටද අඟවාලා කියන්නේ
ජලේ ගැඹුර නොදැනද ජලයට පැන්නේ
මලේ සුවඳ දස අත විහිදු වන්නේ
ගලේ මොටද ඉනි අහුලා බලන්නේ

අපිත් දුවමු මහ රුවලට උඩ ඇදලා
ගන්දර නොපෙනී යන කල පපුව උණුවෙලා
වල්දු ගලත් එනවලු අප කිට්ටු වෙලා
දෙබෑගලට කිට්ටුද සකි පස්ස ගලා

ඔන්න බලාපන් ඉර පායන තානේ
තලා දිදී එන සුළඟකි කළ ගානේ
වළාහක දෙවිඳු හෙළි කළ සඳපානේ
බලා දුවපන්න අන්දම තඹානේ

ගොඩින් වලස්සුත් ඇත ගල් ගෙවල් වල
ගොඩින් සොඳ වතුර ඇත වැව් පොකුණු වල
වටින් කුපත් ඇත එහි වරාගල
මැදින් සොඳ වරායේ අරගන් රුවල[40]

මුහුදේ දුක

කතරගම දෙවිඳු කන්දස් ස්වාමිනේ
අතරමංවෙලා අප විදින දුක් අනේ
නිතර සිහි කරමි ඔබගේ ගුණ වරුනේ
අපට පිහිට වනු කන්දස් ස්වාමිනේ

කතරගම දෙවිඳු කන්දස් ස්වාමිනේ
ඔරුව හබල රත්තරනෙන් හදාගෙනේ
ඇත් කුඹ පරුවත රිදියෙන් හදාගෙනේ
ඇහැළ මසට එනවා හිස තබාගෙනේ

[40] දැඩිගම විතාරණගේ මාටින් සිඤ්ඤෝ

කතරගම දෙවිඳු කන්දස් සුවාමිනේ
ඔරුව රුවල රත්තරනින් තනාගෙනේ
කුඹද පරුමාණ රිදියෙන් තනාගෙනේ
ඇහැළ මහට එඤ්ඤයි හිස තබාගෙනේ

කතරගම දෙවිඳු කන්දස් ස්වාමිනේ
අතරමංවෙලා අප විදින දුක අනේ
ඔරුව කොල්ලෑව රිදියෙන් තනාගෙනේ
ඇහැළ මහට එඤ්ඤයි හිස තබාගෙනේ

කතරගම දෙවිඳු කන්දස් ස්වාමිනේ
අතරමංවෙලා අප විදින දුක අනේ
නිතර සිහි කරමි නුඹගේ ගුණ වරුනේ
අපට පිහිට වනු කන්දස් ස්වාමිනේ

පෙර කරපු අකුසලයට මුදු යන්න හිතුනා
සීත සුළං එනකොට අනෙ අම්මා මතක් වෙනවා
හුළං සමඟ වරුසාවද ගොරව ගොරව එන්නා
එතන හිටන් අපිට අනේ දෙවියො මතක් වෙන්නා

රෑ ඉදලා එළි වෙනකං අපි තෙමී තෙමී ඉන්නේ
එළිවෙනකං ඉඳලත් අනෙ ගොඩ නොපෙනී ඉන්නේ
හැන්දැවේ අනේ බඩගින්නත් වැඩි වේගෙන එන්නේ
සතර වරම් දෙවි නාමෙන් ගොඩ පෙනී පෙනී එන්නේ

සතර වරම් දෙවි නාමෙන් ඇද්දා රුවල ගොඩට
සතර වරම් දෙවි නාමෙන් ආවයි අපි ගොඩට
සතර වරම් දෙවි නාමෙන් කතරගම යන්ට
මූදෙදි අපි භාරවුනා කතරගමට යන්ට

ඇත රටයි අපි ඇවිදින් සිටින්නේ

සීත සුළං කිසි කිසි ගා වදින්නේ
දෝත මුදුන් දී මුනිදුට වදින්නේ
නාථ දෙවිඳු රැකදෙන් මේ අප සැමදිනේ

කන්ද කුමරු අම්මා වල්ලි සාමිනේ
නින්ද නැතුව කඳකට කකුල දීගනේ
බැන්ද පඬුරු මාලිඟ හඳු හත මුදුනේ
යන්න අපට අවසර දෙනු සුවාමිනේ

කතරගම දෙවිඳු කන්දස් සුවාමීනේ
අතරමගයි අපි වැඳ වැද දුවන්නේ
සතර සයුර ඔබ දිවැසින් බලන්නේ
කතරගම දෙවිඳු බලෙන් මෙ ගමන යන්නේ

කතරගම දෙවිඳු කන්දස් ස්වාමිනේ
ඔරුව රුවල රත්තරනින් සදාගෙනේ
හැන් කුඹ පරුමාණ රිදියෙන් සදවාගෙනේ
ඇහැළ මහට එම් හිස තබාගෙනේ

ඔකඳ තිස් ගව්ව පානම දුවන්නා
ඇනියෙන් ගත් පකුල අවරිටින් මිදෙන්නා
අම්මා පෙව්ව රංකිරි කටට එන්නා
පණ තිබුණොත් එන පෙරහැර වදින්නා

බැඳලා පඬුරු අප සැම දෙන එකතු වෙලා
ඉඳලා කිහිප දවසක් අතර මග බලා
ඇඳලා රුවල දියඹට ඔරුව නික්මී ලා
හැරලා ගියෙමු ගොඩවායත් පසු කරලා

එළිවෙලා කුකුලො හඬලන වෙලාවේ
රෑ වෙලා මොනරු නද දෙන වෙලාවේ

බඩගිනි වෙලා බිළිඳු හඬනා වෙලාවේ
පමාවෙලා වැහැපන් වැහි වලාවේ[41]

ඔකඳ පොත්තනද පානම දුවන්නේ
ඇනියට ගත් පකුල අවරට විදින්නේ
දනවා පපුව අම්මා මට සිහිවෙන්නේ
වැඩිය කතා නොකරන් පපුව දන්නේ

මූදේ අනේ අද මා තනී වී ඉන්නේ
දැනගෙන පාර කොහොමද වෙරළට යන්නේ
දනවා මගේ හද දැඩි සෝ දුක දුක් ගින්නේ
මොන කරුමයද මා හට මේ පල දුන්නේ

පුර සොඳිනා මඩකලපුව සමීපය
පුරුදු වුනා කරදිය වතුර සාපය
අපි විදිනා දුක දනිතොත් දෙමාපිය
වතුර නොනා ඇස් දෙක දන්නෙත් බැරිය[42]

ග්‍රාම නාම

පලුටුපාන මං පොල්ලේ අසීරුව
පට්ටනගල්ල කෙළ කෙළ ඉන්න සීරුව
අලුත් ඔරුව නිති ගම්මැද්ද පාරුව
යාලට යන්න වේලා ඇත්ද යාලුව[43]

කිරල වැල්ල වාව්ව රිටිගල සයුරු
පිටට පවන් හැකි ලෙල දෙන නුන්නලු
හොඳට ඔරු පාරු ගොඩ යන ගන්දරලු
අදට නවාතැන් නොදෙන නාඔටුන්නලු[44]

කතළුව අහංගම සොඳ ගොයියපාන

---

[41] ගුණදාස හෙන්දාවිතාරණ - දෙවිනුවර

[42] පී.ඇම්.නන්දසේන - දෙවිනුවර

[43] පී.ඇම්.නන්දසේන - දෙවිනුවර

[44] එදිරිවීර ආරච්චි පටබැඳිගේ චාර්ලිස් අප්පුහාමී - ගන්දර

මිදිගම කුඹල්ගම මානැවිය පොකුණ
වැලිගම පැලෑන ද පොල් අතු මෝදරින
මීරියකන්ද කත නැවතී වාඩි ගෙන[45]

හාස - උපහාස සහ උපහාස

දෙහි බබියෝ උඹ මොනවද කරන්නේ
මොන මාළුවද උඹේ ගෑනිට අසුවන්නේ
උඹ තාමත් නින්දෙන් දැයි පසු වන්නේ
උඹේ පවුල කා සමගද නිදියන්නේ

වල් කෙළ කිනවා නුඹ විලි නැතුව දැනා
දැල් පොල එලනවා බලමින් දියඹ හනා
හතරම යනවා බඩතුරු හණ ලගිනා
දැල්පෙලෙ නගිනවා මඩ වැලි වරායනා

මතු පවතින්නේ අපෙ ඔරුවේ මැද සැලුනේ
මතු පිනකිනේ තොට ඔය ඔරුව සෑදුනේ
ජඩකම නොවෙද තෝ මට දොඩන කාරනේ
පර දෙමළුනේ නොකරන් කවටකම් අනේ

දෙවුන්දරට ගියාය මම බලන්න ගීගන කොල්ලා
සලන් සලන සලඹ පොදිය තිබුනේ උඩ එල්ලා
පරංගි ලෙඩ වෙලා සිටියේ ගෙදර සිටිය ගොල්ලා
අනුන්ට සෙත සලසන්නේ කොහොමද ජඩ බල්ලා[46]

සංක්‍රමණික ඩීවර අත්දැකීම්

දේසේ සොලී රට යන්නට දොඩා ගෙනේ
බෝසේ බඩු මුට්ටු සපයා ගෙන සොදිනේ
වරුසේ එක් දහස් අටසිය විසි එකිනේ

[45] ගුනදාස හෙන්දාවිතාරණ - දෙවිනුවර

[46] ජී.එස්.මානගේ - දෙවිනුවර

මාසේ නිකිනි දහවෙනිදා පිටත් වුනේ

සංතොස ලෙස පිටත් වී හික්කඩු ගමනා
පිං දී දෙවියන්ට යැද යැද යන ගමනා
මේ යන නරයින්ට දෙවි පිහිටා වෙමිනා
හැන්දා විය රළ ගල කුපිත දියඹෙනා

එළිවෙන කොට දැකපි තොටුපොල මිරිස්සේ
වලි කිය කියා අදිනා දැල් සිත තොස්සේ
ගමන් යන්න සුළඟක් නැති එම දවසේ
වැලිගම වැල්ලේ කැන්ටිමෙ රා කදිම යසේ

සරි නිල්වැලි තුඩුව මා වැල්ල පසු විය
හරි තන්ගලු කොටුව ගඩොලනෙ පසු විය
සදු දින සවස කළ මැටි වෙරළට ළඟා විය

ඔන්න කිරින්දේ පාන ම දුරට පෙනේ
මන්ද සෙව්ව වියලට යන්න ආ තැනේ
දෙන්නා අවර සුක්කානම අල්ල ගෙනේ
යන්නේ පටිට තන් ගල්ලද බලා ගෙනේ

ගමන් ඇවිත් අපි රස්සා වෙන කලට
කලින් ගම්මාන දැකලා හිත සතුට
තදින් මාරියා ඇත සාගරය වට
පිලින්නාව මේකද මිතුර ගම රට

සරිකරා වැන්න අකුසල් ගෙවි දද
බැරිදරා ගන්න කුසගිනි දාය මෙදා
කිරි එරා ගන්න සවිබල නැතිය මෙදා
තිරිකුණාමලේ දුටුවේ සදු දින දා

අපිත් දුවමු මහ රුවලට උඩ ඇදලා

ගන්දර නොපෙනී යන කල පපුව උණුවෙලා
මලිදු ගලත් එනවලු අප කිට්ටු වෙලා
දෙබෑ ගලට කිට්ටුද සකි පස්ස බලා

රිලව් සේම මිරිකුඩ පිට නැඟීලා
මාරියන් බලති ඊයම් දිය දමලා
කොයියම් රටක දෝ වීසෝ බලාලා
දෙයියන් වදිමු අප ගොඩකර නැඟීලා[47]

වල් කෙල ගැන කී කවි

දිග් ගල් උසානේ
හිදලුව මහ තබානේ
හොරෙන් කොලු බානේ
ගොසින් යාපන් වාලුවිදානේ[48]

විවිධ පද බැඳුම්

කතරගමට ගියදා ඔතන වාඩියේ
නිතර දෙමළු සක්මන් කරන විදියේ
අතරින් පතර මුතු අමුණන සවාරියේ
මතක නැතිව අත වැදුනා දෙමළ ලියේ

කලු අප්පු පුතනුවනේ අද වැල්ලේ
එනව පෙනේ ඔරු එක දෙක ගොඩ එල්ලේ
නුඹ නොපෙනී මගෙ හදවත ගිනි දැල්ලේ
උඹ නැති නිසා පාළුයි කිරලා වැල්ලේ

පේරාදෙනියෙ ලොකු තැන්වල මහත්තරු

[47] එදිරිවීර ආරච්චි පටබැඳිගේ චාර්ලිස් අප්පුහාමි (වාරකන් වාරෝ අයියා) ගන්දර
[48] පී.ඇම්.නන්දසේන - දෙවිනුවර

පාලම සදන්නට ගත්තේ උණ පතුරු
ඒවා මදිව ගන්නේ තව යකඩ පොලු
පාලම තිබේ මේ කප පවතිනා තුරු[49]

කවි අප්පුගෙ පුතනුවනේ අද වැල්ලේ
එනව පෙනේ ඔරු එක දෙක ගෙඩි එල්ලේ
නුඹ නොපෙනී මගේ හදවත ගිනි දැල්ලේ
අඳුරු උනේ අදයි කීරලා වැල්ලේ[50]

තේරවිලි

රස්සද ගලේ ගල පල්ලේ උපන්නේ
ඔළුව නැති කඳමයි සාප දුන්නේ
ඇස් දෙක උඩ තියා බිම ගොදුරු කන්නේ
මෙතැන් පදේ තෝරලා කියන්නේ[51]
(කකුළුවා)

කරුවල දහස් පන්සියයකි අඹ රුකකි
ඒ අඹ රුකේ ඵල ගත්තේ අඹ දෙකකි
ඒ අඹ දෙකේ පණුවන්ගෙන් සූ සැටකි
තෝරන කෙනෙකි අඹ සතරකි නැටි අටකි

(කරුවල දහස් පන්සිය නම් කප නොවෙද
අඹ දෙක නම් ඉරහඳ දෙදනො නොවෙද
සූ සැට නම් අහසේ තරු නොවෙද
නැටි අට නම් දඹදිව අට කොණ නොවෙද)

සාවෙක් මම දුටිමි අතු අග පැන යනවා
ගෝණෙක් මම දුටුමි අතු අග දළු කනවා
ඌරෙක් මම දුටුමි හාරන් අල කනවා
සීනෙන් මම දුටුමි පිරිමින් කිලි වෙනවා

---

[49] ගුනදාස හෙන්දාවිතාරණ - දෙවිනුවර
[50] ජී.එස්.මානගේ - දෙවිනුවර
[51] ඇම්.ඇම්.සිරිසේන - දෙවිනුවර

(සාව නොවෙයි සංසාරේ ගොඩ ලනවා
ගෝණ නොවෙයි කෝණාගම බුදු වෙනවා
ඌර නොවෙයි වසවතු යුධයට එනවා
සීනෙ නෙවෙයි සිරිබෝ ගස දළු ලනවා)

දෙවුන්දරින් කල්ලිදූවට[52]

පළමුව බුදුන් වැද අවසර ලබාගෙන
දෙවනුව දහම් සඟ යන තිවිධ සරණින
තෙවනුව දෙවියන්ට පින්දී වර රැගෙන
බලමුව ගමන් ගැන පසු දින උදැසන

මසින් අප්‍රේල් විසිනව වෙනිද උදේ
ගොසින් ඔරු ළඟට කටයුතු කර නිබඳේ
ගොසින් කතරගම දෙවිඳුට පඬුරු බැඳේ
යන්න පිටත්වුණේ දුක්දී සිතට හදේ

ගොසින් ගොඩවාය තොටමුණ අල්ලන්නට
තදින් රළවේග විය එහි බැරි යන්ට
නමින් සොඳ ජාවෝ මස් මරණ තැනට
සුළං වේගයෙන් ගියෙ හම්බන් තොටට

එදා අපි සැවොම ඉද එතැන එක්වෙලා
ගියා යන්ට ගන්දර ඔරු අපි දමලා
අවා ගිනි වැදී මාමා ඇතුව බලා
කියා එව්වාය දැන් වේගය කියලා

වටපිට බල බලා ඉන්නා කල මෙදිනේ
දොලහට විතර ආවයි බස් රියෙන් සැණේ
හනිකට ඔරු වරායට බාගෙන ගොසිණේ

---

52 ඇම්.ඇම්. මැන්දිස් සිල්වා - මිදිගහවත්ත-කෝට්ටගොඩ

විගහට රුවල ඇද ගමනට පිටත් වුණේ

ගියා යන්න අපි ඔරු තුන තනි වෙමින
කියා ගන්න බැරිවුණි දෙවිදුට එදින
එදා වැහි සුළං වේගෙට අසුවෙමිණ
සොයා ගන්න බැරිවුණි අපිට තොටමුණ

බෙදලා පෙර ජාතියේ දම් නුදුන් නිසා
ගෙවලා විදින්නට වුනි අපට දුක් රැසා
කරලා ගොඩ ඉන්න අලි වලසු නිසා
පෙරළා අයියනෝ ඇන්කර දැමුවයි නොලසා

ඉඳලා සයුර මැද එළිවෙන තුරුව බලා
වැඩිලා කුසගින්න කවුරුත් සුසුම් ලලා
ඇදලා රුවල් ගියෙ ගන්දර ඔරු එකලා
බැඳලා දෙවියන්ට පඬුරුත් රුවල් කලා

රට රටවල අය ගොස් මස් මරන්නට
වට පිට වට කරන මාදැල් ඇද සොඳට
දුටු දුටු අයගේ සිත් පිනවන වරායට
අද සිට හෙට යමුව පොතුවිල පමාකොට

මාස් සුළඟ අසුවුණි එදිනම උදයේ
දාස් ගණන් හේරුත් ගැසුවයි තරයේ
ලාස් ගැසී ගන්දර ඔරු යන්ට ගියේ
කල්ලි දූව අල්ලන කොට අඳුරු වුණේ

කිරළ වැල්ලෙන් පින්නතුඩාවට[53]

ළඳුනේ එදා කිරළා වැල්ලෙන් පැමිණ
සොඳිනේ රුවල් ඇද ටික දුර එන සඳින
භයංකාර සිර මැදුරක් කොටු පොකුණ

[53] කේ.ඩී.ජේදිරිස් සිල්වා - බණ්ඩරවත්ත -කෝට්ටගොඩ

දකින්නට ලැබුණ තංගලු පුර ඉතින

තංගලු මුහුද පසුකර යන කළ මිතුර
චංචල වී මුහුද ටික ටික භයං කර
සංකර ජාති හා ජාවන් වසන අර
හම්බන්තොටට ආවේ සවසයි හතර

දිනය එදා විසිවෙනිදා රෑ කාලේ
පිරිස වී කවුරු කවුරුන් එක වැල්ලේ
වීදිය බලා එළිවෙන ජාමෙට නිමලේ
දිරිය වඩා ඔරු බා ගත්තයි එවෙලේ

සත් සමුදුරේ වැද පාවෙන ඔරු රෑනා
එළිවෙන තුරා දැක ගන්නට බැරිවූ තැනා
අයියෝ අපොයි දැන් සුළඟත් දරුණු වුණා
දෙයියෝ පිහිට ඉල්ලා වැන්දා බැතිනා

ඔන්න කිරින්දේ පානත් දැන් පෙනෙනා
දන්න තරම් සුළඟත් එහි දරුණු වුණා
යන්න පාර බැදගන්නට ගලුත් ගෙනා
ඔන්න රාවනා රජුගේ පර පෙණුනා

ඉතාමත් දරුණු ඇත්තේ ඒ මුහුදයි
කතාවක් කරන්නට නම් සිතට බයයි
ගොතා ගත් පණිඳු සේ සුලඟත් වේගයි
වගාවක් දැකපු පට්ටන ගල පෙනුනයි

ඔන්න කෝට්ටේ මුහුදත් පසු කෙරුවා
ටික ටික සුළං වේගෙන් එහි අඩු කෙරුවා
දැන්නම් වෙලාවක් අග්ගිස් වී එනවා
යන්තම් එදා පොත්තන වැල්ලට ආවා

කැලෑ සතුන්ගෙන් නිතරම භයංකර
පොත්තන කැලේ නැවතී සිටිනවර
හරියට වෙලාවක් රෑ ජාමෙට විතර
දොළහට විතර දැක්කා සිරිකෝලු දුර

ඔන්න බොලේ දැන් දැන් අර පෙනෙන්නේ
පුලියන් දූවේ පහනයි කවුරුත් දන්නේ
ඊට දුරින් තුඩු මහතුන් පෙනෙන්නේ
කවුරුත් සැවොම සිරි සිරි ගා සිනහසුනේ

පින්නතුඩා තුඩු මඟ නම් දැන් ළඟමයි
පන්න කරන ඔරු එක දෙක ගොඩ යනවයි
දන්න කියන තොටුපල නම් සිතට සැපයි
ඔන්න ඉතින් දෙවියන් වැඳ ගොඩ බැස්සයි

කලපු සිව්පද

බොරුවක් නොවෙයි මකියන්නේ සදාලා
ඔරුවක් තිබෙයි මහ මුහුදේ කිදිලා
පලුපත් දෙකක් ගෙන දැලෙන් සදාලා
පදිනට බැරිය සයුරේ දිය සිදීලා[54]

බොරුවක් නොවෙයි මකියන්නේ මගේ තුඩින්
නවසියයක් කද ඇද බැඳ සතර වටින්
අවල හබල සතරක් ගෙන දැල වරින්
තනිව ඉඳම සයුරේ පදිනවා දුටින්[55]

දැකලා අපි සැවොම මීගමු කලපු වට
ඇදලා ගොසින් යන්තම් වැටුණිය ගොඩට
එකලා කඩේ වෙළඳම් ගන්න ගිය විට
සිටලා ගැහැණු දෙමළෙන් දෙඩුවයි අපට

[54] ඩබ්.බී. ප්‍රේමදාස - ඩබ්.බී.ගොඩනැගිල්ල -කෝට්ටගොඩ
[55] ඇම.ඇම්.අප්පුසිඤ්ඤෝ - නිල්වැල්ල - දික්වැල්ල

හදපානේ නරකද මීගමු යන්ට
ඒ පානේ නරකද වෙළඳම් ගන්ට
බැරි රාළේ කරවල ගඳ උහුලන්ට
මතුකාලේ නොපතන් මීගමු යන්ට[56]

පහුරු කවි

ගමන් යන්ට නැකතින් පාරු බැඳගෙන
සමන් දෙවියන්ට සැම පඬුරු දී ගෙන
මෙවන් කළු ගගේ ගල් මුල් බලාගෙන
අපිත් යමුව සැම දෙවියන්ට වැදගෙන[57]

සීරුව ඔබට කණු නොම සිටුවා මහත
වාරුව ඇතුව දිය පිට තැනූ ගෙයක් ඇත
මාරුව තැනින් තැන බඳු ගෙන ගමන් යන
පාරුව වැනි ගෙයක් මේ මුළු ලොවේ නැත[58]

ඔයේ වතුර යන්නේ පරඬැල් එක්කා
ගගේ වතුර යන්නේ කුඩ මසු එක්කා
මලේ සුවඳ යන්නේ බඹරුන් එක්කා
කියතොත් කියාපන් සීපද මා එක්කා[59]

නාරංගල කොත බැන්දා සනංගුයි
බදුලු නුවර දේවාලෙට ඉනංගුයි
පැදගෙන යන ඔරුව ගග මැද නලංගුයි
බින්තැන්නට සොරබොර වැව ඉනංගුයි[60]

පූරුවේ කරපු අකුසල් ගෙවෙන්නට

---

[56] කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ

[57] කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ

[58] රත්නවීර පටබැඳිලාගේ හෙන්ඩ්‍රික්

[59] කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ

[60] රත්නවීර පටබැඳිලාගේ හෙන්ඩ්‍රික්

පාරුවේ ඇවිත් දුක් විඳිනව දැනට
මාරුවේ අවල අදිමින් විටින් විට
සීරුවේ බැසපි ගොස් තුන් මෝදරට[61]

හඳපානේ බඳපානේ ගමන් යමු
රෑ වුන තැනක අම්බලමක වාඩි ගමු
අට පනමක පැණි අරගෙන බෙදා කමු
යහලු අපට ඔරු පැදපං බුලත් දෙමු[62]

සස්සඳ සසද දිය මතුපිට තියේ මල
සසඳ සසඳ දිය පල්ලේ තියේ අල
වැස්සට පිණි බබා මෝරන කැකුළු මල
මස්ටකයින්ට මුතු කුඩයකි නෙළුම් මල[63]

වැල්ලේ සන්දේශය හෙවත් අන්ද්‍රිස් පුර වරුණේ

දහනව වැනි (19) සියවසේ මැද භාගයේදී පමණ ගන්දර කෝට්ටගොඩ විසූ **ජී.එච්. දොන් අන්දිරිස්** නම් ජන කවියා සටහන් කොට තබන ලද **වැල්ලේ සන්දේශය හෙවත් අන්දිස් පුර වරුණේ** යන මුඛ පරම්පරාගත ජන කවි පෙළ ධීවර ජන කවියේ නිමි වළලු පුළුල් පරාසයක් කරා විහිදුවයි. පරම්පරික ධීවර වෘත්තීය ඇසුරෙන් බිහිවූවක් නොවේ **වැල්ලේ සන්දේශය.** වෙනත් අයුරකින් පවසතොත් මෙම ජන කවි පෙළ ධීවර වෘත්තිය ඇසුරෙන් බිහිවූවක් නොවේ.

එය සමුද්‍ර මාර්ගය ඔස්සේ භාණ්ඩ ප්‍රවාහණය කළ මුහුදු යාත්‍රික ජීවිතය ඇසුරෙන් බිහිවූවකි.එම යාන්ත්‍රික ජීවනය වූ කලී ධීවර සමාජය තුළ වූ අනු සමාජීය අංගයක් වේ. එම නිසා ඔවුන් ඇසුරෙන් බිහිවූ මෙම කවි ධීවර වෘත්තික සමාජය කළ බිහිවූ ඔවුන්ගේ අනන්‍යතාවයන් සටහන් කළ කවිසේ දැක්විය හැකිය.

අදාළ යුගයේදී රට තුළ භාණ්ඩ ප්‍රවාහනය සඳහා සමුද්‍ර මාර්ගය භාවිතා වූ අතර ඒ සඳහා විශාල යාත්‍රා විශේෂයක් යොදා ගත් බව අදාල යුගය පිළිබඳව වන ලිඛිත සාධක මගින් සනාථ වේ. ඒ අනුව දකුණු ප්‍රදේශයේ සිට **කොළඹටත්, කොළඹ** සිට දකුණු ප්‍රදේශයටත් භාණ්ඩ හුවමාරු වීමේ වාහකයෙකු සේ භාවිතා වූ මෙම විශාල ප්‍රමාණයේ රුවල් ඔරු විශේෂය මගින් ඉංග්‍රීසී පාලකයන්ගේ වාණිජ අවශ්‍යතාවයන් ඉටු කරවා ගත් බව පෙනේ.

වැල්ලේ සන්දේශය හෙවත් **අන්ද්‍රිස්පුර වරුණේ** නම් ලත් ජන කවි පංතිය මෙම ප්‍රවාහන අත්දැකීම ඇසුරෙන් බිහි වූවක් බව පෙනේ. ගන්දර සිට කොළඹ දක්වා යාත්‍රා කළ ගමනකදී කවියා ලත් අත්දැකීම් ඔහුගේ කවි ප්‍රතිභාවේ තරම ප්‍රකාශ වන අයුරෙන් පද බැඳීමට උත්සාහ ගෙන ඇති බව පෙනේ.

ධීවර ජනයාට දැඩිසේ ආදරය කළ **මාතර පැරණි මහ වීදියේ** බෙහෙත් ශාලාවක් පවත්වාගෙන ගිය සුප්‍රකට දොස්තර මහතෙකු වූ නැසීගිය **ජී. බාලසූරිය** නම් වූ කලාකාමී

---

61 ජී.එච්.ලීලසේන - බෙලිගහවත්ත - කෝට්ටගොඩ

62 කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ

63 කේ.බී.තේගරිස් සිල්වා - බණ්ඩරවත්ත - කෝට්ටගොඩ

වෛද්‍යවරයාගේ සටහන් අතර තිබී මෙම අත් පිටපතකින් මෙය ලබා ගෙන ඇත. එතුමා ඉදිරියේ මෙම කවිපෙළ ගායනා කර ඇත්තේ **කෝට්ටගොඩ සුදුවැල්ලේ හින්නගල් මුල්ලවත්තේ** පදිංචිව සිටි **ඇම්. ඇම්. බබාසිංඤ්ඤෝ** නැමැති ධීවර වෘත්තිකයා විසිනි.

කවි 83 කින් සමන්විත **වැල්ලේ සන්දේශයේ** 1 වැනි කවියේ සිට 13 වැනි කවිය දක්වා මාතර වෙරළ කලාපයේ ගම් ගැන වර්ණනා කර ඇත.

කවියා සඳහන් කරන අන්දමට (2 වැනි කවිය) ඔවුන් **ගන්දරින්** පිටත් වී ඇත්තේ උදුවප් මාසේ ගුරු දිනක මුව සිරස නැකතිනි. ගන්දරින් පිටත් වී අතරමග කිහිප පලක නතර වී දවස් විසි නවයකට පසු මෙම පිරිස කොළඹට ළඟා වී ඇත. කාලීන තොරතුරු රැගත් මෙම කවි පෙළේ කවි කිහිපයකි මේ.

1) යුධ කාලේ රාම විස්නුගේ අනුහසි නේ
වැද ලොලේ දොහොත් මුදුනේ තබාගෙ නේ
තෙද බලේ සියලු දෙවියන්ගේ වරම් නේ
පද කලේ මෙපද **අන්ද්‍රිස් පුර වරු** **නේ**

2) වෙන්කර කියා සදෙනට මෙබස් දී ගනේ
පෙම්බරියෙන් නැකත තෝරා බලා ගනේ
උදුවප් මස නැකැත මුවසිරි සෙට යෙදු නේ
ගන්දර පුරෙනි ගුරුදින අපි පිටත් වුනේ

3) මීරා පකුල තෝරා පැදගෙන ඔරුව
වාරා නැතුව යන ගමනකි බොරු නැතුව
මෝරා සුලන් එන්නා දැනට එකතුව
තෝරා දුව පන්න ඇත **ගන්දර** **තුඩුව**

4) නෑර එන සුළඟ එකතුව ඇත කිව්ව
සාර වන සුළං උතුරට එක දෙව්ව
බාර වෙන පඬුරු එකතුව ඇත කිව්ව
තෝරා දුව පන්න ඇත **ඇහිරා** **තුඩුව**

5) පෙනී දුවන කළ තුඩු මග එක එල්ලේ
වැනී සුළඟ ඇතරුව දැවටිල්ලේ
ගනිමින් මුනිඳු ගැන සැම දෙන අපි ගොල්ලේ
පෙනී මුදලුත් ඇත **කිරලා** **වැල්ලේ**

6) පරසිඳු යසස් මැති සඳ දෙවියන් නුවරේ
මෙගම දනෝ පුදදෙති හැම නිරන්තරේ
රූ පෙනෙනා තුඩුව දියඹට ඇත මිතුරේ
රැලෙන නුදුටුවත් පතුලත් ඇත මිතුරේ

7) අපි ඉල්ලා සිටිමු සොඳ සුළඟ දිවි මට
මෙර සොල්ලා සිටිත්නම් තෙද හැම තැනට
දැන ගල්ලා තෙද අනුහස් ඇත අපට
වැද ගල්ලා සැම දෙන විෂ්ණු දෙවිඳුට

8) පුදා මල් පහන් බණ අසා හැම වර
මුදා සියලු දෙය දුරින් දුරු කර
එදා විෂ්ණූ දෙවිඳුට අපි කමා කර
උදෑ සන ගියේ **දෙවිනුවර** පසු කර

9) මුලා නැතුව බලා ඉර පායන තානේ
වලා සදිසි පුන්සඳ මෙන් එම ගානේ
වලා සත් දෙවිඳු එළිකර හඳ පානේ
බලා දුවපන්න අන්දම තඹානේ[64]

10) දැඩි මාරේ එන සැර සුළං විගසි නේ
මඩින සැරේ සැරවිය මුහුදු තැන තැනේ
වැඩිව සැරේ තිබුනත් සුළඟ අද දිනේ
මුඩු මොහොරේ ඇත දුව පන්න දිය ඕනේ

11) පෙර ඉල්ලා බුදු බව පැතු මුනි වර
ඉඳගල්ලා ඔරුව පිට මුනිඳු සිහි කර
මෙරසොල්ලා හරින පින් බලය වැඩි කර
වැඳ ගල්ලා ඔන්න **ගොඩකන්දේ** **වෙහෙර**

64 තඹාන - මාතර උග්ගල්බැවුල (බුවුන්ස් හීල්) කඳු මුදුන. මෙය ධීවරයන්ගේ වල් කෙළකි.

12) පිනට ජාති ලැබුනත් පින්කර සත්ත
දැනට නොයෙක් යහපත් කම එක සත්ත
හැඩට මහතුන්ගේ නොගියොත් එක සත්ත
දැනට පෙනෙනවා මිතුරනි පොල් වත්ත

13) නරන් සැමට පිහිට උනු අපෙ මුනිඳු බලේ
සුළං සැර උනොත් ගමනට පිහිට බලේ
සමන් දෙවිඳු බලයෙන් යන ගමන ජලේ
බලන් මිතුර හැඩ **ගොයියා පාන** **ගලේ**

ගොයියාපාන යනු මාතරත් ගාල්ලත් වෙන් කෙරෙන පලාත් සීමාවයි. මහ සයුරට සීමා මායිම් නොමැති වුවද **වැල්ලේ සන්දේශයේ** 14 වැනි කවියේ සිට ගාල්ල ප්‍රදේශයට අයත් ගම්මානත් ඉන්පසු පිළිවෙලින් කොළඹ දක්වා ප්‍රධාන ගම්මාන වර්ණනා කෙරෙයි.

ගොයියාපානෙන් පසු පිළිවෙලින් කටුකුරුන්ද, මිහිරිපැන්න, හබරාදුව, දළ වැල්ල හා උණවටුනට පසු ගාල්ලට මෙම පිරිස පිවිසේ. ගාලු පුරවරය කවි හයකින් වර්ණනා කරන අතර පසු දින උදේ කලුවැල්ල, ගින්තොට, රජ්ජම, කින්තන්ගොඩ, සීනිගම උපත, තෙල්වත්ත, අකුරළ තුඩුව, මාදම්පේ, අම්බලන්ගොඩ, රන්දොඹේ, බලපිටි මෝදර, හරිස් පොල, කොස්ගොඩ, ඉඳුරුව, බෙන්තොට, කළුවා මෝදර, මාගල් කන්ද, මග්ගම (මග්ගොන), පයියාගල, කුලමුල්ල, කලුතොට (කළුතර), වස්කඩුව, පොතුපිටිය, පානදුර, මොරටුව, ගල්කිස්ස, කොල්ලුපිටිය, දෙහිවල පසුකර කොළඹට ළඟා වී ඇත.

ධීවර කර්මාන්තය පිළිබඳව අත්දැකීමක් ඇතුලත් නුවූවද දින 29 ක් තිස්සේ දීර්ඝ මුහුදු ගමනක, කටුක මෙන්ම රසබර අත්දැකීම් ඇසුරෙන් රචිත **වැල්ලේ සන්දේශයේ** ගැමි ධීවර ජන කවියකුගේ කදිම පබැඳුමකි. කාලීන තොරතුරු සහිත නගර හා ග්‍රාම පිළිබඳවද අව්‍යාජ තොරතුරු රැගත් මෙම කවිපෙළ අගය කළ හැක්කේ අව්‍යාජ ගැමි ජන කවියෙකුගේ පබැඳුමක් බැවිනි.